# Impact of Effective Management Information System on Organizational Profitability through Enhanced Performance of Employees in Large Scale Companies in Factory Industry of Sri Lanka

A.I. Embuldeniya[1]

## Abstract

In today's business context, organizations tend to spend more on managing their employees in order to gain competitive advantage in the industry. Most of the times employers been unconscious on managing their data effectively and efficiently by a Management Information System (MIS) which can be helped to their employees to be extraordinary performers. Therefore this study has sketched to identify strategic paths to follow by the employers to ensure their profitability through enhancing their employees' performances by utilizing the Management Information System. The general objective of this study is to identify a systematic way to the management to enhance their profitability through employee performance by allowing them to convenient with Management Information System at regular works. The dependent variable is organizational profitability through employee performances measured with Return on Investment, Gross profit and net profit of the company while effective Management Information System being an independent variable with reference to sufficient storage, permanency of exist, multi users, realistic, avoid duplication, and security. The sample will be selected as for the case study method while identifying each industry include to factory industry as a case. This study will use questionnaire and structured interviews as the instrument of primary data collection and will use statistical graphical representations, Descriptive statistics, Correlations, and Chi-square tests to analyze data. This study will result in identifying the use of

[1] B.A. (Special) Social Statistics, University of Kelaniya.
eapeksha@ymail.com

Management Information System from optimum level to bottom level in large scale business endeavor.

**Key Words :** *Management Information System, Organizational Profitability, Employee Performance, Large Scale Companies in Factory Industry*

# නාගරික ජනතාවගේ අධ්‍යාපන මට්ටම සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දක්වන ආකල්ප පිළිබඳ අධ්‍යයනය

ටී.එන්. චානක[1]

**සංක්ෂේපය**

පරිසර විනාශය වර්තමානයේ කතාබහට ලක් කෙරෙන ප්‍රධාන මාතෘකාවකි. පාරිසරික විනාශවීම් කෙරෙහි බලපාන ප්‍රධාන සාධක රැසකි. ඒ අතුරින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හේතුවෙන් සිදුවන පාරිසරික බලපෑම ප්‍රධාන වේ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය යනුවෙන් හඳුන්වනුයේ ඉවතලන පරිගණක, ජංගම දුරකථන, රූපවාහිණී, ගුවන් විදුලි යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, විදුලි බල්බ, බැටරි ආදී ගෘහ විදුලි උපකරණ මෙන්ම කාර්යාල හා ව්‍යාපාරයන්හි භාවිතයෙන් ඉවත් කරන විදුලි උපකරණ ද වේ. මේ සම්බන්ධව මේ රට තුළ පර්යේෂණයක් 2009 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදු කර ඇතත්, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි ජනතාවගේ දැනුවත්භාවය පිළිබඳ මෙතෙක් කිසිදු පර්යේෂණයක් සිදු කර නොමැත. එසේ හෙයින් ජනතාවගේ අධ්‍යාපන මට්ටම, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි බලපාන්නේ ද යන්න අරමුණු කරගෙන මෙම පර්යේෂණය සිදු කර ඇත. පර්යේෂණය සඳහා නියැදිය වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වේවැල්දූව ග්‍රාම නිලධාරි වසම තෝරා ගත් අතර, වේවැල්දූව ප්‍රදේශය අර්ධ නාගරික ප්‍රදේශයක් වීම එසේ තෝරා ගැනීමට ප්‍රමුඛ හේතුවක් වේ. පර්යේෂණය සිදු කිරීමේදී ප්‍රාථමික දත්ත වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කළ අතර, ද්විතීයික දත්ත ලෙස ආශ්‍රිත පොතපත, අන්තර්ජාලය භාවිතා කරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලබා ගත් තොරතුරු බොහොමයක් ගුණාත්මක දත්ත වන බැවින් විචල්‍යයන් අතර සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීමට ප්‍රධාන වශයෙන් කයි වර්ග පරීක්ෂාව ද, සම්බන්ධතාවන්හී ප්‍රබලතාව මැනීම සඳහා ක්‍රැමර්ගේ වී අගය පරීක්ෂාවද භාවිතා කෙරිණි. එමෙන්ම ද්වීමය විචල්‍යයන් පාරායත්ත විචල්‍යය ලෙස යොදාගනිමින් ද්වීමය ප්‍රතිපායන ආකෘතියද යොදා ගැනිණි. දත්ත විශ්ලේෂණයේදී පැහැදිලි වූ කරුණ නම් ඉහළ අධ්‍යාපනයක් ලබා ඇති පිරිසගේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පිළිබඳව යම් මට්ටමක හෝ දැනුවත් බවක් ඇති බවත්, අඩු අධ්‍යාපන මට්ටමක් සහිත පිරිසගේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පිළිබඳ දැනුවත් භාවය පහළ මට්ටමක පවතින බවත්ය. ඒ අනුව පැහැදිලි වනුයේ පාසල් විෂය මාලාවලට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පාඩම්මාලා එකතු කළ යුතු බවයි. එසේම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පිළිබඳ දැනුමක් ලබා තිබූ පිරිසක් සිටියද ඔවුන් ඒවා නිසි ලෙස කළමනාකරණය කෙරෙහි දැනුමක් ලබා නොමැති බවයි. අවසන් නිගමනය වූයේ පාසල් විෂය මාලාවලට

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
chanilankln@gmail.com

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව පාඩම්මාලා ඇතුළත් විය යුතු බව සහ ඒවා ප්‍රායෝගික විය යුතු බවයි.

**මුඛ්‍ය පද :** *පරිසර විනාශය, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය, අධ්‍යාපනය*

# Factors Influencing Tea Consumption Behavior in Sri Lanka
## (With special reference to Ratmalana Divisional Secretariat in Colombo district)

M.V.C. Abeygoonaratne[1]

**Abstract**

Tea is one of the most popular beverages consumed worldwide. Sri Lanka continues to retain in the position of being the third largest exporter and the fourth largest producer of tea. The present study was conducted to identify the factors affecting tea consumption among local customers in urban areas. The consumption behavior of tea was studied in Ratmalana Secretariat Division in Colombo district using primary data. Data were collected using a structured questionnaire from 150 randomly selected customers at different supermarkets and cafes. Multiple linear regression analysis was employed to study the factors influencing the quantity of tea demanded (quantity of tea purchased) per month. Independent variables used in the analysis are age, family size, family income, number of years of education, number of cups consumed per day, price, monthly tea expenditure, advertisements and health awareness. The results revealed that 88.7% of the respondents were tea consumers. The consumers purchased on an average about 756.39g of tea powder every month. Hence, they're willing to pay Rs. 99.67 on average for 100g of tea. Age, family size, monthly tea expenditure and health awareness were the most significant factors. Influence of advertisements was the least influential factor. Approximately 46% of tea drinkers consumed Black tea while 38% and 13% consumed Ginger tea and Green tea respectively. Only about 3% consumed other flavored tea. The Watawala and Lipton trade brands are most preferred brands among the consumers.The findings of empirical research suggested that people are more health conscious and are less likely to be influenced by advertisements but rather be influenced by family members.

**Key Words :** *Tea Consumption Behavior, Tea Consumption*

[1]B.A. (Special) Social Statistics, University of Kelaniya
chamindri.abeygoonarathne@gmail.com

# සංවර්ධන නිලධාරී තනතුරට බඳවාගත් උපාධිධාරීන්ගේ සේවා තෘප්තිය සහ ගැටලු
## (රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇසුරින්)

එල්.එච්.සී. දිල්රුක්ෂි[1] ජී.එන්.ඩී. හංසිකා[2]
එස්.එම්.ඒ.අයි.පී. කුමාර[3] ජී.කේ.එච්. ශෂිකානි[4]
එම්.ආර්.එස්. මධුෂානි[5] එම්. කේ. නදීකා දමයන්ති[6]

**සංක්ෂේපය**

රාජ්‍ය අංශය ශක්තිමත් කොට කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණින් තරුණ උපාධිධාරීන් අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරීන් ලෙස බඳවා ගැනීමට පසුගිය රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලැබිණි. 2012-02-14 වන දිනැති 1745/11 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව අනුව බඳවාගනු ලැබූ මෙම නිලධාරීන්ගෙන් අපේක්ෂිත කාර්යභාර්ය වන්නේ සංවර්ධන යෝජනාවල වැඩකටයුතු විමර්ෂණය කිරීම, තොරතුරු හා දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, වාර්තා සම්පාදනය, සමීක්ෂණ කටයුතු ඇතුළත්ව රජයේ සංවර්ධන යෝජනා වල අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට දායක වීමයි. 2000 වර්ෂයේ සිට වසර ගණනාවක් පුරා මෙම සේවාවට නිලධාරීන් බඳවාගනු ලැබූ අතර පසුගිය වසර කිහිපය තුළ මෙම තනතුර සඳහා විශාල නිලධාරීන් පිරිසක් බඳවා ගනු ලැබිණි. මේ වන විට එම නිලධාරීන්ගේ කාර්යභාර්ය සම්බන්ධයෙන් විවිධ අංශවලින් චෝදනා එල්ල වෙමින් පවතී. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සංවර්ධන නිලධාරී තනතුර සඳහා බඳවාගත් නිලධාරීන් මුහුණ දෙන ගැටලු සහ ඔවුන්ගේ සේවා තෘප්තිය පිළිබඳව අධ්‍යයනය කිරීමයි. අධ්‍යයනයේ නියදිය ලෙස රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් 50 ක් අහඹු ලෙස තෝරා ගන්නා ලදී. නිලධාරීන්ගෙන් 80%ක් තමන්ට පැවරුණු නිශ්චිත රාජකාරියක් පවතින බව පැවසූ අතර මොවුන්ගෙන් ආයතනය තුළ පමණක් රාජකාරී කරන්නන් 16% ක් ද, ක්ෂේත්‍ර රාජකාරී කරන පිරිස 42% ක්ද, ආයතනය හා ක්ෂේත්‍රය තුළ සේවය කරන පිරිස 42% ක්ද වේ. නිලධාරීන්ගෙන් 60% ක් කාර්යාලයීය කටයුතුවලදී ගැටලුවලට මුහුණ දෙන බව අනාවරණය වූ අතර කාර්යයන් පැවරීමේ අසංවිධානාත්මක බව, නිසි උපදේශනය හා පුහුණුවීම් නොවීම, තාක්ෂණික

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[6] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

උපකරණ නොවීම, ආදිය ප්‍රමුඛ විය. ප්‍රතිචාරීන්ගෙන් 48% කට තනතුර සහ එහි කටයුතු සම්බන්ධයෙන් තෘප්තිමත් වූහ.

**මූඛ්‍ය පද ඃ** *සංවර්ධන නිලධාරී, උපාධිධාරීන්, සේවා තෘප්තිය, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*

# ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය හා රැකියා වෙළෙඳපොළ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

ඒ.ඒ.පී.එම්. මධුභාෂිණී[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදුකරන සාධක ලෙස ශ්‍රම බලකාය, රැකියා වෙළෙඳපොළ ආදී සංකල්ප නම් කළ හැක. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව, උක්ත ක්ෂේත්‍රයේ වර්තමාන හැසිරීම කවර ආකාරයෙන් සිදුවන්නේද? යන්න අධ්‍යයනය කිරීමයි. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ඉහළ ආර්ථික වෘද්ධියක් කරා ළඟා වීමට ශ්‍රී ලංකාව සෑම විටම උත්සහ කරයි. එහිදී පූර්ණ සේවා නියුක්තියක් ඇතිකරගැනීම ශ්‍රී ලංකාව සතු සාර්ව ආර්ථික අරමුණකි. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය හා රැකියා වෙළෙඳපොළ ආශ්‍රිතව පවතින්නාවූ සාධනීය තත්වයන් හඳුනාගැනීමත් ඇතිවී ඇති ගැටලු සඳහා යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කිරීමත් මෙම පර්යේෂණයේ අරමුණ යි. ද්විතියික තොරතුරු මූලාශ්‍ර උපයෝගී කොටගෙන ලබාගත් දත්ත සඳහා සංඛ්‍යානමය ශිල්ප ක්‍රම යොදා ගනිමින් විශ්ලේෂණය කර ඉහත පර්යේෂණයේ ගැටලුව සඳහා විසඳුම් ලබා ගැනීම පර්යේෂණ සැලැස්ම විය. එහිදී මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස 1977 වසරේ සිට 2104 වසර දක්වා කාලය තුල ශ්‍රම බලකාය හා රැකියා වෙළඳපළ ආශ්‍රිත ද්වීතයික දත්ත උපයෝගී කොටගෙන තිබේ. දත්ත විශ්ලේෂණය සඳහා වගු , ප්‍රස්තාර සටහන් මෙන්ම සංඛ්‍යානමය විශ්ලේෂණයන් යොදා ගන්නා ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය හා රැකියා වෙළෙඳපොළ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී වර්තමානයේ දී එක් එක් වෘත්තිමය අංශයන් හි ප්‍රසාරණයන් හෝ සංකෝචනයන් සිදුවන බව අනාවරණය විය. එමෙන්ම උගත් තරුණ ශ්‍රම හිඟය, බොහෝ ආයතන තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමේ දී මුහුණ දෙන ප්‍රධානම ගැටලුවක් බවට පත්වී තිබේ. ඒ සඳහා අධ්‍යාපන හා වෘත්තීය පුහුණු කිරීමේ පද්ධතියක් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. තවද ශ්‍රම බලකාය වෙත වැඩිපුර කාන්තාවන් ආකර්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇරඹීම ද කාලීන අවශ්‍යතාවයකි.

**මුඛ්‍ය පද :** *ශ්‍රම බලකාය, රැකියා වෙළෙඳපොළ, ආර්ථික සංවර්ධනය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
aappmm.piyumi@gmail.com

# රැකියා කරනු ලබන විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන සාර්ථකත්වය

ඒ.ඒ.එස්.ඩී. අධිකාරි[1]

**සංක්ෂේපය**

රජය විසින් අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන අතරින් විශ්වවිද්‍යාලය සඳහා වැය වියදම ක්‍රමයෙන් ඉහළ අගයක් ගනී. විද්‍යාර්ථීන්ගේ වියදම් ද ක්‍රමයෙන් ඉහළ නගී. ඒ අනුව විද්‍යාර්ථියා ද තම අධ්‍යයන අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන රැකියා සඳහා යොමුවනු දක්නට හැකිය. බොහෝ පර්යේෂණයන් මගින් විද්‍යාර්ථියාගේ අධ්‍යයන කටයුතු සඳහා රැකියාවක නිරත වීම ඍණ බලපෑම් ඉහළ මට්ටමක් ගන්නා බැව් දක්වයි. නමුත් සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය උදෙසා රැකියාවක් කිරීම ධනාත්මකව බලපාන්නේ කෙසේද යන්න සොයා බැලීම මෙහි අරමුණ වී ඇත. මෙම පර්යේෂණය සඳහා කැලණිය විශ්වවිද්‍යාලය තුළින් 150 දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරා ගත් අතර ඉන් 50% ක් පූර්ණ කාලීන හා අර්ධ කාලීන රැකියා කරනු ලබන විද්‍යාර්ථීන් වූ අතර ඉතිරි පිරිස රැකියා නොකරන විද්‍යාර්ථීන් ද විය. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම, දත්ත විශ්ලේෂණයන් සඳහා යොදා ගන්නා ලදි. මෙහිදී විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතුවල ධනාත්මක හෝ ඍණාත්මක බව මිනිය හැකි ප්‍රමාණාත්මක සාධකය GPA අගය වන බැවින් ප්‍රශ්නාවලියක් තුළින් ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී. අධ්‍යයන මගින් අනාවරණය වූයේ රැකියාවක් නොකරන සිසුන්ට වඩා සතියට පැය 15-20ත් අතර වැඩ කරන සිසුන් ඉහළ GPA අගයක් පෙන්නුම් කරනු ලබන බවයි. එසේ ම සතියට පැය 1-15ත් අතර පැය ගණනක් වැඩ කරන සිසුන් හා රැකියා නොකරන සිසුන්ට වඩා ඉහළ GPA අගයක් පෙන්නුම් කරයි. එසේම පූර්ණකාලීන රැකියා කරන්නන්ගේ උපාධිය නියමිත කාලය තුල සම්පූර්ණ කර ලබා ගැනීමේ ඉඩකඩ අඩු වනුයේ අර්ධ කාලීන රැකියා කරනු ලබන හෝ රැකියා නොකරන විද්‍යාර්ථීන්ට වඩා 10% ක ප්‍රතිශතයකිනි. අධ්‍යයනය මගින් සොයාගත් තවත් සාධකයක් වූයේ වැඩි පැය ගණනක් රැකියාව තුළ නිරත වීම විද්‍යාර්ථීන්ගේ සෞඛ්‍යය කෙරෙහි බලපාන බවයි. ඒ අනුව සිසුන් විසින් වැඩ කරනු ලබන පැය ගණන පිළිබඳව නොව සෞඛ්‍යය පිලිබඳව සැලකිලිමත් විය යුතු බවත් රැකියාව තුළින් ලබන පන්නරයත් සමඟ ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සමබරව ගෙන යාමට හේතුවන බවත් නිගමනය විය.

**මූඛ්‍ය පද :** *විද්‍යාර්ථියා, GPA අගය, අධ්‍යයන සාර්ථකත්වය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
samikadinashki@gmail.com

# The Role of Multinational Corporations in Developing Countries

**A.S. Adjumain[1]**

**Abstract**

Multinational corporations (MNCs) play a key role in shaping the global economy. Its powerful nature makes developing countries depend on its investments. Thereby, MNCs' ability to influence the economy, politics, and socio-cultural factors in developing countries, and its impact has largely been questioned. Although MNCs' role in developing countries has been heavily criticized, it is evident that developing countries are heavily dependent on such organizations. The objective of this study is to examine the role of MNCs in developing countries, and whether it creates a positive or negative impact. It will take into consideration creation of employment opportunities, introduction to modern technology, and paving way for foreign market as indicators to analyze the role played by MNCs in developing countries. This study adopts a qualitative, literature-assessing and case study method to study the role of MNCs in developing countries. This research consists of a literature review of MNCs, theories put forward in relation to MNCs, and the role and impact of MNCs in developing countries. It inspects in what roles MNCs contribute to the progress of developing countries by analyzing case studies, with special reference to the socio-economic role. It analyses whether the socio-economic role played by the MNC is positive or negative on a developing country. Finally, it reaches a conclusion and provides recommendations. The findings disclose that MNCs have created a positive impact on developing countries in terms of a socio-economic role. The case study countries, Myanmar, India and Indonesia have been positively affected by MNCs in terms of creating employment opportunities, introducing modern technology, and paving way for foreign market. In the same manner, Sri Lanka as a developing country can be positively affected by MNCs in socio-economic development.

**Key Words :** *MNCs, Developing Countries, Socio-Economic Role, Development*

[1] B.A. (Special) International Studies, University of Kelaniya
shimmy.adjumain@gmail.com

# රූපවාහිනී වැඩසටහන් මඟින් ළමුන් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම
## (ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරිනි)

ඩී.එච්. සසිකා මධුවන්ති[1]

**සංක්ෂේපය**

පාසල් ළමුන් විසින් රූපවාහිනිය නැරඹීමෙන් ඔවුන්ගේ අධ්‍යාපනයට හා චර්යාවට හිතකර මෙන්ම අහිතකර ප්‍රතිඵල රැසක් ඇතිවිය හැකි බැව් මෑත කාලීනව සිදුකරන ලද පර්යේෂණ මඟින් තහවුරු කර ඇත. ධන සහ සෘණ බලපෑම පිළිබඳව තවමත් ශ්‍රී ලාංකික සමාජය තුළ වාද විවාද පවතී. එබැවින් රූපවාහිනී වැඩසටහන් මඟින් ළමුන් කෙරෙහි ඇතිකරන බලපෑම කෙබඳු ද යන්න අධ්‍යන ගැටළුව ලෙස යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. රූපවාහිනී වැඩසටහන් මඟින් ළමුන් කෙරෙහි ඇති කරනු ලබන තර්ජනාත්මක බලපෑම හඳුනාගනිමින් ඒ සඳහා බලපාන සාධකවල ප්‍රමාණාත්මකතාව තීරණය කිරීම අධ්‍යයනයේ අරමුණයි. අධ්‍යයනය සඳහා ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තොරාගත් අතර සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ පාසල් සිසුන් 200 දෙනෙකු අධ්‍යයනයට භාජනය කරන ලදී. සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ක්‍රමය උපයෝගී කර ගනිමින් ප්‍රාථමික දත්ත ලබා ගත් අතර සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රමයන් උපයෝගී කර ගනිමින් දත්ත විශ්ලේෂණය සිදුකර ඇත. ඒ අනුව නියැදියෙන් 98% පමණ රූපවාහිනිය නරඹන අතර, දිනකට පැය 2-6 ත් අතර කාලයක් රූපවාහිනිය නැරඹීම සිදු කරනු ලබන බව අනාවරණය විය. එමෙන් ම ප්‍රචණ්ඩකාරී වැඩසටහන් නැරඹීමේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනස්කම් පවතින අතර හරාත්මක වැඩසටහන් නැරඹීමේ ඌණතාවයක් දක්වන බවත් විදේශීය ටෙලිනාට්‍ය සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වන බවත් තහවුරු විය. තව ද විකාශය වන වෙළෙඳ දැන්වීම් සහ ළමුන්ගේ ක්ෂණික ආහාර රුචිකත්වය අතර ධන සම්බන්ධතාවයක් ඇති බවත් හෙළි විය. දෙමාපියන් රැකියාවල නිරතව සිටින හා සෙල්ලම් කිරීමට ගෙවත්තක් නොමැති නාගරික ළමුන් වැඩි වශයෙන් රූපවාහිනී නරඹන බවට ආනාවරණය විය. ළමුන් බහුලව රූපවාහිනිය නරඹන කාල සීමාවන් තුළ අධ්‍යාපනික හා හරාත්මක වැඩසටහන් විකාශනය කිරීමටත් ටෙලිනාට්‍ය, කාටූන්, චිත්‍රපට, ප්‍රචණ්ඩකාරී ආදී වැඩසටහන් කිසියම් ප්‍රමිතිකරණයක් යටතේ විකාශනය කිරීමත් මඟින් රූපවාහිනී වැඩසටහන් මඟින් ළමුන් කෙරෙහි ඇති කරන සෘණාත්මක බලපෑම අවම කල හැකි බව මෙම අධ්‍යයනය මඟින් තවදුරටත් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** *රූපවාහිනී වැඩසටහන්, සෘණ බලපෑම, හරාත්මක වැඩසටහන්, සංඛ්‍යාත්මක විශ්ලේෂණ*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය , කැලණිය විශ්වවිද්‍යාලය
shachmadhuwanthi@gmail.com

# පුරවැසිසේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ ආකල්ප
## (ජා-ඇල නගර සභාව ඇසුරින් )

යූ.එල්.එච්.ඩී. පෙරේරා[1]          එම්.කේ. නදීකා දමයන්ති[2]

**සංක්ෂේපය**

නූතනයේ බොහෝ රාජ්‍යයන්හි කාර්යක්ෂම, මිත්‍රශීලි සහ ඵලදායී රාජ්‍ය සේවයක් බිහිකර ගැනීමේ අරමුණින් නව කළමනාකරණ ප්‍රවේශ භාවිතා කරනු ලබයි. 1990 දශකයේ සිට ශ්‍රී ලංකාව ද, මෙම භාවිතාවට එළඹිණි. මෙකී ප්‍රවේශ අතර 2007 වර්ෂයේ හඳුන්වාදෙන ලද පුරවැසි සේවා ප්‍රඥප්තිය වැදගත් කොට සැලකිය හැක. මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වන්නේ, නව කළමණාකරණ ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කිරීමට වෙර දරන පුරවැසි සේවා ප්‍රඥප්තිය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ ඒ සම්බන්ධයෙන් දක්වන ආකල්ප කවරේද? යන්න විමසීමයි. ජා-ඇල නගර සභාව කේන්ද්‍ර කොටගෙන මෙම අධ්‍යයනය සිදුකරනු ලැබිණි. අධ්‍යයන ප්‍රදේශය අහඹු ලෙස තෝරා ගත් අතර නියැදිය තෝරා ගැනීමේ දී නගර සභාවේ සේවා නියුක්ත කාර්ය මණ්ඩලයෙන් 50%ක් ආවරණය වන පරිදි නිලධාරීන් සහ සේවකයින් අහඹු ලෙස තෝරා ගැණිනි. එහිදී ආයතනයේ නිලධාරීන්ගෙන් 30%ක් ද, සුළු සේවකයින්ගෙන් 20%ක් ද, නියැදියට ඇතුළත් විය. ඒ අනුව සමස්ත නියැදිය පනහකි. පර්යේෂණය සඳහා ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන දෙයාකාරයේ ම දත්ත සහ තොරතුරු උපයෝගී කර ගැණිනි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතියික දත්ත යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ජා සහ නිරීක්ෂණ ක්‍රමවේද උපයෝගී කර ගැණිනි. රැස්කර ගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රතිශත, ප්‍රස්තාර සහ වගු සටහන් වැනි සරල සංඛ්‍යානමය ක්‍රමවේද භාවිතා කළ අතර ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය භාවිතා කරමින් විශ්ලේෂණය කෙරිණි. අධ්‍යයනයෙන් අනාවරණය වූ මූලික කරුණ වන්නේ ජා ඇල නගර සභාව පුරවැසි ප්‍රඥප්තිය තම කාර්යාලීය පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කරමින් රජයේ ප්‍රතිපත්තියට අනුගත වුවත් ප්‍රායෝගිකව එය ක්‍රියාවට නැංවීම සඳහා ක්‍රමවත් ක්‍රියාමාර්ගයක් හෝ විධිවිධාන සලසා නොමැති බවයි. පුරවැසි ප්‍රඥප්තිය පිළිබඳ දැනුවත්භාවය පිරික්සීමේදී කාර්ය මණ්ඩලයෙන් 46.7% (14)ක් වඩාත් හොඳින් ඒ පිළිබඳව දැනුවත්බව ප්‍රකාශ කළ අතර, 53.3% (16)ක් තරමක් දුරට ඒ පිළිබඳ දැනුවත් යැයි ප්‍රකාශ කරන ලදි. එසේම, සුළු සේවකයින්ගෙන් 100% ක් ඒ පිළිබඳව දැනුවත්භාවයකින් තොර වූහ. නිරීක්ෂණවලින් හෙළි වූ කරුණ වන්නේ නිලධාරීන්ගෙන් බහුතරය පුරවැසි සේවා ප්‍රඥප්තියේ සඳහන්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

අයුරින් සේවා සැපයීමට වඩා තම පෞද්ගලික කටයුතු ඉටුකර ගැනීම සඳහා රාජකාරි කාලය මිඩංගු කරන බවයි.

**මුඛ්‍ය පද ඃ** *පුරවැසි සේවා ප්‍රඥප්තිය, ජා ඇල නගරසභාව, නව කළමණාකරණ ප්‍රවේශ, රාජ්‍ය සේවය, නිලධාරින්*

# Impact of Ageing Population on the Economy of Sri Lanka

**D.K.S.M.A. Dissanayake**[1]

## Abstract

Population ageing is, the increase in the proportion of "older people", in the total population. This is a compulsory result of demographic transition. Declining fertility and increasing longevity are resulting in ageing of population in both developed and developing countries. The aging population in Sri Lanka has started to grow up rapidly since 1990s. Sri Lanka is a developing country it shares the problems of ageing population with the more developed countries. According to the recent population projections, in Sri Lanka, the share of population over 60 years will rise from 13% in 2012 to 17% by 2021. In addition, Sri Lanka's population is expected to start declining by 2031, indicating that the share of the elderly will rise even further. By 2051, the population over 60 years will be 29%. Population ageing would have profound implications on the economies as well as societies experiencing a rapid increase in the share of old aged in the total population. The main objective of this paper is to focus economic impact of population ageing in Sri Lanka, mainly based on the literature and secondary data published nationally and internationally. Descriptive statistical tools have been used for the data analysis. According to the study, it reveals that ageing population of the country mainly effect to the economic imbalance. Increasing ageing population significantly influence on public expenditure, in particular on the provision of pensions and health care in Sri Lanka. Due to the aging population government has to spend more from the national income on health, pensions and other compensation of the elderly people. Not only that the aged population who are not beneficiaries of a pension fund would normally depend on their savings or their children's income for consumption spending. Such a tendency will affect the economy at macro level because there will be a decline in the total domestic

[1] B.A. (Special) Social Statistics, University of Kelaniya
malsha.dissanayake@gmail.com

savings. In such situations, if domestic savings are insufficient for investment, alternative sources have to be sought. Also, the labor force in the country declining dramatically and it will be caused reducing labor supply and productivity.

**Key Words :** *Demographic Transition, Ageing Population, Economic Impact, Birth Rate, Death Rate*

# විද්‍යාර්ථීන්ගේ ප්‍රකාශනවල පවත්නා දුර්වලතා පිළිබඳ අධ්‍යයනය (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

ඩී.එම්. සුනේත්‍රා සෙව්වන්දි[1]

**සංක්ෂේපය**

විශ්ව දැනුමේ කෙන්ද්‍රස්ථානයක් වූ විශ්වවිද්‍යාලයෙන් පෝෂණය වන විද්‍යාර්ථියා තමන් උකහා ගන්නා ලද දැනුම විශ්වයට දායද කිරීමේ පුරෝගාමී සඟයෙකු වේ. මෙහි තවත් එක් පියවරක් ලෙස විශ්වවිද්‍යාලය තුළ විද්‍යාර්ථියින් විසින් නව දැනුම ගවේෂණය සහ පවත්නා දැනුම බෙදාහැරීම අරමුණු කොට ගනිමින් නිබන්ධන, සඟරා සහ ලිපි එළිදැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුව ද හුදෙක් එහි දැනුම ගවේෂණය කිරීමක් සත්‍ය වශයෙන් සිදුවනවා ද යන්න පිළිබඳ සොයා බැලීම මෙහි අරමුණ විය. මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්චා ක්‍රමය මගින් දත්ත ලබා ගත් අතර ඒ සඳහා විද්‍යාර්ථියින් 100 දෙනෙකුගෙන් යුතු නියැදියක් සියලු පීඨයන් නියෝජනය වන පරිදි අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. නියැදිය මඟන් ලබා ගන්නා ලද දත්ත සංඛ්‍යාන ක්‍රමවලට භාජනය කිරීමෙන් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. අධ්‍යයනයට අනුව, 70% පමණ සිසුන් නිබන්ධන, සඟරා සහා ලිපි සඳහා අන්තර්ජාලයෙන් හෝ වෙනත් මුද්‍රිත මාධ්‍යකින් උපුටා ගන්නා ලද තොරතුරු ඉදිරිපත් කරන බව නිගමනය විය. බොහෝ සිසුන් ප්‍රකාශ කරන ලද්දේ තමන් ඉදිරිපත් කරන මාතෘකාව පිළිබඳව තමන්වත් හරිහැටි නොදන්නා බවයි. නමුත් විශ්වවිද්‍යාල විද්‍යාර්ථියෙකුගේ මෙහෙවර විය යුත්තේ නව දැනුමක් තම නිර්මාණ තුළින් බිහිකිරීමක් මිස තවකෙකුගේ දැනුම කැටිකොට ඉදිරිපත් කිරීමක් නොවන බැව් බහුතරයෙකුගේ මතය විය. මේ සඳහා බලපාන ගැටලූ කිහිපයක් අධ්‍යයනයේ දී හඳුනාගන්නා ලදී. ඒවා නම් මේ පිළිබඳ විද්‍යාර්ථීන්ට නිවැරදි දැනුමක් හා මඟපෙන්වීමක් නොමැති වීම, විද්‍යාර්ථීන් ඉන් ඉදිරියට දැනුමක් ගවේෂණය කරන්නට දැනුම සොයා යන්නට මැලි බවක් දැක්වීමත් ය. අධ්‍යයනයෙන් අනාවරණය කරගන්නා ලද කරුණු අනුව පහත සඳහන් යෝජනා ඉදිරිපත් කෙරේ. එනම්, පර්යේෂණයක් සිදුකිරීමේ දී ඒ සඳහා අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම මෙන්ම නිවැරදි පුහුණුවක් ද ලබාදිය යුතු බවත් විද්‍යාර්ථීන් විසින් ද තම අරමුණ නිවැරදිව හඳුනාගෙන නව දැනුමක් සමාජයට ලබාදීමට උත්සහ කල යුතු බවත් ය.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථියා, ගවේෂණය, දැනුම, අනාවරණය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
sunethrasewmi@gmail.com

# Global Oil Price Collapse: Contributory Factors

K.R. Liyanaarachchi[1]

## Abstract

The recent global oil price plunge has resulted in creating both winners and losers, while leaving countries with high levels of oil consumption as winners and oil exporting countries as losers. A satisfactory explanation of this price decline is required in order to create a win-win situation for both oil exporting and importing nations. This study examines the major causes of the drastic decline in oil prices the world experienced during the past few years, particularly in 2014. Quarterly data from the 1st quarter of 2011 to the 2nd quarter of 2015, obtained from the Organization of the Petroleum Exporting Countries (OPEC) Monthly Oil Market Reports are analyzed using regression analysis, correlations and percentages. The results of the regression analysis indicate the fact that the growth in both OPEC and non-OPEC oil supply has contributed to the global oil price plunge. The negative correlations further affirm the fact that the increase in OPEC and non-OPEC oil supply has a huge impact in declining oil prices , while non-OPEC oil supply being the most prominent factor affecting the prices. Moreover it can be stated that the lower growth in global oil demand compared to the growth in global oil supply (both OPEC and non-OPEC) has also become a contributory factor to the oil price collapse in 2014.

**Key Words :** *Oil Price Decline, OPEC, Non-OPEC, Global Oil Demand, Regression*

[1]B.A. (Special) Economics, University of Kelaniya
kalsha001@gmail.com

# 2015 මහමැතිවරණ සමයේ රූපවාහිනිය හරහා ප්‍රචාරය වූ දේශපාලන වෙළඳ දැන්වීම් අපේක්ෂකයන්ට හා ඡන්දදායකයන්ට සිදුකළ බලපෑම

ජේ.කේ.එම්.ටී. මංගලවංශ[1] එම්.කේ. නදීකා දමයන්ති[2]

## සංක්ෂේපය

මෙම අධ්‍යයනය සඳහා පදනම් වූ අරමුණ වූයේ 2015 මහා මැතිවරණයේදී රූපවාහිනිය ඔස්සේ ප්‍රචාරය වූ දැන්වීම් තුළින් මහජන මතය ගොඩ නැංවීමත් සහ අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය වෙනුවෙන් කළ බලපෑමත් අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතීක යන දෙඅංශයෙන්ම ලබාගත් තොරතුරු යොදාගෙන ඇත. ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා අධ්‍යයන ප්‍රදේශයේ අහඹු ලෙස තෝරාගත් ඡන්ද දායකයන් වෙත ඉදිරිපත් කළ ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡා භාවිතා විය. මෙම අධ්‍යයනය සඳහා බස්නාහිර පළාතේ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් එක් දිස්ත්‍රික්කයකින් ඡන්දදායකයින් 70 බැගින් 140ක් අහඹු ලෙස තෝරා ගැණිනි. ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන විධික්‍රම ඔස්සේ ද ගුණාත්මක දත්ත සහ තොරතුරු විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදී. මෙම නියැදියට අවුරුදු 18-70 අතර වයස් කාණ්ඩවල ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම ඇතුළත් වූ අතර ඒ තුළ විවිධ අධ්‍යාපන මට්ටම්වල හා විවිධ රැකියාවල ප්‍රතිචාරීහු ඇතුළත් වූහ. අධ්‍යයනය තුළින් අනාවරණය කරගත් මූලික කරුණු ලෙස රූපවාහිනී දැන්වීම් මගින් ලබාදුන් පණිවුඩය පිළිබඳ තරමක අවබෝධයක් ලබාගත හැකි බව ප්‍රතිචාරීන්ගෙන් 60.7% ප්‍රකාශ කර සිටි අතර දැන්වීම් ප්‍රචාරය මගින් ඡන්දදායකයින්ට ක්ෂණිකව හා ඉක්මණින් ආමන්ත්‍රණය කිරීම හා සිහිකැඳවීම් කළ හැකිය යන්න ප්‍රතිචාරීන් 66.4% මතය විය. තමන්ට ඡන්දය භාවිතා කිරීම සඳහා කිසියම් උද්යෝගයක් හා බලපෑමක් රූපවාහිනී දැන්වීම් මගින් සිදුවූ බවට 48.6%ක් ප්‍රකාශ කරනු ලැබීය. ප්‍රතිචාරීනගෙන් 52.9% මතය වූයේ රූපවාහිනී මාධ්‍යයෙන් දේශපාලන දැන්වීම් ප්‍රචාරය කිරීම සුදුසු බවයි. එක්සත් ජනතා නිදහස් සන්ධානය යුද්ධය හා එහි ජයග්‍රහණය වෙනුවෙන් තමන් ක්‍රියාකළ ආකාරය පිළිබඳ පණිවුඩ ලබාදෙන දැන්වීම් මෙවර මැතිවරණයේදී ප්‍රචාරය කළ බවට 75% ක් ප්‍රකාශ කළ අතර එක්සත් ජාතික පක්ෂය ප්‍රචාරය කළ දැන්වීම් තුළ අන්තර්ගත වූයේ අනාගතයේදී ජනතාවට ලබාදීමට බලාපොරොත්තු වන සහන බව 51.4% මතය විය. ධනාත්මක දැන්වීම් මගින් පක්ෂයට/අපේක්ෂකයා වෙත කැමැත්ත ඇතිකර ඡන්දය දිනාගැනීමට බලාපොරොත්තු වූ බව ප්‍රතිචාරීන්ගෙන් 69.3% අදහස විය. මෙසේ දැන්වීම් පළකිරීම මගින් ප්‍රතිචාරීන්ගේ ඡන්දය දැමීම සම්බන්ධයෙන් පෙර එළඹ තිබූ තීරණය වෙනස් වන බව 35.% ප්‍රකාශ කළේය. ඒ අනුව රූපවාහිනී මාධ්‍ය හරහා ප්‍රචාරය වන දේශපාලන දැන්වීම් තුළින් ඡන්ද

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

දායකයන්ට සිදුවන බලපෑම මත දේශපාලන අපේක්ෂකයන්ට කිසියම් බලපෑමක් සිදුවන බව පර්යේෂණ දත්ත විශ්ලේෂණය මඟින් නිගමනය කළ හැකි විය.

**මූඛ්‍ය පද ඃ** *දැන්වීම් ප්‍රචාරය, රූපවාහිනී මාධ්‍යය, ඡන්ද අපේක්ෂකයන්, ඡන්දදායකයන්, 2015 මැතිවරණය*

# කාන්තාවන් විදේශ රැකියා සඳහා ඇදීයාම
## (ශ්‍රී ලංකාව ඇසුරින්)

එච්.ඩී.පී. මධුෂානි[1] ඩබ්.වී.පී.එම්. නයෝමි[2]
ඩී.එම්.එච්. දසනායක[3] එල්.පී.ඩී. පෙරේරා[4]

**සංක්ෂේපය**

වර්තමානය වන විට කාන්තාවන් මෙරට රැකියාවක නියුක්ත වීමට දක්වන කැමැත්තට වඩා විදේශ රැකියාවල නිරත වීමට  කැමැත්තක් දක්වන බවක් දක්නට ලැබේ. මෙයට හේතුව වී ඇත්තේ අධ්‍යාපන මට්ටමද නැතහොත් කාන්තාවන් සහ පුරුෂයන් අතර විශාල වැටුප් විෂමතාවක් පැවතීමද යන්න විමසිය යුත්තකි. එබැවින් විදේශ රැකියාවල නිරත වීමට රුචිකත්වයක් දැක්වීමට හේතුව කුමක්ද යන්න අධ්‍යයන ගැටළුව කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ විදේශ රැකියා සඳහා වැඩි රුචිකත්වයක් දැක්වීමට හේතු හඳුනා ගැනීමයි. අධ්‍යයනය සඳහා ද්විතියික දත්ත භාවිතා කළ අතර ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් දත්ත ලබාගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම දත්ත විශ්ලේෂණ සඳහා භාවිතා කළ අතර අධ්‍යයනය මගින් අනාවරණය වුයේ ශ්‍රී ලාංකිකයන් මිලියන දෙකක පමණ ප්‍රමාණයක් විදේශ රැකියාවල නියුතු බවත් ඉන් 52%ක් වැනි ප්‍රමාණයක් කාන්තාවන් බවත්ය. එමෙන්ම මෙරට තුළ වැඩකිරීමට කාන්තාවන් දක්වන රුචිකත්වය පිළිබඳ ගැටලුකාරී තත්වයක් පවතින බව හෙළිවිය. විදේශ රැකියාවල නියුතු කාන්තාවන්ගෙන් බහුතරයක් එතරම් ආකර්ෂණීය නොවන ගෘහ සේවිකා රැකියා වල නියැළී සිටියි. අධ්‍යයනය මඟින් අනාවරණය වූයේ එවැනි රැකියා වල පවතින අර්බුධයන් පිළිබඳ දැනුවත් වී තිබුණද ඔවුන් විදේශ රැකියා සඳහා යොමු වී තිබෙන්නේ ඔවුනගේ සමාජ ආර්ථික පසුබිමෙහි අඩුලුහඬුකම් රාශියක් ඇති බැවිනි. ශ්‍රී ලංකික නීති රාමුව මගින් ද කාන්තාවන්ට නිසි ආරක්ෂාවක් සහ රැකවරණයක් ලබාදිය හැකි පනත් ක්‍රියාකාරී මට්ටමකට ගෙන ඒම සම්බන්ධව ඉතා පසුගාමී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරන බව තහවුරු විය. දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය කරගත් කරුණු වූයේ දැනට දේශීය

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
pavithrahdm@gmail.com

[2]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය,
wickramasinghe.mahesha@yahoo.com

[3] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය,
harshanidasanayake1991@gmail.com

[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
gdinusha.perera@gmail.com

රැකියා වල නියුතු කාන්තාවන්ට රැකියා වල ඉහළ ස්ථරයන්ට ගමන් කිරීමේදී විශාල ගැටලුවකට මුහුණ පෑමට සිදුවන බව මෙන්ම කාන්තා සහ පුරුෂයින් අතර විශාල වැටුප් විෂමතාවක් පවතින බවයි. දේශිය රැකියා වෙළෙඳපොළ තුළ කාන්තා දායකත්වය පවතින්නේ අඩු මට්ටමක වන අතර රැකියා වල ක්‍රියාකාරීව නියුතු වන කාන්තාවන්ට ලැබෙන පහසුකම් සහ ආර්ථික ප්‍රතිලාභ පුරුෂයින්ට සාපේක්ෂව අවම මට්ටමක පවතී. මෙම නිසා ආර්ථික පරිසරය තුළ කාන්තා සහභාගීත්වය දිරිගැන්වීම සඳහා නිසි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ශ්‍රී ලංකාව කටයුතු කළ යුතුය.

**මූඛ්‍ය පද :** *විදේශ රැකියා, ගෘහ සේවිකා, වැටුප් විෂමතාව, රැකියා වෙළෙඳපොළ*

# ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියෙහි ජල කළමනාකරණය පිළිබඳ ඇගයීමක්
## (අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්)

එම්.ඩබ්.එන්. මාධවී[1] ආර්.එම්.ඒ.ආර්. රත්නායක[2]
එච්.පී.පී.එස්.ඩී. හේවාවසම්[3] පී.එම්.එස්. කුලතුංග[4]
පී.එච්.පී. කරුණාරත්න[5] එම්.කේ. නදීකා දමයන්ති[6]

**සංක්ෂේපය**

කෘෂිකර්මාන්තය සඳහා ජලය අත්‍යවශ්‍ය සාධකයක් වේ. අනෙක් අතට ජලය යනු සීමිත සම්පත්වලින් එකකි. එම නිසා ජල කළමණාකරණය සහ ඒ සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති වර්තමානය වන විට ලෝකයේ සහ ශ්‍රී ලංකාවේ ද විශාල වශයෙන් කතා බහට ලක් වන්නකි. ශ්‍රී ලංකාව අතීතයේ සිට අද දක්වා ම කෘෂිකර්මාන්තය ප්‍රධාන කොට ගත් රාජ්‍යයක් වීම හේතුවෙන් ජල කළමනාකරණ සංකල්පය ශ්‍රී ලංකාවට වැදගත් සංකල්පයකි. එම නිසා 2007 සැප්තැම්බර් මස හඳුන්වා දෙනු ලැබූ ආහාර හා අපනයන කෘෂිකර්ම බෝග සහ විසිතුරු පැලෑටි පිළිබඳ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියෙහි ජල කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති මාලාවක් හඳුන්වා දී ඇත.කෙසේ වුවද, ප්‍රායෝගික තත්ත්වය වන්නේ වර්තමානයේදී ද ජල කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ විවිධ ගැටලු පැවතීමයි. මෙම පර්යේෂණයේදී කෘෂිකර්ම ප්‍රතිපත්තියට ආදාළ ජල කළමනාකරණය සම්බන්ධයෙන් දක්වා ඇති ප්‍රතිපත්තිමය කරුණුවල සාර්ථක අසාර්ථක භාවය පිළිබඳව සොයා බැලීම අරමුණ විය. එහි ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ අම්පාර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය විනිශ්චය නියැදුම් ක්‍රමය යටතේ තෝරා ගැණිනි. ඉන් පසුව අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවගම්පුර ග්‍රාම නිලධාරී වසමේ "රජ වැව" නම් කුඩා වැව යටතේ ක්‍රියාත්මක වන රජ වැව පහළ යාය ගොවි සංවිධානයේ ගොවීන් 50ක් නියැදිය වශයෙන් තෝරා ගැණිනි. අක්කර 1/2 සිට අක්කර 3 දක්වා වූ භූමි ප්‍රමාණයක කුඹුරු අස්වද්දවන ගොවීහු මෙම නියැදියට ඇතුළත් වූහ. අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතියික දත්ත ලබාගත් අතර ප්‍රාථමික දත්ත සම්පාදනයේදී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය ක්‍රමවේද භාවිතා කරන ලදී. අධ්‍යයනයේදී ලබාගත් දත්ත සහ තොරතුරු විශ්ලේෂණයේදී ප්‍රමාණාත්මක දත්ත සඳහා සරල සංඛ්‍යානමය ක්‍රමවේදයත්, ගුණාත්මක දත්ත සහ

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[6] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

තොරතුරු සඳහා විස්තරාත්මක ක්‍රමවේදයත් භාවිතා කරන ලදී. මෙම ගොවීන්ගෙන් 64%ක් දෙකන්නයම කුඹුරු වගා කරන අතර යල කන්නයේ පමණක් වගා කරන ගොවීන්ගෙන් 56%ක් අනෙක් කන්නයේ වගා නොකරනුයේ ජලය සපයා ගැනීමේ අපහසුව හේතුවෙනි. වාරි පද්ධති නඩත්තු කිරීමේදී සහ වැඩි දියුණු කිරීමේදී සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශය දිරිමත් කිරීම මෙම ප්‍රතිපත්තියේ එක් අංගයක් වන අතර ප්‍රතිචාරීන්ගෙන් 96%ක් අනාවරණය කළේ නව අමුණ ඉදිකිරීමේ කටයුතු සැලසුම්කරණයේදී තම අදහස් විමසූ බවයි. එමෙන්ම තම අදහස් යම් මට්ටමකින් හෝ සම්පූර්ණයෙන් පිළිගෙන ඇති බව 88%ක් පැවසූ අතර ජල භාවිතය පිළිබඳ අදාළ නිලධාරීන් විසින් තමන් නිරතුරුව දැනුවත් කරන බව 52%ක් පැවසූහ. ස්වභාවික ව්‍යසනවලදී හානිවන වාරිමාර්ග ප්‍රතිසංස්කරණයේදී රජයේ සහයෝගය පිළිබඳ තමන් තෘප්තිමත් බව 32%ක් ප්‍රකාශ කළ අතර 40%ක් අතෘප්තිමත් බව ප්‍රකාශ කළහ. මේ අනුව 2007 ජල කළමනාකරණ ප්‍රතිපත්තිය සාධනීය මට්ටමකින් ක්‍රියාත්මක වන බව නිගමනය කළ හැක.

**මුඛ්‍ය පද ඃ** *ජල කළමනාකරණය, අම්පාර දිස්ත්‍රික්කය, කුඩා වැව්, ගොවීන්*

# Usage of mobile phones among university students in Sri Lanka

L.N. Liyanage[1]

**Abstract**

Since the development of communication technology, the mobile phone has played a major role in the modern world. Currently around 4.9 billion people in the world, own 7.2 billion mobile subscriptions, thanks to owning multiple devices and inactive accounts. Consequently as a developing country Sri Lanka is also affected by this greatly. Although there's only 20.7 million people in Sri Lanka, the number of mobile phone in use is 22.1 million. Especially the youth has used to mobile devices very rapidly. The purpose of this research is to study the usage of mobile phone among university students in Sri Lanka. 100 students representing all the faculties were tested using questionnaires and interview method. This survey revealed that 71% of students prefer to have prepaid connection where they spend more than Rs.800 per month on service, make at least 2 hour duration of calls per day and 50 -100 SMS per day. They spend more time on mobile phones than their time of studies. On the other hand, the students use mobile phones for their day today educational activities too. Samsung is the most popular brand among the students. No matter their family status, majority of them own the best smart phones. There are both pros and cons in the usage of mobile phones among university students.

**Key Words :** *Mobile Phone, University Students, Communication, Sri Lanka*

[1]B.A. (Special) Social Statistics, University of Kelaniya
lashi.navi@gmail.com

# වැඩිහිටි නිවාස වල සිටින පුද්ගලයින්ගේ සමාජ ආර්ථික මානසික පසුබිම
## (ගම්පහ කිරිදිවැල රංවල ප්‍රදේශයේ සමාධි වැඩිහිටි නිවාසය ඇසුරිනි)

එම්.ඒ. රුෂාන්ති දිල්ෂානි[1]

**සංක්ෂේපය**

මව්කුසින් මෙලොව එළිය දකිනා ඕනෑම පුද්ගලයෙකු ළමාවිය, තරුණවිය, මැදිවිය පසුකොට මහලුවිය කරා යෑම ලෝක ස්වභාවයයි. එම ලෝක ස්වභාවය සනාථ කරමින් මහලු විය කරා එළඹ සිටින්නාවූ බොහෝමයක් වර්තමාන සමාජය තුළ ව්‍යාප්තව පවතී. නමුත් සමාජය තුළ ඔවුන් පිළිබඳ කතිකාවතක් ගොඩ නැගී තිබීම දැකීම ඉතාමත් දුර්ලභය. බොහෝවිට ළමාවිය, තරුණවිය, මැදිවිය පිළිබඳ සමාජය තුළ පුළුල් වශයෙන් සාකච්ඡා වුවද හුදකලා මහලු විය පිළිබඳ විමර්ශනාත්මකව කෙරුණු පර්යේෂණ උගහටය. ඒ අනුව වැඩිහිටි නිවාසවල සිටින පුද්ගලයින්ගේ සමාජ, ආර්ථික,මානසික පසුබිම සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ විය. අධ්‍යයනය සඳහා සමාධි වැඩිහිටි නිවාසය තෝරාගත් අතර එහි සිටින සියලුම වැඩිහිටියන් (26 දෙනෙකු) අධ්‍යයනය සඳහා භාවිතා කර ඇත. ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් අවශ්‍ය දත්ත ලබාගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක විධික්‍රම භාවිතා කර ඇත. අධ්‍යයන නිගමනයන්ට අනුව බහුතරයක් වියපත් වුවත් හුදකලා බවට පත්ව ඇත්තේ ඔවුන්ගේම දරුවන්ගේ ක්‍රියා කලාපය මත බවද, බොහෝ දරුවන් විදෙස්ගත වීමේ හේතු සාධකය මත දෙමාපියන් වැඩිහිටි නිවාසයකට දමා ගොස් ඇති බවද අනාවරණය විය. එසේම බොහෝ වියපත් වුවත් ඔවුන්ගේ තරුණ වයස්වලදී සැලකිය යුතු රැකියාවල නියුතු වූවන්ද වන බව පෙනෙන්නට තිබුණි. බහුතරයක් වැඩිහිටි මව්පියන් විශ්‍රාම වැටුප් ලබන අය වීමද විශේෂයකි. ඔවුන්ගේ මානසික තත්ත්වය විමර්ශනය කිරීමේදී දරුවන් ඔවුන්ව පවුල් වලින් නෙරපා හැරීම සම්බන්ධයෙන් ඔවුන් තුළ වෛර සිතුවිල්ලක් නොමැති අතර නැවත ඔවුන්ට නිවසට යෑමට අවස්ථාවක් ලැබුනොත් යනවාද යන පැනයට ඔවුන්ගේ පිළිතුර වූයේ ඔවුන්ට මෙම ජීවිතය එනම් වැඩිහිටි නිවාසයේ ගෙවන ජීවිතය සුවදායක බවයි. එසේම එකිනෙකා අතර තිබූ අපූර්ව වූ සුහදත්වය සහ ඔවුන්ගේ ධර්මානුකූල චර්යාව ඔවුන් නැවත නිවස් කරා යෑමේ සිතුවිල්ලෙන් මුදවන බව ප්‍රත්‍යක්ෂ විය. වැඩිහිටි නිවාසය මඟින් මෙම වැඩිහිටියන්ට සිදුවන මෙහෙවර පිළිබඳ සොයා බැලීමේදී සැලකිය යුතු මට්ටමේ සුභදායක පිළිතුරක් ලැබිණි. පෝෂදායී ආහාර ඔවුන්ට දිනපතා ලැබුණු අතර ඔවුන් ආගමානුකූල දිවියකට පෙළඹවීමට පාලකයින් වගබලාගෙන තිබුනි. සැඳෑ සමය ගත කිරීම උදෙසා ද ඔවුන් යම් යම් ක්‍රියාකාරකම් වලට යොමු කරවා තිබුණි. තවද

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
rushanthidilshani@gmail.com

පොහෝ දා සිල් සමාදන් වීම වැනි කටයුතුද, ඔවුන් බැලීමට පැමිණෙන පිරිස් ද ඔවුන්ගේ මනස නිරවුල් කිරීමට බෙහෙවින් උපකාර කරන බවද තහවුරු විය. එසේම පර්යේෂණය අවසානයේ දැනගත හැකි තවත් කරුණක් වූයේ වැඩි වශයෙන් හුදකලා බවට පත්වී ඇත්තේ කාන්තාවන් වන බවත් තම පුතුගේ විවාහයෙන් පසු ඔවුන්ට එම තත්ත්වය උදා වී ඇති බවත්ය.

**මුඛ්‍ය පද :** *වැඩිහිටියන්, වැඩිහිටි නිවාසය, සමාජ ආර්ථික මානසික පසුබිම*

# ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය සේවක දැනුවත්භාවය

එච්.එම්.එච්.සී. හේරත්[1] ආර්.ටී.ඒ. සම්පත්ගේ[2]
එන්.එච්.එම්. ප්‍රනාන්දු[3] ජේ.එම්.ඩී.එම්.එච්. දෙව්දුනි[4]
එම්.කේ. නදීකා දමයන්ති[5]

**සංක්ෂේපය**

ආයතන සංග්‍රහය යනු, ගුණාත්මක හා කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාදීමේ අරමුණින් රාජ්‍ය සේවකයා ආරක්ෂා කිරීමටත්, රාජ්‍ය සේවාව තුළ ඇතිවන යම් යම් පීඩාකාරී තත්ත්වයන්ගෙන් සේවා ස්ථානය මුදවා ගැනීමටත් මෙරට රජය විසින් රාජ්‍ය සේවකයාට ලබා දී ඇති ලිඛිත මාර්ගෝපදේශ මාලාවයි. එමෙන්ම ආයතන සංග්‍රහය ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට හඳුන්වාදෙනු ලැබුවේ 1985 වර්ෂයේදීය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ආයතන සංග්‍රහයේ 2, 4, 5, 7, 8, 12, 14, 27, 28, 32 පරිච්ඡේදයන්හි එන යුතුකම්, අයිතිවාසිකම්, වරප්‍රසාද හා බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳ රාජ්‍ය සේවක දැනුවත්භාවය පිරික්සීමයි. පරිපාලන නීති රීතිවලට අනුව ආයතන සංග්‍රහයෙන් බැහැරව රාජ්‍ය සේවකයන්ට කටයුතු කළ නොහැකි හෙයින් ඒ සම්බන්ධයෙන් වන දැනුවත්භාවය රාජ්‍ය සේවකයකු තුළ පැවතිය යුතුය. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයතන අංශය හා ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව අධ්‍යාපන කලාපයට අයත් රජයේ පාසලක් තෝරාගත් අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයතන අංශයේ සේවයේ නියුතු කළමනාකරණ සහකාර, විධායක මට්ටමේ නිලධාරීන් ඇතුලුව කාර්යය මණ්ඩලයේ විසිදෙනෙකු හා තෝරාගත් රජයේ පාසල තුළ ගුරු සේවයෙහි නියුතු අහඹු ලෙස තෝරාගත් ගුරුවරුන් තිස්දෙනෙකු අධ්‍යයන නියැදිය ලෙස තෝරාගන්නා ලදී. මෙම අධ්‍යයනය බෝහෝ දුරට ප්‍රමාණාත්මක දත්ත මත පදනම් වූ අතර සරල සංඛ්‍යානමය විධික්‍රම භාවිතාකර දත්ත විශ්ලේෂණය කරන ලදී. නියැදියට ඇතුළත් වූ පුරුෂයින් සංඛ්‍යාවට සාපේක්ෂව ස්ත්‍රීන් සංඛ්‍යාව ඉහළ මට්ටමක් ගනු ලැබිණි. නියැදියට අදාළ ප්‍රතිචාරීන්ගෙන් බහුතරය අවුරුදු එකොළහක (11) සේවා කාලයකට අයත් පිරිස වූ අතර බඳවා ගැනීමේ පටිපාටිය, මාස් පඩි පිළිබඳව හා පරිපාලන කාර්යය පටිපාටිය, වරප්‍රසාද සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇති පිරිස 50% කට වඩා වැඩි විය. ඒ අනුව ගත්කළ රාජ්‍ය සේවකයාට ලබා දී ඇති ලිඛිත මාර්ගෝපදේශ මාලාවක්වන ආයතන සංග්‍රහය පිළිබඳ

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. damayanthi@kln.ac.lk

ඔවුන්ගෙන් දැනුවත් භාවය සහිත ප්‍රමාණය පහළ මට්ටමක පවතින බව මෙමගින් අනාවරණය විය.

**මුඛ්‍ය පද ඃ** ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවය, අධ්‍යාපන අමාත්‍යාංශය, පරිපාලන කාර්ය පටිපාටිය

# සංවිධානයක කාර්යක්ෂමතාව රඳාපැවැත්මට සේවකයින් තුළ ඇති රැකියා තෘප්තිය

එම්.පී.ඒ.ඩබ්. පතිරාජ[1]

**සංක්ෂේපය**

ඕනෑම සංවිධානයක කාර්යක්ෂමතාව රඳාපැවැත්මට සංවිධානයේ සේවකයින් තුළ ඇතිවන රැකියා තෘප්තිය කෙසේ බලපාන්නේද යන්න සොයා බැලීම අත්‍යවශ්‍ය කාරණයක් බවට පත්ව තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ සේවකයින් තුළ රැකියාව පිළිබඳ තෘප්තිමත්භාවයේ මට්ටම හඳුනාගැනීම හා සේවකයින් තුළ සිය රැකියාව පිළිබඳ ඇතිවන තෘප්තිමත්භාවයට හෝ අතෘප්තිමත්භාවයට බලපාන ප්‍රධාන සාධක හඳුනාගැනීමයි. සසම්භාවී නියැදි ක්‍රමය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ විදුලිබල මණ්ඩලයේ සේවකයින් 125 ක ප්‍රමාණයකින් දත්ත දායකයින් වශයෙන් සේවකයින් 50 ක් අහඹු ලෙස තෝරාගත් අතර ලූතන්ස් ඉදිරිපත් කර ඇති රැකියා තෘප්තිය සඳහා බලපාන ප්‍රධාන සාධක 06 පදනම් කරගෙන ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමයන් අනුගමනය කරමින් දත්ත ලබාගෙන ඇත. දත්ත දායකයින් ලබාදුන් පිළිතුරුවල සමස්තය සංඛ්‍යාත්මකව පෙළගස්වා පිළිතුරු සඳහා වූ හේතු පදනම් කරගනිමින් විස්තරාත්මක දත්ත විශ්ලේෂණයක් සිදුකර ඇත. දත්ත විශ්ලේෂණයට අනුව පර්යේෂණය තුළින් අවසන් නිගමනය වන්නේ සමස්ත සේවකයන්ගෙන් බහුතරයක් රැකියාව පිළිබඳ තෘප්තිමත් බවය. එයට මූලික හේතුව ලෙස පැහැදිලි වූයේ වැටුප් හා වේතන පිළිබඳ ඔවුන් තුළ වූ තෘප්තිමත්භාවයයි. ඒ අනුව සේවකයින් වැටුප හේතුවෙන් ආයතනය කෙරෙහි බැඳී පවතින බවක් දක්නට ඇතැයි පැහැදිලි වේ. මෙම සමස්ත කරුණු අනුව සේවකයින් තුළ ඇතිවන රැකියා තෘප්තිය ඔවුන්ගේ කාර්යය සාධනය කෙරෙහි මූලික වශයෙන් බලපා ඇති බැව් නිගමනය කළ හැකි වේ.

**මුඛ්‍ය පද :** *කාර්යක්ෂමතාව, සේවකයින්, රැකියා තෘප්තිය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
ayeshani128@gmail.com

# ශ්‍රී ලංකාව තුළ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ භාවිතය (ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇසුරින් )

ආර්.එම්.ටී. දුලාංජලී[1] ටී.එම්.ටී.එච්. ගුණසේකර[2]
ඩබ්.එස්.එන්. හේමන්ති[3] එස්.එල්.එන්.එස්.ආර්. මධුෂිකා[4]
පී.ජී.එස්.එස්. රත්නායක[5] එම්.ඒ. විජේතුංග[6]
එම්.කේ. නදීකා දමයන්ති[7]

**සංක්ෂේපය**

රාජ්‍ය ආයතනවලින් සේවාවන් ලබා ගැනීමේ දී පුරවැසියන් විවිධ ගැටලු සහගත තත්ත්වයනට මුහුණ දෙන බව නොරහසකි. එමෙන්ම රාජ්‍ය ආයතන තුළින් සේවාලාභීන්ට සේවා සැපයීමේ දී ක්‍රියාවට නංවන ඇතැම් ක්‍රියාමාර්ග වර්තමාන සමාජ සංදර්භය සමඟ නොගැළපෙන බව ඒ සම්බන්ධයෙන් කරන ලද පූර්ව පර්යේෂණවලින් අනාවරණය කරගෙන ඇත. මෙයට විසඳුමක් ලෙස පසුගිය රජය සමයේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය හඳුන්වා දෙමින් රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට පියවර උත්සාහ දරන ලදී. නමුත් එය සාර්ථකව ක්‍රියාත්මක වූවා ද යන්න සැක සහිතය. එබැවින් මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය මේ වන විට ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇතත් එය සාර්ථකව ක්‍රියාත්මක වේ දැයි යන්න සොයා බැලීමයි. ඒ සඳහා සාක්ෂරතාවයෙන්, තාක්ෂණයෙන්, නාගරිකත්වයෙන් ඉහළ මට්ටමක් පෙන්නුම් කරන ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ක්ෂේත්‍ර අධ්‍යනය සඳහා තෝරා ගැනුණි. අධ්‍යයන නියැදියට ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරින් දස දෙනෙක් අහඹු ලෙස තෝරා ගත් අතර සේවා ලබා ගැනීමට පැමිණි සේවාලාභීන් 50 දෙනෙක් ද ඇතුළත් වන සේ ප්‍රශ්නාවලියක් මඟින් දත්ත සහ තොරතුරු සපයා ගැනිණි. ලබාගත් ප්‍රමාණාත්මක තොරතුරු ප්‍රතිශත, ප්‍රස්තාර, වගු සටහන් ආදී සරල සංඛ්‍යාන විධි ක්‍රම භාවිතා කරමින් විශ්ලේෂණය කළ අතර ගුණාත්මක දත්ත සහ තොරතුරු විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයනයෙන් අනාවරණය කරගත් අන්දමට ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය මේ වන විට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තුළ ක්‍රියාත්මක වූවත්, ප්‍රතිචාරීන්ගෙන් 68%ක් ඒ සම්බන්ධයෙන් දැනුවත්භාවයක් නොමැත. තවද, එය කාර්යක්ෂම සේවයක් ලබාදීමට ඉවහල් වන බව ප්‍රතිචාරීන්ගෙන් 30% මතය වු අතර වඩා

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[6] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[7] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. damayanthi@kln.ac.lk

පහසු ක්‍රමවේදයක් බව 20% පැවසුවත් තවත් 24% මතය වූයේ ඒ සම්බන්ධයෙන් ආයතනය විසින් දැනුවත් භාවයක් ලබා දෙන්නේ නම් ප්‍රයෝජනවත් වන බවයි. මේ අනුව නිගමනය කළ හැකිවන්නේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව මහජනතාව තුළ දැනුවත් භාවය අඩුවීමත්, වෙබ් අඩවියේ තොරතුරු යාවත්කාලීන කිරීම සහ විද්‍යුත් තැපැල මගින් යොමු කෙරෙන විමසීම් සඳහා පිළිතුරු සැපයීම ආදී කටයුතු සඳහා කාර්යාලය තුළ වෙන් වූ නිලධාරීයෙකු නොවීමත් හේතුවෙන් මෙම ප්‍රතිපත්තිය භාවිතයට ගැනීම සම්බන්ධයෙන් ගැටලු මතු වී ඇති බවයි.

**මුඛ්‍ය පද ඃ** *ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සේවා සැපයීමේ කාර්යක්ෂමතාව*

# Post War Tourism in Sri Lanka
## (Time – Series Analysis)

P.A. Gayeshi Madhushani[1]

**Abstract**

Tourism contributes immensely to the economic growth of Sri Lanka. As it is one of the potential and fasted growing economic sectors in the country. Since 1966, tourism expanded rapidly. But, due to the civil and ethnic conflicts tourism had to faced adverse fluctuations. That is the hypothesis of this study. Hence, as the objective, expect to recognize the opinion of tourists on the territorial, social and political instability by comparing the period of 5 years before and 5 years after war. This study applies annual time series data of total arrivals of tourists and visiting purposes of tourists and total foreign exchange earnings from tourism in Sri Lanka for period of 2004 to 2014.The above quantitative data were entirely based on the secondary data of Sri Lanka Tourism Development Authority and the World Tourism Organization. Concerning the main characteristics of visiting purposes of tourists during that period, can be recognized as high increased number of visiting for friends and relations and rapidly decreased official and private businesses. The low business purpose implies that it badly affected to the economic growth. During the period of 2008-2010, most of data of above three topics have faced to recession relative to other years. Withal, tourism sector is blooming after the war in Sri Lanka. Long term secular and seasonality are the leading components of the tourist arrival patterns in Sri Lanka within the post war period. The conclusion of this study is the stability of overall condition in Sri Lanka can be paved the way for sustainable tourism including economic growth.

**Key words :** *Post War Tourism, Time-Series Analysis, Economic Growth*

[1] B.A (Special) Social Statistics, University of Kelaniya
gayeshi.m@gmail.com

# කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ පුස්තකාල භාවිතය හා අධ්‍යයන ප්‍රතිඵල අතර සම්බන්ධය
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

පී.සී. විජේසිංහ[1]

**සංක්ෂේපය**

පුස්තකාලය යන්න දැනුම සපිරුණු භාණ්ඩාගාරයක් වශයෙන් නිර්වචනය කල හැකිය. සෑම විශ්වවිද්‍යාල පුස්තකාලයක්ම විද්‍යාර්ථීන්ට දැනුම ලබා දෙන්නා වූත් විශ්වවිද්‍යාල පද්ධතිය තුල හදවත බඳු වූත් ඒකකයකි. එබැවින් පුස්තකාල භාවිතය විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතු සමග බැඳී පවතින්නක් බවට සැකයක් නැත. නමුත් වර්තමානය වන විට තාක්‍ෂණයේ දියුණුවත් සමග තොරතුරු ගවේෂණය සඳහා පුස්තකාල භාවිතය අවම කරමින් ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිතයට විද්‍යාර්ථීන් තුළ නැඹුරුවක් පවතින බවට පර්යේෂණ මගින් අනාවරණය කර ඇත. මේ නිසා පුස්තකාල භාවිතය අවම වීම විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතුවලට බලපෑමක් ඇති කරයි ද යන්න සොයා බැලීම වැදගත් ය. ඒ අනුව මෙම අධ්‍යයනය මූලික අරමුණවන්නේ පුස්තකාල භාවිතය, විද්‍යාර්ථීන්ගේ ශ්‍රේණි ලකුණු සාමාන්‍ය සඳහා සිදු කරන බලපෑම පිළිබඳව සොයා බැලීමයි. අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියළුම පීඨ නියෝජනය වන පරිදි සසම්භාවි නියැදියක් මඟින් විද්‍යාර්ථීන් 160 තෝරා ගැනුණ අතර ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් දත්ත ලබා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත වලට අමතරව ද්විතීයික දත්ත යොදා ගැනුණි. ප්‍රශ්නාවලිය මඟින් ප්‍රාථමික දත්ත හා සඟරා, වාර ප්‍රකාශන, පොත්පත් මගින් ද්විතීයික දත්තත් ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේදී හෙලි වූයේ විද්‍යා හා වාණිජ්‍ය පීඨ වල හැර සෙසු පීඨයන් වල විද්‍යාර්ථීන්ගේ පුස්තකාල භාවිතය හා අධ්‍යයන ප්‍රතිඵල අතර ප්‍රමාණවත් ධන සහසම්බන්ධතාවක් නොමැති බව යි. මීට අමතරව විශේෂවේදී විද්‍යාර්ථීන් පුස්තකාලය භාවිත කිරීමට වැඩි නැඹුරුවක් දක්වන බව අනාවරණය විය. පුස්තකාල භාවිතය හා අධ්‍යයන ප්‍රතිඵල අතර ධන සහ සම්බන්ධතාවක් පවතී යන කල්පිතය පිළිගැනීමට හැකි විය.

**මුඛ්‍ය පද ඃ** *පුස්තකාල භාවිතය, විශේෂවේදී විද්‍යාර්ථීන්, අධ්‍යයන ප්‍රතිඵල*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
chathuwijesinghe16@gmail.com

# සය මාසික අධ්‍යාපන ක්‍රමයේ යෝග්‍යයතාවය
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින් කරන ලද පර්යේෂණයකි)

එම්.ඒ. රුෂාන්ති දිල්ෂානි[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියෙහි අධ්‍යාපනික රටාව ශිෂ්‍ය ප්‍රජාවට බලපාන අන්දම සහ එහි ඵලදායිතාව පිළිබඳ මෙම පර්යේෂණය මඟින් විමර්ශනය කර ඇත. මෙම පරීක්ෂණයේ අධ්‍යයන ගැටලුවන්නේ සය මාසික අධ්‍යාපන රටාව යනු කුමක්ද? එය විද්‍යාර්ථීන්ට සිදුකරන බලපෑම කෙබඳුද? යන්නයි. ඵලදායිතාව සහ සය මාසික අධ්‍යාපන රටාවේ යෝග්‍යභාවය කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම අධ්‍යයන අරමුණවේ. අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම විද්‍යාර්ථීන් නියෝජනය වන පරිදි නියැදි ඒකක 100කින් සමන්විතවන සසම්භාවී නියැදියක් යොදාගන්නා ලද අතර ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මඟින් ද ප්‍රාථමික දත්ත ලබාගන්නා ලදී. සය මාසික අධ්‍යාපන ක්‍රමය ශිෂ්‍ය ප්‍රජාව අතර වඩාත් පිළිගත් ක්‍රමයක් වුවත් එය න්‍යායාත්මක වශයෙන් ප්‍රායෝගික නොවන්නක් බව අධ්‍යයනය මඟින් තහවුරුවිය. එසේම විශ්වවිද්‍යාලයට පැමිණීමත් සමඟ විද්‍යාර්ථීන් විෂයයන් තෝරාගැනීම සම්බන්ධ විමසීමේදී බහුතරයක් වෘත්තියාභිමුඛව විෂයයන් තෝරාගැනීමට නැඹුරුවක් දක්වන බවත්, ඔවුන් විශේෂයෙන්ම සය මාසික ක්‍රමයට දැඩි රුචියක් දක්වන බවත් පැහැදිලි විය. නමුත් එම ක්‍රමය විද්‍යාර්ථීන්ගේ දැනුම ගවේෂණය උදෙසා යෝග්‍ය නොවන්නක් බව පැහැදිලි විය. විද්‍යාර්ථීන් දැනුමින් කෙතරම් දුරට ස්වයංපෝෂිතද යන්න විමසා බැලීමේදී බහුතරයක් සිසුන් සිය අධ්‍යයන කාල සීමාව හෙවත් අදාල අර්ධ වාර්ෂිකය තුළ පමණක් ඉගැන්වෙන විෂය කරුණු සම්බන්ධව දැනුමින් යුක්ත වුවද පසුගිය අර්ධ වාර්ෂිකයන්හි අධ්‍යයනය කරන ලද විෂය කරුණු සම්බන්ධව දැක්වූයේ සෘණ ආකල්පයකි. බහුතරයක් එය අවසාන පරීක්ෂණය අරමුණු කරගෙන හැදෑරුවක් පමණක් බවත් දැනුම ගවේෂණය ඔවුන්ගේ පරමාර්ථය නොවන බවත් යොමුකරන ලද ප්‍රශ්නාවලිවලට සපයන ලද පිළිතුරු වලින් හෙළි විය. තවද සංඛ්‍යාත්මක නිගමනයන් තහවුරු කළ හැකි වන පරිදි විද්‍යාර්ථියින්ගේ විෂයානුබද්ධ දැනුම සම්බන්ධව එක් එක් පීඨයන්ට අදාලව යොමු කරන ලද ප්‍රශ්නාවලීන්ට ලද පිළිතුරු අනුව සිසුන්ගේ දැනුම සෘණ මට්ටමක පවතින බව තහවුරු විය. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගන්නා ලද ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් වඩාත් සාර්ථක දත්ත ලබාගැනීමේ හැකියාවක් ලැබුණු අතර පර්යේෂණයේ අවසන් නිගමන ලබා ගැනීමටද එම ක්‍රමයන් වඩාත් යෝග්‍ය විය. ඒ අනුව සය මාසික අධ්‍යාපන ක්‍රමය ශිෂ්‍ය ප්‍රජාවගේ පක්ෂයෙන් ගත් කල සාර්ථක අධ්‍යයන

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
rushanthidilshani@gmail.com

රටාවක් බව පෙනුනද න්‍යායාත්මක වශයෙන් ගත් කල මෙම අධ්‍යයන රටාවේ යෝග්‍යතාව පිළිබඳ ගැටලු මතුවන බව පර්යේෂණය තුළින් පැහැදිලි වේ.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථියා, පර්යේෂණය, සය මාසික, අධ්‍යයන ක්‍රමය*

# ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඇගයීමක්

කේ.ඒ.පී.එන්. කහඳවල[1] ඊ.ඩබ්.ඒ.කේ. සඳමාලි[2]
එල්. ඊශරා කුමාරි[3] ඩබ්.එන්.ඩී.එන්. ප්‍රේමතිලක[4]
කේ.ටී.සී.එම්. රත්නසේකර[5] එම්.කේ. නදීකා දමයන්ති[6]

**සංක්ෂේපය**

සංකීර්ණ සහ අසීමිත මිනිස් අවශ්‍යතා සීමිත සම්පත් තුළින් පරිපූර්ණ කර ගැනීමට උත්සාහ දැරීමේ එක් භයානක ප්‍රතිඵලයක් වන්නේ ලෝකය පුරා ජීවත් වන ජනතාවට විවිධ ආකාරයේ ස්වාභාවික ආපදාවන්ට මුහුණ පෑමට සිදුවීමයි. එවැනි හදිසි ආපදා මනා ලෙස කළමනාකරණය කර ගැනීම සඳහා නූතන මිනිසා විසින් අතීත අත්දැකීම් සමග සසඳා ගොඩ නගන ලද ක්‍රියාකාරකම් නූතනයේ ආපදා කළමනාකරණය ලෙසින් හැඳින්වේ.විවිධ මට්ටමේ ස්වාභාවික ආපදාවන්ට ශ්‍රී ලංකාව නිරන්තරයෙන් මුහුණ පෑම සිදුවේ. 2004 වර්ෂය වන තුරු ශ්‍රී ලංකාවට විධිමත් මට්ටමේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියක් නොවීම නිසා 2004 සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන් නැවත පදිංචි කිරීම හා ඔවුන්ගේ සමාජ, ආර්ථික තත්ත්ව නැවත ගොඩ නැගීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් නොවුණි. නමුත් 2010 වර්ෂයේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමග ආපදාවක් ඇති වූ වහාම රාජ්‍ය යාන්ත්‍රණය මඟින් ඒ සඳහා ප්‍රතිකර්ම යෙදිය යුතු ආකාරයත් සමානාත්මතාවයෙන් හා වගකීම් සහගත අයුරින් ජනතාවට සහන සැලසිය යුතු ආකාරය පිළිබඳවත් විධිමත් වැඩපිළිවෙලක් මෙරට තුළ සකස් විය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන ආකාරයත් සහ එම ප්‍රතිපත්තියේ පවතින දුර්වලතා හඳුනා ගැනීමත්ය. ඒ අනුව ගංවතුර ආපදාවට නිරන්තරයෙන් ගොදුරු වන බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාබිම බටහිර ග්‍රාම නිලධාරී වසම ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ අතර අධ්‍යයන නියැදිය අහඹු ලෙස තෝරාගත් පවුල් 20කින් යුක්ත විය. අධ්‍යයනයේදී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැනිණි. අධ්‍යයනයෙන් අනාවරණය වූ අන්දමට ප්‍රතිචාරීන්ගෙන් 90%ක් එම බිම්වල පදිංචිවීමට ප්‍රථම එම ප්‍රදේශය ගංවතුර අවධානමක් ඇති ප්‍රදේශයක් බව දැනුවත්ව සිට ඇති අතර ගංවතුර හේතුවෙන් ඔවුන්ට කුමන හෝ ආකාරයක හානියක් සිදුව ඇති බවයි. එමෙන්ම ප්‍රතිචාරීන්ගෙන් 95% අනාවරණය කරනු ලැබුවේ ගංවතුර තත්ත්වයෙන් පසු ඇතිවන

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[6] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. damayanthi@kln.ac.lk

සෞඛ්‍ය අවදානම් අවම කරගැනීමට කිසිදු ආයතනයක් හෝ නිලධාරියෙක් තමන්ට සහායක් ලබා නොදුන් බවයි. ආපදා අවස්ථාවකදී රාජ්‍ය අංශය වෙතින් සපයන සේවා සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ගෙන් 55% අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත්ය. ප්‍රදේශයේ ගංවතුර ආපදා තත්ත්වයක් ඇතිවීමට හේතු වන්නේ ඇල මාර්ග ප්‍රතිසංස්කරණය නොකිරීම, පහත් බිම් සහ ඇල මාර්ග ගොඩකිරීමයි. අධ්‍යයනයේ නිගමනය වන්නේ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය අපේක්ෂිත මට්ටමේ සාර්ථක භාවයකින් යුතුව ක්‍රියාත්මක නොවන බවයි.

**මූඛ්‍ය පද ඃ** *ආපදා කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ගංවතුර උවදුර, රාජ්‍ය අංශය, ගම්පහ දිස්ත්‍රික්කය*

# උඩරට එළවළු නිෂ්පාදනයේ උච්චාවචනය කෙරෙහි බලපාන සාධක
## (ලීක්ස් වගාව ආශ්‍රයෙන්)

ආර්.එම්.පී.පී. රාජපක්ෂ[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තීරණය කරන ප්‍රධාන සාධකයක් ලෙස කෘෂිකර්මාන්තය දැක්විය හැකිය. ආර්යයන් ශ්‍රී ලංකාවට පැමිණීමත් සමගම දේශීය යැපුම් කෘෂිකර්මාන්තය මුල් කරගත් ආර්ථික ක්‍රමයක් පැවතුණි. මේ යටතේ වී වගාව මෙන්ම දේශීය එළවළු වගාවද රට තුළ සිදු විය. බ්‍රිතාන්‍යයන් මෙරටට ආක්‍රමණය වීමත් සමගම වැවිලි වගාව මෙන්ම නව එළවළු ප්‍රභේද වගාවද ආරම්භ විය. නව එළවළු වර්ග වගා කිරීම සඳහා සුදුසු දේශගුණයක් උඩරට ප්‍රදේශයේ පමණක් පැවති නිසා මාතලේ, මහනුවර, බදුල්ල හා නුවරඑළිය යන දිස්ත්‍රික්ක වල සීඝ්‍රයෙන් එළවළු වගාව ව්‍යාප්ත විය. ඒ අතුරින් වගාව සඳහා වැඩි වශයෙන් යොදා ගත්තේ නුවරඑළිය ප්‍රදේශයයි. මෙම ප්‍රදේශය තුළ ලීක්ස්, කැරට්, බෝංචි, අර්තාපල්, බීට්රූට්, නෝකෝල්, සලාද, ගෝවා, තක්කාලි, මාළු මිරිස්, රාබු ආදී බෝග රැසක් වගා කිරීම සිදු විය. වර්තමානය වන විට රටට එළවළු සපයන ප්‍රධාන ප්‍රදේශයක් බවට පත්ව ඇත. මෙම කරුණු අනුව පැහැදිලි වන්නේ උඩරට එළවළු නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදනය තුළ ප්‍රධාන තැනක් ගන්නා බවයි. ඒ අනුව එළවළු නිෂ්පාදනය කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය වැදගත්ය. මෙහිදී අධ්‍යයනය සඳහා කාලය හා පිරිවැය සංරෝධකයන්ට යටත්ව ලීක්ස් වගාව පමණක් තෝරා ගන්නා ලදී. සාධක පිළිබඳ විග්‍රහය ප්‍රාථමික දත්ත ආශ්‍රයෙන් සිදු කර ඇත. අස්වැන්න කෙරෙහි සාධකයන්හි බලපෑම සරල ප්‍රතිපායන ආකෘති, බහුගුණ ප්‍රතිපායන ආකෘති, කල්පිත පරීක්ෂා ආදිය ඇසුරෙන් විමසා බලන ලදී. මෙම විග්‍රහයට අනුව පෙනී යන්නේ අස්වැන්න කෙරෙහි වැඩිම දායකත්වයක් සපයන සාධකය භූමිය බවත් පොහොර භාවිතයද සැලකිය යුතු මට්ටමකින් අස්වැන්න වැඩිවීම කෙරෙහි හේතු වන බවත්ය. තවද අස්වැන්න යෙදවුම් මත පමණක්ම තීරණය නොවන බවත් අස්වැන්න කෙරෙහි පාරිසරික විපර්යාසයන්ගේ බලපෑමක් ඇති බවත් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** *කෘෂිකර්මාන්තය, එළවළු නිෂ්පාදනය, ප්‍රතිපායන විශ්ලේෂණය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
ganga01@stu.kln.ac.lk

# ශ්‍රී ලකාවේ ග්‍රාමීය දරිද්‍රතාව පිටු දැකීම සඳහා ස්වයං රැකියා දායකත්වය
## (ඇඹිලිපිටිය ප්‍රදේශය ඇසුරින්)

එස්.ඩී.කේ ශමිෂ්මිලා[1]

**සංක්ෂේපය**

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය දරිද්‍රතාව පිටු දකිමින් ග්‍රාමීය ආර්ථික සංවර්ධනයක් ඇත් කර ගැනීම සඳහා සඳහා අවශ්‍ය කරන මූලික ක්‍රියා මාර්ග කෙරේ වැඩි අවධානයක් යොමු කර තිබේ. ග්‍රාමීය ජනතාව දුප්පත් කමින් පෙළෙනුයේ තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට තරම් ප්‍රමාණවත් ආකාරයේ ආදායමක් ලැබෙන ආදායම් උත්පාදන මාර්ගයක් නොමැතිකමිණි. වර්තමානයේ ස්වයං රැකියා ග්‍රාමීය අංශය තුළ ව්‍යප්තව පවතී. ග්‍රාමීය දරිද්‍රතාව පිටුදැකීම සඳහා ස්වයං රැකියා මගින් ලැබෙන දායකත්වය පිළිබඳව සිදු කරන ලද මෙය අධ්‍යයනය මගින් අපේක්ෂා කරනු ලැබුවේ ග්‍රාමීය දරිද්‍රතාවය පිටු දැකීම සඳහා ස්වයං රැකියා මගින් දායකත්වයක් ලැබේද යන්න හඳුනා ගැනීම අධ්‍යයනය කිරීමත් ස්වයං රුකියා ලාභීන්ගේ පවුලේ සමාජ ආර්ථික තොරතුරු පිළිබඳ අධ්‍යනය කිරීමත්ය. ඒ සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරි වසම් අතරින් පවුල් 50 ක නියදියක් තෝරාගෙන ඇත. අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත මත පදනම් වේ. ප්‍රාථමික දත්ත ප්‍රශ්නාවලියක් භාවිත කරමින් රැස්කළ අතර, ද්විතියික දත්ත මේ සම්බන්ධව ලියැවී ඇති පොත් පත් මගින් හා අනෙකුත් සඟරා ආදියෙන් ලබා ගන්නා ලදි. එකි ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ විග්‍රහ කරන ලදි. අධ්‍යයන ප්‍රථිඵල වලට අනුව පැහැදිලි වන ආකාරයට ස්වයං රැකියාව, ස්වයං රැකියා ලාභීන්ගේ ජීවන තත්වය උසස් තැනකට රුගෙන ඒමට දායකත්වයක් සපයා තිබේ. පවුලේ පැවති ත්ත්වයේ වෙනසක් මේ තුළින් සිදු වී ඇත. ස්වයං රැකියා ලාභී සෑම පවුලක්ම කිසියම් හෝ ආකාරයක වර්ධනයක් මේ හරහා ලබා ඇත. ග්‍රාමීය ප්‍රදේශය තුළ ව්‍යප්තව ඇති ස්වයං රැකියා ප්‍රමාණය වසරින් වසර ඉහළ යන බව සමීක්ෂණ තොරතුරු ඇසුරින් අණාවරණය කරගත හැකි විය. රැකියා ප්‍රමාණයේ වර්ධනය තුළින් ඔවුන්ගේ පවුලේ ආර්ථික තත්වය ඉහළ යාමක් සිදුවන අතර ඒ හේතු කරගෙන ග්‍රාමීය දරිද්‍රතාවයද අවම කර ගැනීමේ මාර්ගයක් බවට ස්වයං රැකියාව පත් කර ගත හැකි බව අවබෝධ කර ගත හැකිය.

**මුඛ්‍ය පද :** *ග්‍රාමීය දරිද්‍රතාව, ග්‍රාමීය ආර්ථික සංවර්ධනයක්, ස්වයං රැකියා, සමාජ ආර්ථික තොරතුරු, ජීවන තත්වය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය
shamishmila@gmail.com

# මිනිස් චර්යාව කෙරෙහි රූපවාහිනිය මඟින් ඇති කරන බලපෑම
## (ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින්)

එච්.කේ. ඒකනායක[1]

**සංක්ෂේපය**

මිනිස් චර්යාව කෙරෙහි බලපාන මූලික සාධකය වනුයේ ජීවත් වන පරිසරයයි. අතීතයේ සරල ආර්ථික රටාවක් තුල මානව ක්‍රියාකාරකම්, මානව සබඳතා, අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත්ව බැඳී පැවතියද නූතන ආර්ථික රටාව හමුවේ පවුලක් තුල වුවද අන්‍යෝන්‍ය බැඳීම් සුහදශීලීත්වය ගිලිහීයමින් දුර්වල වෙමින් පවතී. මෙය පුද්ගලයාගේ ජීවන චක්‍රයේ ළදරු අවධියේ සිට මහලු අවධිය තෙක් පෞරුෂත්වය සංවර්ධනයට මූලිකවම බලපාන කරුණකි. වර්තමානයේ අප භාවිතා කරන පොදුවූත් සුලබවූත් සන්නිවේදන මාධ්‍යය වනුයේ රූපවාහිනිය යි. ලෝකය කෙතරම් සන්නිවේදන තාක්ෂණිකත්වයෙන් ඉහළ ගියද රූපවාහිනියට මිනිසා ඇබ්බැහි වී ඇති ආකාරය අධ්‍යයනය කළ යුතුම වන්නේ එමඟින් මිනිස් චර්යාවට කරන බලපෑම හේතුවෙනි. මෙම අධ්‍යයනය මඟින් නූතනයේදී පුද්ගල චර්යාව කෙරෙහි පොදු සන්නිවේදන මාධ්‍යයක් වූ රූපවාහිනිය මඟින් ඇති කරන බලපෑම කෙබඳු ද යන්න අධ්‍යයනය කර ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ රූපවාහිනිය නැරඹීමේ හිතකර හා අහිතකර තත්ත්වයන් ප්‍රමාණාත්මකව හඳුනාගැනීමයි. අධ්‍යයනය සඳහා නියැදිය ලෙස තෝරා ගනු ලැබුවේ සෑම ජන පන්තියක්ම නියෝජනය කරන සංවර්ධනය වූත්, අර්ධ නාගරික වූත් ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන සසම්භාවී පවුල් 100 කි. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමයත්, සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් යොදා ගැනුණු අතර සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම මඟින් දත්ත විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයනය මඟින් අනාවරණය වූයේ වැඩිහිටි පුද්ගලයින්ට සාපේක්ෂව ළමයින් රූපවාහිනිය නරඹන කාලය සතියකට පැය 28 ක් වූ ඉහල අගයක් ගන්නා බවත්, වැඩිහිටියන්ට සාපේක්ෂව ළමයින් අක්ෂි රෝග, හිසරදය ආශ්‍රිත රෝගවලට ගොදුරුවී ඇති බවත් වෙළෙඳ දැන්වීම් හරහා වයස් භේදයකින් තොරව ක්ෂණික ආහාරවලට යොමුවීමේ රුචිය 50% ක් පමණ රූපවාහිනිය නිසා වැඩිවී ඇති බවත් ය. විදේශ නාට්‍ය නැරඹීම හරහා අනුකාරකවාදී සංස්කෘතියකට ( ආහාර රටා, විලාසිතාවන්) 40% ක් පමණ නැඹුරු වී ඇත. මේ අනුව සමස්තයක් ලෙස රූපවාහිනිය මිනිස් චර්යාව වෙනස් කිරීම කෙරෙහි 25%-50% අතර ප්‍රමාණයකට දායක වී ඇති අතර වයස අවුරුදු 12-16 අතර වයස් කාණ්ඩය නියෝජනය කරන පිරිසෙහි ආහාර රටාව, හැසිරීම, විලාසිතා ආදිය අනෙක් වයස් කාණ්ඩ වලට සාපේක්ෂව රූපවාහිනිය නිසා වෙනස් වී තිබේ.

**මුඛ්‍ය පද :** *පවුල, රූපවාහිනිය, වැඩිහිටියා, ළමයා, පුද්ගල චර්යාව*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
hke93816@gmail.com

# සමෘද්ධි සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු
## (කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්)

අයි. පී.ඩී.ඩී.සී. ගුණදාස[1] ඩබ්.පී.ටී. වීරසේකර[2]
ආර්.පී.එස්.ඒ. රණසිංහ[3] ඩී.එන්.එස්.එන් ගුණවර්ධන[4]
ආර්.පී.එම්.ටී ජයරත්න[5] ඩබ්.කේ.ඒ.පී කුමාරි[6]
එම්.කේ. නදීකා දමයන්ති[7]

**සංක්ෂේපය**

දරිද්‍රතාව තුරන් කිරීම සහ දුප්පත් ජනතාව සවිබල ගැන්වීම සඳහා වන රජයේ ව්‍යපෘති අතර සුවිශේෂී වැදගත්කමක් සහිත වැඩසටහනක් ලෙසට සමෘද්ධි ව්‍යාපාරය හැඳින්විය හැකිය. දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 316ක සාමාජික පවුල් 1,479,811ක් ආවරණය ක්‍රියාත්මක වේ. සමෘද්ධි ප්‍රතිපත්තිය ක්‍රියාක්මක වීමේදී ප්‍රතිලාභීන්ගෙන් සහ නිළධාරීන්ගෙන් විවිධ ආකාරයේ ආකල්ප සහ මතිමතාන්තර ඉදිරිපත් වීඇති බව පූර්ව අධ්‍යයන හරහා අනාවරණය කරගත හැකිවිය. ඒ අනුව මෙම අධ්‍යයනයට පාදක වූ මූලික කාරණය ලෙසට සමෘද්ධි ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ප්‍රතිලාභීන්ගේ ආකල්ප විමසුමට ලක් කිරීම, සමෘද්ධි ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදීපැන නගින ගැටලු කවරේද? යන්න හඳුනාගැනීම සහ ඒවා අවම කිරීම උදෙසා ගතහැකි විසඳුම් මොනවාද? යන්න පිළිබඳව විමසුමට ලක් කිරීමයි.සමෘද්ධි ප්‍රතිපත්තිය පුළුල් ලෙස ව්‍යාප්ත වූ ප්‍රදේශයක් ලෙසට වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය හැඳින්විය හැකිය. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි අදාළ නියැදිය තෝරාගෙන තිබේ. නියැදිය සඳහා සමෘද්ධි සහනාධාරලාභීන් 60ක් අහඹු ලෙස තෝරා ගෙන ඇති අතර අදාළ දත්ත ප්‍රශ්නාවලි මෙන්ම මූලික තොරතුරු සපයන්නන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා හරහාද ලබාගෙන තිබේ. මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ අන්දමට ප්‍රතිලාභීන්ගෙන් 2%ක් රුපියල් 500ට වඩා අඩු මාසික ආදායමක් සහිත පවුල්වල සාමාජිකයින් වන අතර 98%ක ආදායම රුපියල් 5000ට වඩා වැඩිය. සමෘද්ධි ව්‍යාපාරය සම්බන්ධයෙන් වන ප්‍රධාන දුර්වලතාවක් ලෙස ඉහළ ආදායම් ලබන පවුල්වලට සමෘද්ධි ප්‍රතිලාභ ලබාදීම හඳුනාගත හැක. අනෙක් අතට බිම් මට්ටමේ නිළධාරීන්ගේ ක්‍රියාකළාප හේතුකරගෙන බොහෝදුරට සහනාධාර ලැබිය යුතු පවුල් විශාල සංඛ්‍යාවකට ඒවා අහිමි වී ඇතිබවද අනාවරණය

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[6] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[7] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. damayanthi@kln.ac.lk

විය. ප්‍රතිචාරීන්ගෙන් 18% කර්මාන්ත ණය ද, 17%ක් කෘෂි සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිලාභ ද, 7% පානීය ජල පහසුකම් ද, 5%ක් අවමංගල්‍යාධාර ද, 5%ක් දිරිය පියස ණය ද, 7%ක් සමෘද්ධි ශිෂ්‍යත්ව ද ආදී වශයෙන් ප්‍රතිලාභ ලබා ඇත. මේ අනුව අඩු ආදායම්ලාභී පවුල්වලට මෙම ව්‍යාපෘතිය තුළින් විශේෂ සහන සැලසෙන බව හෙළිවේ. සමෘද්ධි වැඩසටහනෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ප්‍රතිචාරීන්ගෙන් 37% ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් මට්ටමේ පසු වුව ද , 34% අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් මට්ටමේ පසුවූහ. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී දුර්වලතාවලට විසඳුම් ලෙස නිළධාරීන් පුහුණුකිරීමේ නිසි ක්‍රමවේදයක් ඇතිකළයුතු අතර ණය ලබාගැනීමේ පහසුකම් පුළුල් කිරීම සිදු කළ යුතුවේ.

**මුඛ්‍ය පද ඃ** *සමෘද්ධි වැඩසටහන, දුප්පත්කම තුරන් කිරීම, දුප්පතුන් සවිබල ගැන්වීම, රාජ්‍ය ප්‍රතිපත්ති*

# පාසල් සිසුන්ගේ ජංගම දූරකථන භාවිතය.
## (කොළඹ දිස්ත්‍රික්කයේ ලුම්බිණි මිශ්‍ර පාසල ඇසුරින් සිදු කරනලද පර්යේෂණයකි)

යූ.කේ.ඩී. ශාන්ති[1]

**සංක්ෂේපය**

වර්තමානයේ විද්‍යාව හා තාක්ෂණවේදයේ දියුණුවත් සමග සමාජයේ බහුල වශයෙන් නවීන උපකරණ භාවිතයට නැඹුරුවක් දක්වන බව පෙනී යයි. ඒ අතර ජංගම දූරකථන සඳහා සුවිශේෂී තැනක් හිමි වේ. වර්තමානයේ බහුතරයක් ජංගම දූරකථන මඟින් තම කාර්යයන් පහසු කර ගනී. එසේ වුවද පාසල් සිසුන් ජංගම දූරකථන භාවිතයට යොමු වීම විවිධ ගැටලු ඇති කිරීමට සමත් වී තිබේ. ඒ අනුව පාසල් සිසුන්ගේ ජංගම දූරකථන භාවිතය මඟින් ගැටලු මතුවන්නේ කෙසේද හා ඒ සඳහා බලපාන හේතු සාධක විමර්ශනය මත මෙම අධ්‍යයනයේ ගැටළුව හා අරමුණ පදනම් වී ඇත. අධ්‍යයනය සඳහා කොළඹ ප්‍රදේශයේ පාසලක් වන ලුම්බිණි විද්‍යාලයේ 6 සිට 13 ශ්‍රේණි නියෝජනය වන පරිදි 100 දෙනෙකු නියැදිය ලෙස ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදි. අධ්‍යයනය මඟින් ප්‍රත්‍යක්ෂ කරගන්නා ලද කරුණු අනුව සමස්ත නියැදියෙන් 75% කට ජංගම දූරකථන තිබුණු අතර ඉන් 50% ක් පිරිමි ළමුන් වූ අතර 25% ක් ගැහැණු ළමුන් විය. සිසුන්ගෙන් ලබා ගන්නා ලද තොරතුරු අනුව බහුතරයක් ජංගම දූරකථනය භාවිතා කළේ මුහුණු පොත (Facebook) භාවිතයට, අන්තර්ජාල භාවිතයට, හා වෙනත් යම් යම් කටයුතු උදෙසා වු අතර හදිසි අවස්ථාවන් හා දෙමාපියන් සමග සම්බන්ධ වීම උදෙසා දූරකථන භාවිතා කල පිරිස අල්ප විය. තව ද නියැදියෙන් 28% පිරිසක් දූරකථන භාවිතා කලේ රහසිගතව බව අනාවරණය විය. එසේම පාසල තුල ජංගම දූරකථන තබා ගැනීම තහනම් වීම පිළිබඳව ඔවුන් විරුද්ධ ආකල්පයක් දැරූ අතර ජංගම දූරකථනය අද වන විට නැතිව ම බැරි උපකරණයක් බව ඔවුන්ගේ ආකල්ප වලින් ප්‍රත්‍යක්ෂ විය. අධ්‍යයනයට අනුව පිරිමි ළමුන් වැඩි වශයෙන් ජංගම දුරකථන භාවිත කළ අතර ඒ පිළිබඳ ඔවුන්ගේ නිවෙස් දැනුවත්ව නොතිබිණි. 6 සිට 11 ශ්‍රේණිවල ගැහැණු ළමුන්ගෙන් බහුතරයකට ජංගම දූරකථන නොමැති අතර ඊට සාපේක්ෂව 12 සිට 13 ශ්‍රේණි ශිෂ්‍යාවන් සතුව ජංගම දූරකථන පවත්නා බව අනාවරණය විය. මෙම කරුණු අනුව පාසල් සිසුන් බොහොමයක් එය භාවිතා කලේ සමාජ වෙබ් ජාලා හා සම්බන්ධ වීමට බව පර්යේෂණයෙන් ප්‍රත්‍යක්ෂ විය.

**මුඛ්‍ය පද :** *පාසල් සිසුන්, ජංගම දූරකථන*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
divangika214@gmail.com

# විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ බාහිර ක්‍රියාකාරකම් සඳහා සහභාගීත්වය

ඩබ්.එච්. ශානිකා ප්‍රියදර්ශනී[1]

**සංක්ෂේපය**

පුද්ගල පරිපූර්ණත්වයට අත්‍යවශ්‍යය වන්නා වූ දැනුම කුසලතා ආකල්පවලින් සපිරුණු මිනිසෙක් බිහිකිරීම විශ්වවිද්‍යාලයක ප්‍රධාන කාර්යභාර්යයි. එහිදී බාහිර ක්‍රියාකාරකම් වැදගත් වන අතර විද්‍යාර්ථීන් ලෙස බාහිර ක්‍රියාකාරකම්වලට සහභාගී වීම පිළිබඳ විවිධ විවේචන තිබේ. දැනුම ගවේෂණය සඳහා බාහිර ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වුවද බහුතර සිසුන් ඒ සඳහා යොමුවීමට රුචිකත්වයක් නොදක්වයි. ඒ අනුව විශ්වවිද්‍යාල සිසුන් බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමු නොවන්නේ ඇයිද යන්න අධ්‍යයන ගැටලුව වී ඇත. ඒ සඳහා බලපා ඇති සාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ මූඛ්‍ය අරමුණයි. අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා, වාණිජ, කලා යන පීඨවලින් ස්ථරායන නියැදීමෙන් තෝරාගත් 20 ක නියැදියක් සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් දත්ත රැස්කිරීම සිදුකළ අතර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ලෙස පවතින ක්‍රියාකාරකම් කිහිපයක් පමණක් වෙත මෙහිදී අවධානය යොමුකරන ලදී. මෙම පර්යේෂණ ක්‍රියාවලිය තුළ ඉස්මතු වූ කරුණක් වන්නේ පාසල් අධ්‍යාපනය ලබන කාලය තුළ බොහෝ විද්‍යාර්ථීන් විවිධ බාහිර ක්‍රියාකාරකම්වලට සහභාගී වුවද විශ්වවිද්‍යාල අධ්‍යාපනයට පිවිසීමත් සමඟම ක්‍රියාකාරකම් නතර වී ඇති බවයි. එයට හේතු ලෙස ඉදිරිපත් වූයේ දේශන වාර ගණන වැඩිවීමත් පැවරුම් ආදී කටයුතු සමග බාහිර ක්‍රියාකරකම් සඳහා සහභාගී වීමට කාලය කලමනාකරණය කර ගැනීමට පවතින අපහසුතාවයයි. නමුත් බාහිර ක්‍රියාකාරකම් සඳහා සහභාගී වන අතලොස්සක් විද්‍යාර්ථීන්ට අනුව ඔවුන් කාලය මනා ලෙස කලමනාකරණය කරගෙන ඇති අතර ඔවුන්ගේ අධ්‍යාපනයටද ඉන් කිසිදු බලපෑමක් වී නොමැති බවත් අනාවරණය විය. මේ අනුව කාල කලමනාකරණය කරනොගැනීම හේතුවෙන් බොහෝ විද්‍යාර්ථීන්ගේ බාහිර ක්‍රියාකරකම් අවස්ථා මඟ හැරීයන බවට මෙම පර්යේෂණය තුළින් නිගමනය කළ හැකි අතර පරිපූර්ණ පුද්ගලයෙක් ලෙස මහා සමාජයට පිවිසීමට නම් කාලය මැනවින් සංවිධානය කර මඟහැරී යන අවස්ථා ලබා ගත යුතු බව දැක්විය හැකිය.

**මූඛ්‍ය පද :** *විද්‍යාර්ථීන්, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, සහභාගිත්වය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
shanikapriyadarshaniwalpola@gmail.com

# නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාවේ විකාශය පිළිබඳ අධ්‍යයනයක්

කේ.පී.කේ දුලනි කහටපිටිය[1] ඩී.එස්. කොඩිතුවක්කු [2]
එම්.එන්. ජයවර්ධන[3] කේ.එම්.ආර්.ආර්. මුහන්දිරම්ගේ[4]
කසුන් ගුණවර්ධන[5]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව 1505 සිට බටහිර අධිරාජ්‍යවාදීන් යටතේ 1948 දක්වා වසර 443 ක කාලයක් යටත් විජිතයක්ව පැවතීම නිසා අභිමානවත් දේශීය සංස්කෘතිය සහ අධ්‍යාපනය යටපත් විය. නිර්මාණාත්මක හා සංකල්පන ප්‍රගතිය යටපත් වී අනුකාරක ගැති පරායත්ත මානසිකත්වයක් ගොඩනැගුනේය. බ්‍රිතාන්‍ය ලන්දේසි හා පෘතුගීසි අධ්‍යාපනඥයින්ගේ උපදෙස් අනුව මෙරට ජාතීන් සතුව තිබූ අභිමානය යටපත් කෙරුණි . එසේම බටහිර ජාතීන්ගේ ආගමනයෙන් පසුව ඔවුන්ගේ අවශ්‍යතා හා ඕනෑඑපාකම්වලට අනුකූලව රටේ ආර්ථික ක්‍රමය හා අධ්‍යාපන ක්‍රමය හැඩගැස්වීම නිසා වාණිජ ආර්ථිකයක් මත පදනම් වූ සමාජ ක්‍රමයක මුදලින් වටිනාකම තක්සේරු කිරීමටත් බටහිර සමාජ සාරධර්ම උකහා ගැනීමටත් හුරුපුරුදු විය. එනිසාම නිදහස ලැබීමෙන් පසු වුවද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාවේ විකාශනය සහ එහි ගුණාත්මකභාවය පිළිබඳ විවිධ විවේචන තිබේ. නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාව ගුණාත්මක ලෙස විකාශනය වී තිබේද යන්න අධ්‍යයන ගැටළුව කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත භාවිත කර ඇති අතර ප්‍රවණතා විශ්ලේෂණය මගින් දත්ත විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනය මගින් තහවුරු වූයේ වර්තමාන අධ්‍යාපන රටාව පැරණි අධ්‍යාපන රටාවෙන් සම්පූර්ණයෙන්ම වෙනස් නොවුවද රැකියාභිමුඛ පාඨමාලා සඳහා වැඩි ඉල්ලුමක් ඇති බැවිනි. එහෙත් අධ්‍යාපනය හා සේවා නියුක්තිය අතර සබඳතාවය ප්‍රමාණවත් නොවන බැව් තහවුරු විය. ඒ අනුව වෘත්තීයාභිමුඛ අධ්‍යාපන රටාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බැව් නිගමනය කළ හැකිය.

**මූඛ්‍ය පද :** *නිදහස් අධ්‍යාපනය, අධ්‍යාපන රටාව, ආර්ථිකය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, kinsi.gt@gmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, dilukodi@gmail.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, ktmnj@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, rashiravihari@gmail.com
[5] කළමනාකාරණවේදී (විශේෂ) අලෙවිකරණය, කොළඹ විශ්වවිද්‍යාලය, kasunugw@gmail.com

# අ.පො.ස (සා.පෙළ) සිසුන් දහම් පාසල් අධ්‍යාපනය ලැබීමේ ප්‍රවණතාවය

එම්.ඩී.එම්. උබේසේන[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින්නේ පාසල කේන්ද්‍රස්ථානය කරගත් අධ්‍යාපන ක්‍රමයකි. අතීතයේ පැවතියේ පන්සල මුල්කර ගත් අධ්‍යාපන ක්‍රමයකි. මහින්දාගමනයත් සමඟ බුදු දහම හා බැඳි අධ්‍යාපන රටාව ආරම්භ විය. බටහිර ජාතීන්ගේ ආගමනයත් සමඟ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය පාසල බවට පත් විය. පන්සලට දෙවැනි ස්ථානය හිමි විය. ශ්‍රී ලංකාවේ පාසල් සතියට දින 05ක් පැවැත්වේ. පන්සල මුල් කර ගත් දහම් පාසල් අධ්‍යාපනය ලබා දෙන්නේ ඉරිදාය. දහම් පාසල තුලින් සිසුන්ට අවශ්‍ය ගුණ දහම් මෙන්ම බුදු දහම පිළිබඳව දැනුම ලබා දේ. පාසලේ මෙන් ම දහම් පාසලේ ද 11 ඉහළ ශ්‍රේණි දක්වා පංති පැවැත්වේ. පාසල්වල 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා බහුතර සිසුන් ප්‍රමාණයක් සිටිනු ලැබේ. දහම් පාසල්වල ප්‍රාථමික අංශයේ බහුතර සිසුන් ප්‍රමාණයක් දක්නට ලැබෙන නමුත් ඉහළ ශ්‍රේණිවල සිසුන් ඇත්තේ අඩු ප්‍රමාණයකි. වර්තමානය වන විට දහම් පාසල්වල 10, 11 ශ්‍රේණිවල සිසුන් අඩු වීම ගැටලුවක් බවට පත්ව තිබේ. අ.පො.ස (සා.පෙළ) සිසුන් දහම් පාසල් අධ්‍යාපනය ලැබීමේ අඩු ප්‍රවණතාවයට බලපාන සාධක සොයා බැලීම පර්යේෂණ අරමුණ කරගනිමින් රුවන්වැල්ල අධ්‍යාපන කොට්ඨාශයේ කෑ/ දෙහි/ ඉඹුලාන මහා විද්‍යාලය, රුවන්වැල්ල මධ්‍ය විද්‍යාලය, නිවුන්හැල්ල කනිටු විද්‍යාල වලින් 10, 11 ශ්‍රේණිවල සිසුන් අතරින් සිසුන් 100ක නියැදියක් ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය යොදා ගනිමින් සමීක්ෂණයට භාජනය කරන ලදී . ව්‍යූහගත ප්‍රශ්නාවලියක් මඟින් රැස්කර ගන්නා ලද ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත මඟින් ලබා ගන්නා ලද දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම මඟින් විශ්ලේෂණය කරන ලදි. මෙම අධ්‍යයනයේ දී දහම් පාසල් වලට සහභාගී වන සිසුන් ප්‍රමාණය 30% ක් බවත්, සහභාගී නොවන සිසුන් ප්‍රමාණය 70% බවත් හේතු විය. සහභාගී නොවන සිසුන්ගෙන් 90% ක් දහම් පාසල් නොයෑමට ප්‍රධාන හේතුව ලෙස, ඉරිදා දින පෞද්ගලික උපකාරක පන්ති සඳහා සහභාගී වීම දැක්විය හැකිය. වෙනත් හේතූන් ලෙස අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල මත අ.පො.ස (උ.පෙළ) විෂය ධාරාව තෝරා ගැනීම සිදු කිරීම, අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී විෂයයන් 09කට පිළිතුරු සැපයීම ආදිය දැක්විය හැකිය. මේ හේතු නිසා 11 ශ්‍රේණිවල සිසුන් දහම් පාසල් අධ්‍යාපන ලැබීමේ ප්‍රවණතාව අඩුවී ඇති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *අ.පො.ස(සා.පෙළ), දහම් පාසල් අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනය*

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
madusanka57ubesena@gmail.com

# ශ්‍රී ලංකාවේ සරසවි සිසුන් සඳහා පැවැත්වූ නායකත්ව පුහුණු වැඩසටහන පිළිබඳ ඇගයුමක්

## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ඒ.එම්. පූර්ණිමා දිල්හාරි[1] පී.ඒ. දිල්රුක්ෂි[2]
ආර්.ඒ. මානෙල් ගීතානි [3] එම්.එල්.එච්. ඉමල්කා[4]
ආර්.එම්.සී. කුමාරි[5] ඩී.එන්. මධුවන්ති[6]
එම්.කේ. නදීකා දමයන්ති[7]

**සංක්ෂේපය**

මෙරට උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී එය වඩාත් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා රජය විසින් වරින්වර විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි. පසුගිය රජය විසින් 2011 වර්ෂයේ සිට විශ්වවිද්‍යාල සිසුන්ගේ නායකත්ව හැකියාව හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් නායකත්ව පුහුණු වැඩසටහනක් හඳුන්වා දී තිබුණි. නමුත් එම වැඩසටහන වර්තමානය වනවිට අසාර්ථකව තිබේ. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ නායකත්ව පුහුණුව හා පෞරුෂ වර්ධනය කිරීම උදෙසා හඳුන්වා දුන් නායකත්ව පුහුණු වැඩසටහන තුළින් අපේක්ෂා කළ ප්‍රතිඵල ලැබුණේද? සහ වැඩසටහන සම්බන්ධයෙන් සිසුන්ගේ තෘප්තිමත්භාවය කවර මට්ටමක පවතීද? යන්න අධ්‍යයනය කිරීමයි. අධ්‍යයනය ප්‍රාථමික සහ ද්විතීයික දත්ත මත පදනම් වූ අතර ප්‍රාථමික දත්ත රැස්කරනු ලැබුවේ ප්‍රශ්නාවලියක් පාදක කරගනිමිනි. අධ්‍යයනයේ නියැදිය වශයෙන් නායකත්ව පුහුණු වැඩසටහනට සම්බන්ධ වූ කැලණිය විශ්වවිද්‍යාලයේ තෙවන හා සිව්වන වසර සිසුන් හා සිසුවියන් 60 දෙනෙකු අහඹු ලෙස තෝරා ගැණිනි. රැස්කරගත් ප්‍රමාණාත්මක තොරතුරු සරල සංඛ්‍යානමය විධික්‍රම ඔස්සේ ද ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද විශ්ලේෂණය කෙරිණි. මෙම වැඩසටහනට සම්බන්ධ වූ සිසුන් ප්‍රමාණය විශාල සංඛ්‍යාවක් වුවත් අධ්‍යයනය සඳහා වැයවන කාලය, ශ්‍රමය සහ මූල්‍ය අපහසුතා හේතුවෙන් අධ්‍යයන නියැදිය 60 සීමා වූ අතර රාජ්‍ය විශ්වවිද්‍යාල අතුරින් කැලණිය විශ්වවිද්‍යාලය පමණක් තෝරා ගැනීම ද අධ්‍යයනයේ සීමාවක් විය. මෙම නියැදියට ඇතුළත් වූ සිසුහු දියතලාව, ත්‍රිකුණාමලය, මාදුරුඔය,

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය,
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය,
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය,
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය,
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය,
[6] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය,
[7] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

මින්නේරිය, ඇඹිලිපිටිය, අම්පාර සහ ගිරිතලේ යන පුහුණු කඳවුරු 07ට අයත් වූහ. ප්‍රතිචාරීන්ගෙන් 65%ක් නායකත්ව පුහුණුව සම්බන්ධයෙන් තෘප්තිමත් බව පැවසූ අතර තෙවන වසර සිසුන්ගෙන් 73% ද සිව්වන වසර සිසුන්ගෙන් 53% ද එයට අයත් වූහ. අතෘප්තිමත් වූ සිසුන්ට ඒ සඳහා බලපානු ලැබූ සාධක වුයේ ජල පහසුකම් ආදී පහසුකම් ප්‍රමාණවත් නොවීම (60%), දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ ගැටලු (56%), ආරක්ෂාව පිළිබඳ ගැටලු (30%) සහ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පැවති ගැටලු (22%) ය. තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වීමට පුහුණුව බලපෑ බව 70% ද, පිරිසක් මෙහෙයවීමට සහ කණ්ඩායම් හැඟීම වර්ධනයට හේතු වූ බව 50% ද, තනතුරු දැරීමේ හැකියාව වර්ධනය වූ බව 13% ද අනාවරණය විය.

**මුඛ්‍ය පද ඃ** *නායකත්ව පුහුණුව, උසස් අධ්‍යාපනය, කැලණිය විශ්වවිද්‍යාලය, සරසවි සිසුන්*

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සහ අර්ධකාලීන රැකියා.

එස්.ඒ.ඩී.එම්.ඩී.ඒ. විජේසිංහ[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ විද්‍යාර්ථීන් අර්ධකාලීන රැකියා සඳහා යොමුවීම විශ්වවිද්‍යාල අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා ගැටලුවක් වේද යන්න මෙම අධ්‍යයනය මගින් විමර්ශනය කර ඇත. කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ නියෝජනය වන පරිදි 2015 වර්ෂයේ අධ්‍යාපනය ලබන සිසුන් 100ක් සරල සසම්භාවී නියැදියක් මෙම අධ්‍යනය සඳහා යොදා ගන්නා ලදී. මෙමගින් ලබාගත් දත්ත කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් සහ ප්‍රතිශතාත්මක මිනුම් ඇසුරින් විශ්ලේෂණය කරන ලදී. අර්ධකාලීන රැකියා නිසා විද්‍යාර්ථීන්ගේ ආර්ථිකය යහපත් වුවද අධ්‍යාපනයට බාධා පමුණුවයි යන්න උපන්‍යාසය වූ අතර අර්ධකාලීන රැකියාවේ ස්වාභාවය, අධ්‍යාපනය සඳහා බලපාන ආකාරය, අනාගත රැකියා සඳහා ලැබෙන ප්‍රයෝජන, අර්ධකාලීන රැකියාවෙන් උපයන ආදායම ප්‍රමාණවත් ද සහ ශ්‍රී ලංකාව තුළ ඇති ආකල්පය යන ප්‍රධාන සාධක ඔස්සේ දත්ත විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනයට අනුව 56% ක පමණ ප්‍රමාණයක් තම රැකියාව අධ්‍යාපනයට බලපාන බවත් 68% ක ප්‍රමාණයක් තමන් නිරත වන රැකියාව අනාගතයට ප්‍රයෝජනවත් නොවන බවත් පවසයි. අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාව තුළ ශිෂ්‍යයින්ට පාසල් අධ්‍යාපනය අවසන් වනතුරු ආර්ථික ගැටලු ඇති නොවන නමුත් උසස් අධ්‍යාපන කාලය තුළ ආර්ථික ගැටලු රැසක් ඇති බව හෙළි විය. ප්‍රායෝගික අධ්‍යයනය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කිසිඳු ආයතනයකින් අවධානය යොමු නොකරන බවත් රාජ්‍ය විශ්වවිද්‍යාල හෝ ආයතන විසින් ශිෂ්‍යයාට දැනුම ලබා දුන්න ද ප්‍රායෝගික පුහුණුව ලබාගත හැකි විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත් සනාථ විය. මේ නිසා ශ්‍රී ලංකාවේ විද්‍යාර්ථීන් අක්‍රමවත් හෝ වගකීමකින් තොර අර්ධකාලීන රැකියා සඳහා ද යොමු වන බව හේතු විය. තම ආර්ථික ගැටලු විසඳා ගැනීමට ශිෂ්‍යයින් වැඩි ප්‍රතිශතයක් අවිධිමත් රැකියා සඳහා යොමුවන අතර ඒ තුළ ශිෂ්‍යයින්ගේ ශ්‍රමය සූරාකෑම, අනාරක්ෂිත බව සේම එය තමන් අධ්‍යාපනය ලබන ක්ෂෙත්‍රයට ද රුකුලක් නොවන බව තහවුරු විය. අර්ධකාලීන රැකියා ශිෂ්‍යයින්ට සාධාරණයක් සිදු නොකරන හා අනාගතයට රුකුලක් නොවන නමුත් ශිෂ්‍යයින් එයට යොමුවීම නොවැළැක්විය හැකි බව තහවුරු විය. මේ නිසා ශිෂ්‍යයින්ගේ අධ්‍යයන ක්ෂේත්‍රයට උචිත අර්ධකාලීන රැකියා ලබාදීම තුළින් ශිෂ්‍යයාට මෙන්ම ආර්ථිකයට ද ඵලදායි වන බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථීන්, අර්ධකාලීන රැකියා, ආර්ථිකය, ශිෂ්‍යයින්*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
dilumiasinsana@yahoo.com

# වී ගොවියා මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක්
## (හම්බන්තොට දිස්ත්‍රික්කය ඇසුරින් කරන ලද පර්යේෂණයකි)

ඩබ්.ජී.ආර් රුවන්ති[1]

**සංක්ෂේපය**

වී ගොවිතැන ආරම්භයේ සිට අස්වැන්න විකුණා ගැනීම දක්වා වූ විවිධ අවස්ථාවන් තුළ වී ගොවීන් විවිධ ගැටලුවලට මුහුණපාමින් සිටී. එහි වඩාත් අහිතකර ප්‍රතිඵලය වන්නේ වී ගොවීන් තම ද්‍රව්‍ය වෙනත් කාර්යය සඳහා යෙදවීම හෝ අතහැර දැමීමත් ඔවුන් වී ගොවිතැනින් ඉවත්වීමත්ය. එබැවින් මෙම අධ්‍යයන ගැටළුව වී ගොවීන්, ගොවිතැනින් ඉවත් වීම සඳහා හේතු වූයේ කිනම් සාධකද යන්න මත පදනම් වන අතර එම සාධක වඩාත් විද්‍යානුකූලව විමර්ශනය කිරීම අධ්‍යයන අරමුණ වී තිබේ. වී ගොවියා ගො ගොවිතැනෙන් ඉවත් වීමට සාධාරණ වී මිලක් නොමැති වීම හේතු වේ යන උපකල්පනය මත පදනම් වෙමින් ද මෙම පර්යේෂණය සිදු කර ඇත. 2015 වර්ෂයේ යල කන්නය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ රන්න ග්‍රාමයේ ගොවිමහතුන් 50 දෙනෙකු සසම්භාවී ලෙස තෝරා ගනිමින් ව්‍යුහගත නොවූ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේද බටඅත , අම්බලන්තොට හා නෙටොල්පිය යන ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් 2015 යල කන්නයේ ද්විතීක දත්ත මූලාශ්‍ර ඇසුරින් ද මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙලෙස ලබා ගත් දත්ත ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කළ අතර අධ්‍යයන ප්‍රථිඵලවලට අනුව නියැදියෙන් බහුතරයක් කුඹුරු අක්කර 2-4 අතර හිමි වූවන් බව හෙළි විය. එසේ ම නියැදියෙන් 70%ක ප්‍රතිශතයක් අඳ ගොවියන් විය. යල කන්නයේ අස්වැද්දීම සඳහා අවශ්‍ය මුදල් බැංකු ණය හා පෞද්ගලික ණය දෙන්නන්ගෙන් ලබා ගත් පිරිස 90% ක තරම් වූ බහුතරයකි. වී අස්වැන්න සඳහා ලැබෙන මිල සාධාරණ නොවන බව අදහස් කළ පිරිස නියැදියෙන් 100%ක ප්‍රතිශතයක් වීම ගොඩනඟාගත් උපන්‍යාසය තහවුරු වූ බව විද්‍යමාන කරයි. ඉහත ගැටලුවට හේතුව කෘෂි රසායන හා පොහොර මිල ඉතා ඉහළ අගයක පැවතීමත්, ගොවිජන මධ්‍යස්ථාන වලින් වී මිල දී නොගන්නා විට පෞද්ගලික ගැනුම්කරුවන්ට ඉතා අඩු මිලකට වී ලබා දීමට සිදු වීමත් ය යන පිළිතුරු නියැදියේ බහුතරයකගේ මතය විය. එසේ ම නෙටොල්පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබා ගත් ද්විතීයික මූලාශ්‍ර ඇසුරින් යල කන්නයේ නෙලූ අස්වනු ප්‍රමාණයට වඩා අඩු අස්වනු ප්‍රමාණයක් එම මධ්‍යස්ථානය මඟින් මිල දී ගෙන ඇති බව අනාවරණය විය. ඒ අනුව වී අස්වනු සඳහා සාධාරණ මිලක් නොගෙවනතාක් ණය පියවා ගැනීම හෝ කිසිදු ආර්ථික වාසියක් ලබාගත නොහැකි වීම ගොවියන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු බවට හඳුනාගත හැකි විය. ඉහතින් දැක් වූ ප්‍රතිඵල මත පදනම් වීමේ දී විවිධ විෂමතාවයන් නිසා වී අස්වැන්නට සාධාරණ මිලක් නොලැබෙන බව පැහැදිලි වේ. අස්වැද්දීමේ සිට

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
wgramesharuwanthi@gmail.com

අස්වනු නෙළීම තෙක් වෙහෙසකර වූ ක්‍රියාදාමයක මූලික කොටස්කරුවන් වන ගොවිජනතාවට සාධාරණ වී මිලක් ලබා දීම සේම ණය පහසුකම් ලබා දීම තුළින් ද, වී ගොවිතැන ආරක්ෂා කිරීමට හැකිවනු ඇති බැව් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *ගොවිතැන, වී මිල, යල කන්නය*

# ජාතික පොහොර සහනාධාර ප්‍රතිපත්තියෙහි ක්ෂේත්‍ර ගැටලු
## (අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

යූ.එස්.ඩී. අනුරසිරි[1]
බී.ඒ.එන්.පී. බාලසූරිය[2]
ආර්.පී.එච්. මුතුමාලි[3]
අයි.එම්. පේමචන්ද්‍ර[4]
ඩබ්.ඒ.එල්.කේ. ජයසිංහ[5]
එම්.කේ. නදීකා දමයන්ති[6]

**සංක්ෂේපය**

රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය යටතේ මෙරට ගොවි ජනතාවට පොහොර සහනාධාරය වසර ගණනාවක් තිස්සේ ලබාදෙන අතරක්‍රියාත්මකභාවයේදී එහි යම් යම් ගැටලු සහගත තත්ත්වයන්මතුවන බව එදිනෙදා සාකච්ඡා තුළින් පෙනී යයි. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ රාජ්‍ය කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තුළ පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක වීමේ දී ගැටලු උද්ගත වන්නේද ? එසේනම් ඒ මොනවාද? යන්න හඳුනා ගැනීමයි. එහිදී වී වගාව සිදු කරන ප්‍රධානතම දිස්ත්‍රික්කයක් වන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ගලටබැඳිවැව ග්‍රාම නිලධාරී වසම ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැණිනි.  අධ්‍යයන නියැදියට අහඹු ලෙස තෝරාගත් ගොවීන් 50ක් ඇතුළත් වූ අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා හරහා ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැණිනි. එමෙන්ම නිරීක්ෂණ ආශ්‍රිතවද ඇතැම් තොරතුරු ලබා ගන්නා ලදි. ලබාගත් දත්ත සහ තොරතුරු විශ්ලේෂණයේදී සරල සංඛ්‍යානමය විධික්‍රම සහ විස්තරාත්මක ක්‍රමවේදය යොදාගැණිනි. අධ්‍යයනයෙන් හෙළි වූ අන්දමට සහනාධාර ප්‍රතිපත්තිය යටතේ අවශ්‍ය අවස්ථාවට පොහොර ලබාගත හැකි බව ප්‍රතිචාරීන්ගෙන් 72% ද, ලබාගත නොහැකි බව 28% ද ප්‍රකාශ කළහ. ප්‍රතිචාරීන්ගෙන් 60%ක් ලබාදෙන පොහොර ප්‍රමිතියෙන් යුතු බවත්, 40%ක් පොහොර ප්‍රමිතියෙන් තොර බවත් ප්‍රකාශ කළහ. සහනාධාරය සම්බන්ධයෙන් අදහස් දක්වන ප්‍රතිචාරීන්ගෙන් 18%ක් සහන මිලකට පොහොර ලබාගත හැකිවීම, ගොවීන්ට ලාභදායීවීම (12%) මේ සම්බන්ධයෙන් පවතින යහපත් තත්ත්ව වශයෙන් අනාවරණය කෙරිණි. කෙසේ වුවද, අධ්‍යයනය තුළින් අනාවරණය කරගත් අන්දමට පොහොර සහනාධාර වැඩපිළිවෙළෙහි ක්‍රියාත්මක භාවයේදී අවශ්‍ය පොහොර ප්‍රමාණය නොලැබීම, පොහොරවල ගුණාත්මකභාවය සහ ප්‍රවාහනය යනාදී ගැටලු උද්ගත වී ඇත.

**මූඛ්‍ය පද ඃ** *පොහොර සහනාධාරය, රාජ්‍ය ප්‍රතිපත්ති, ගොවීන්, වී වගාව*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[6] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

# වී මිලදී ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තියේ ක්ෂේත්‍ර ගැටලු
## (දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

එච්.ඒ.එස්.එස්. හෙට්ටිආරච්චි[1] ඒ.ඒ.පී. දිසානායක[2]
ඩී.එම්.එම්. නිරෝෂන්[3] එම්.කේ. නදීකා දමයන්ති[4]

**සංක්ෂේපය**

කෘෂි නිෂ්පාදන ක්‍රියාවලියේ යම් යම් කටයුතුවල නිරතව සිටිනගොවීන්, නිෂ්පාදන මිලට ගැනීම සහ අමුද්‍රව්‍ය අලෙවි කටයුතුවල නිරත වන පෞද්ගලික අංශය සේම රාජ්‍ය අංශයේ නිලධාරීනුත්, සහල් සැකසීමේ කර්මාන්තයෙහි නිරතව සිටින පෞද්ගලික අංශයත්විවිධාකාරයේ ගැටලුවලට මුහුණ දෙන බව එදිනෙදා සාකච්ඡාවන්හිදී මෙන්ම මාධ්‍ය තුළින්ද වාර්තා වේ. මෙම ගැටලු විසඳීමේ අරමුණින් රජය විසින් වරින් වර යම් යම් පියවර ගෙන ඇති අතර වී මිලට ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මේ ආකාරයට ගොවි ගැටලු විසඳීමේ අරමුණින් රජය විසින් හඳුන්වා දෙන ලද්දකි. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ වී මිළදී ගැනීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමේදී ගැටලු උද්ගත කරනු ලබන්නේද එසේනම් ඒ මොනවාද යන්න හඳුනා ගැනීමයි. එහිදී වී ගොවිතැන් විශාල වශයෙන් සිදු කරන දිස්ත්‍රික්ක අතුරින් පොළොන්නරු දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ 231 සඳගලතැන්න ග්‍රාම නිලධාරී වසම තෝරා ගැණින. අධ්‍යයන නියැදියට අහඹු ලෙස තෝරා ගත් ගොවීන් 50ක් ඇතුළත් වූ අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැණින. එමෙන්ම ලබා ගත් ඇතැම් තොරතුරු නිරීක්ෂණය මඟින් මෙන්ම මූලික තොරතුරු සපයන්නන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා තුළින් තහවුරු කර ගැණින. නියැදියේ ගොවීන්ගෙන් 90%ක් සම්බා වී වගා කර ඇති අතර පසුගිය යල කන්නයේ අස්වැන්න වශයෙන් ගොවීන්ගෙන් 23%ක් කි.ග්‍රෑ. 1000-1500 අතර ද, 33% කි.ග්‍රෑ 1601-2000 අතර ද 44% කි.ග්‍රෑ. 2001-3000 අතර ද ලබාගෙන ඇත. වී අලෙවියේදී ගොවීන්ගෙන් 20%ක් රාජ්‍ය අංශයට පමණක් ද 67%ක් පෞද්ගලික අංශයට පමණක් ද 13%ක් අංශ දෙකටම ද වී අලෙවි කර ඇත. රාජ්‍ය අංශයේ ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොවීම නිසා මිලට නොගැනීම (26%), වී අලෙවි කිරීමට විශාල කාලයක් ගතවීම (25%), රජය බලාපොරොත්තු වන ප්‍රමිතියට විකිණීමට නොහැකිවීම, සීමිත වී ප්‍රමාණයක් පමණක් මිලට ගැනීම (4%), ප්‍රවාහන ගැටලු (2%) ආදිය රාජ්‍ය අංශයට වී අලෙවියට තිබූ බාධා ලෙස අනාවරණය විය. මෙයට අමතරව පෞද්ගලික අංශය විසින් ගොවීන්ගෙන් වී මිලට ගෙන රාජ්‍ය අංශයට අලෙවි කිරීම ද සිදුවූ බව (7%) අනාවරණය විය.

**මුඛ්‍ය පද ඃ** *වී අලෙවි ප්‍රතිපත්තිය, දිඹුලාගල, ගොවීන්, අලෙවි ගැටලු*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[4] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

# නවක වදය/නම්නීකරණ වැඩසටහන් හේතුවෙන් අධ්‍යාපනයට සිදුවන බලපෑම

ඩී.එස්. කොඩිතුවක්කු[1] කේ.පී.කේ. දූලනි[2]
එම්.එන්. ජයවර්ධන[3] කේ.එම්.ආර්.ආර්. මුහන්දිරම්ගේ[4]
ජී.එච්.එච්.එස්. මධුවන්ති[5]

**සංක්ෂේපය**

ක්‍රි.ව. 6 සහ 7 වන සියවස් වලදී ආරම්භ වූ නවක වදය ග්‍රීක සමාජයේ ක්‍රීඩා සංගම් මුල්කොට ගනිමින් ආරම්භ වූවක් ලෙස සැලකෙන අතර මෙම වකවානුවේ දී එකී සංගම් වලට පැමිණෙන නවකයින් අතර කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව මෙය ක්‍රියාත්මක විය. කාලයත් සමඟ ඇති වූ විවිධ නවීකරණයනගෙන් පසුව යුධ කඳවුරු තුළ නවක වදය බහුල වශයෙන් දක්නට ලැබිණි. පළමු වන ලෝක සංග්‍රාමයෙන් පසුව යුධ භටයින් උසස් අධ්‍යාපනයට පැමිණීමත් සමඟ විශ්ව විද්‍යාල සංස්කෘතිය තුළට ද ව්‍යාප්ත විය. මෙම නවක වදය යන සංකල්පය වර්තමානය වනවිට ලොව පුරා විවිධ සංවිධානයන්ට මෙන් ම සමාජය තුළ විවාදයන්ට තුඩුදුන් මාතෘකාවක් බවට පත් වී ඇත. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ මේ පිළිබඳ විශාල මතභේදාත්මක සිදුවීම් සමූහයක් සිදුවෙමින් පවතී. 1998 දී නවක වද පනත හේතුකොටගෙන විශ්වවිද්‍යාල නවක වදය නවක නම්නීකරණය බවට පත්විය. මෙහි අධ්‍යයන ගැටලුව වන්නේ මේ ආකාරයට ක්‍රියාත්මක වන නවක වදය/නම්නීකරණය විද්‍යාර්ථීන්ගේ අධ්‍යාපනයට කොතරම් බලපෑමක් වේ ද යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයන ගැටළුව පදනම් කරගනිමින් කරන ලද අධ්‍යයනයේ අරමුණ වන්නේ අධ්‍යාපන කටයුතු සඳහා නවක නම්නීකරණයෙන් සිදුවන බලපෑම හඳුනාගැනීමත්, ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග යෝජනා කිරීමත්ය. මෙම අධ්‍යයනය කැලණිය විශ්වවිද්‍යාලය මුල්කොට ගනිමින් සිදු කරනු ලැබූ අතර මේ සඳහා සෑම වසරකින් ම 50 දෙනෙකුගෙන් සැදුම්ලත් 200ක නියැදියක් සසම්භාවී ලෙස තෝරා ගෙන අධ්‍යයනයට භාජනය කරන ලදි. අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි තෝරාගත් නියැදියෙන් 90% ක් නවක වදයට ලක් වූ බව තහවුරු විය. එයින් 80%ක් පමණ දේශන සඳහා ප්‍රමාද වි පැමිණෙන අතර එයින් 30%ක් ප්‍රමාද වන්නේ නවක වදය/නම්නීකරණය සඳහා වූ වැඩසටහන් හේතුවෙනි. එමෙන් ම නවක වදය/නම්නීකරණය සඳහා වූ වැඩසටහන් හේතුවෙන් 80% කට ම දේශන මඟ හැරී ඇති බව ප්‍රතිඵලවලින් තහවුරු

[1] ශාස්ත්‍රවේදී (විශේෂ), සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, dilukodi@gmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ), සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, kinsi.gt@gmail.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ), සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, kitmnj@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ), සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, rashiravihari@gmail.com
[5] විද්‍යාවේදී (විශේෂ), අලෙවි කළමනාකරණය, සබරගමුව විශ්වවිද්‍යාලය, harshani0319@gmail.com

විය. මෙම 80% අයත් පිරිසගේ නවක වදය පවතින කාලයේ විභාග ප්‍රතිඵල සහ නවක වදය නොමැති කාලයේ ලබාගත් විභාග ප්‍රතිඵල සඳහා ලකුණු පරීක්ෂාවක් සිදුකළ අතර එයින් 95% කගේ ප්‍රතිඵලය වූයේ ලබාගත් ප්‍රතිඵලවල වෙනසක් නොමැති බවයි. 2 ක් මේ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන ලදී. එසේම 3%ක් නවක වදය/නම්නීකරණය සඳහා වූ වැඩසටහන් හේතුවෙන් තම විශ්වවිද්‍යාල අධ්‍යාපන කටයුතු සඳහා බාධාවක් වූ බව පවසයි. කෙසේ වෙතත් අධ්‍යයන ප්‍රතිඵලවලින් තහවුරුවන්නේ නවක වදය/නම්නීකරණය විද්‍යාර්ථීන්ගේ විභාග ප්‍රතිඵල සඳහා දැඩිලෙස බලනොපාන නමුදු දේශන කාල මගහැරීයාම හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා බලපෑමක් එල්ලවන බවයි. මේ අනුව නවක වදය අධ්‍යාපනයට වක්‍රාකාරයෙන් බලපෑමක් එල්ලවන බව පෙනේ. කෙසේ වුවත් විද්‍යාර්ථීන්ගේ බහුතර මතය වන්නේ නවක වදය/නම්නීකරණය මුළුමනින් ම නවතා දැමිය යුතු නැති බවත් එය ක්‍රියාත්මක වන ආකාරය මීට වඩා අර්ථවත් මුහුණුවරක් ගත යුතු බවත් ය.

***මුඛ්‍ය පද :*** *නවක වදය, විද්‍යාර්ථියා, අධ්‍යාපනය, දේශන, ප්‍රතිඵල*

# අයවැය හිඟය හා බදු අදායම

කේ.ඩී.එච්.යූ. ගුණසේකර[1] එම්.ඒ.ඩී.එන්. සඳමාලි[2]
කේ.ඩී.ඒ.කේ. ප්‍රනාන්දු[3] පී.ඒ.ටී. පද්මසිකා[4]

## සංක්ෂේපය

සංවර්ධනය වෙමින් පවතින රටවල අයවැය හිඟය යනු බලවත් ගැටළුවක් බවට පත්ව තිබේ. අයවැය හිඟය තුළ බදු ආදායම කෙතරම් දුරකට වැදගත් වනවා ද යන්න දැක්වීමේදී, අයවැය හිඟය යන්න රජයක ආදායම ඉක්මවා රාජ්‍ය වියදම් ඉහළ යන තත්ත්වයක් ලෙස හැඳින්විය හැකිය. ලයිමර් සහ ඔට්ස් ට අනුව බදු ආදායම යනු රජයක් විසින් කරනු ලබන අනිවාර්යය අය කිරීමක් වන අතර, එය රජයක්, ආදායම්, වියදම්, ප්‍රාග්ධන වත්කම් ආදිය උදෙසා පනවන බවත්, ඉන් බදු ගෙවන්නන්ට ඍජු ප්‍රතිලාභයක් ලැබිය නොහැකි වුවත් රජය අධ්‍යාපනය, සෞඛ්‍යය ආදිය උදෙසා කරනු ලබන වර්තන වියදම්වලින් වක්‍රාකාරව ප්‍රතිලාභ ලැබිය හැකි බවත් පැහැදිලි වේ. චීනය, කොරියාව වැනි ආසියාතික රටවල් කිහිපයක් හැරුණු විට අනෙකුත් ආසියාතික රටවල් සියල්ලක්ම මෙම අයවැය හිඟය තුළින් පිඩාවට පත්ව තිබේ. එමෙන්ම ලයිමර් සහ ඔට්ස් 2008 දී, කිමුරා 2006 දී ප්‍රකාශ කර ඇත්තේ, අයවැය හිඟය අඩු කර ගැනීම උදෙසා බදුකරණය වැදගත් ආර්ථික ප්‍රතිපත්තියක් බවයි. ශ්‍රී ලංකාවේ ද රජයේ මුළු ආදායමෙන් 85% ක් පමණ බදු ආදායම නිරූපණය වේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටළුව වන්නේ අයවැය හිඟය අඩු කර ගැනීමට බදු ආදායම උපකාරී වේද යන්නයි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු ලෙස අයවැය හිඟය හා බදු ආදායම අතර පවතින්නේ කවරාකාර සම්බන්ධතවයක් ද යන්න හඳුනා ගැනීමත් එම සම්බන්ධතාව තුළින් අයවැය හිඟය අඩු වේ ද යන්නත් සලකා බලා තිබේමෙම අධ්‍යයනය සඳහා අදාළ වන විචල්‍ය තීරණය කිරීමේ දී, අයවැය හිඟය පරායත්ත විචල්‍ය ලෙසත්, බදු අදායම ස්වායත්ත විචල්‍ය ලෙසත් ලබා ගත් අතර දත්ත රැස් කිරීමේ දී ද්වීතීයික දත්ත මත පදනම් වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන වාර්තා තුළින් වර්ෂ 1995 සිට 2014 දක්වා වර්ෂ විස්සකට අදාල කාලයක් සඳහා දත්ත ලබා ගත් අතර ඉන්පසු එම දත්ත ‘SPSS’ මෘදුකාංගය භාවිතයෙන්, කේන්ද්‍රික ප්‍රවණතා මිනුම්, අපකිරණ මිනුම්, සහසම්බන්ධතා මිනුම් හා සරල ප්‍රතිපායනය ඇසුරෙන් විචල්‍ය දෙක අතර පැවති සම්බන්ධතාවය හඳුනා ගනු ලැබිණි.

---

[1]ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, helanigunasekara@hotmail.com
[2]ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, akithmini41@gmail.com
[3]ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, sandamalimuthugoda1@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, thilinipatp@gmail.com

එහිදී වසර විස්සක කාලයක් දක්වා අයවැය හිඟයේ සාමාන්‍ය අගය රු.මි. 2322.75 ක්ද, බදු ආදායමේ සාමාන්‍ය අගය රු.මි. 442,109.50 වේ. එමෙන්ම මෙම විචල්‍යන් දෙකෙහි සම්මත අපගමනයන් ලෙස, අයවැය හිඟයේ රු.මි. 1257.31ක්ද, බදු ආදායමේ රු.මි. 317,293.14 ක්ද වේ. මෙම විචල්‍ය දෙක අතර පවතින්නේ ප්‍රතිලෝම සහසම්බන්ධතාවයක් වේ. මෙම විචල්‍යන් දෙකෙහි පියර්සන් සහසම්බන්ධතා අගය 0.958 ක් වීමෙන් එය තව දුරටත් පැහැදිලි විය. එහිදී බදු අදායම වැඩි වීමේදී, අයවැය හිඟය අඩුවන බවත්, බදු අදායම අඩු වන විට අයවැය හිඟය වැඩි වන බවත් ප්‍රකාශ වේ. මෙහිදී මෙම වර්ෂ 20ට අදාළව බදු අදායම එක් ඒකකයකින් වැඩි හෝ අඩු වන විට අයවැය හිඟය ඊට ප්‍රතිලෝමව 0.004කින් වෙනස් වේ. එය පර්යේෂකයින් ඇස්තමේන්තු කළ පහත සරල ප්‍රතිපයන ආකෘතියෙන් පැහැදිලි වේ (BD = -644.27+ (-0.004) xi). මෙම ආකෘතියේ, වෙසෙසියා මට්ටම 0.000 වීමෙන් 1% වෙසෙසියා මට්ටමෙන් ආකෘතියේ සංඛ්‍යානමය වශයෙන් විශ්වසනීය වන අතර, පරායත්ත විචල්‍යයේ මුළු විචලනයෙන් ප්‍රතිපායන ආකෘතියෙන් විස්තර වන ප්‍රමාණය 91%ක් පමණ ඉහළ අගයක් නියෝජනය කරන බව නිර්ණන සංගුණකයේ අගය 0.918ක් වීමෙන් පැහැදිලි වේ. ඒ අනුව නිගමනය කළ හැක්කේ, අයවැය හිඟය හා බදු අදායම අතර ශක්තිමත් ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බවත්, බදු අදායම අයවැය හිඟය උදෙසා වැදගත් බලපෑමක් සිදු කරන බවත් ය.

**මුඛ්‍ය පද :** *අයවැය හිඟය, බදු අදායම*

# රැහැන් රහිත අන්තර්ජාල පහසුකම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව, ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යොදාගැනීම පිළිබඳ අධ්‍යයනයක් (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

එම්.පී.එන්.පී. මැණික්ගේ[1]

**සංක්ෂේපය**

නව තාක්ෂණික ප්‍රවේශයක් ලෙස රැහැන් රහිත අන්තර්ජාල භාවිතය හඳුනාගත හැකිය. මෙරට විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා මෙම යටිතල පහසුකම් වර්තමානය වනවිට නොමිලේ සැපයෙන අතර ඒ හරහා දැනුම සහ තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව විශ්වවිද්‍යාල සිසුවාට හිමිව තිබේ. එහෙත් සෑම සිසුවෙක් ම මෙම අන්තර්ජාල පහසුකම ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යොදාගනු ලබන්නේදැයි ගැටලු සහිතය. එබැවින් මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ රැහින් රහිත අන්තර්ජාල පහසුකම භාවිතය සම්බන්ධව සහ එය විශ්වවිද්‍යාල ශිෂ්‍යයාගේ අධ්‍යාපන කටයුතු වලට භාවිතා කරන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම වේ. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් 100 දෙනෙකුගෙන් සැදුම්ලත් සසම්භාවි නියැදියක් මඟින් ප්‍රශ්නමාලා ක්‍රමය ඔස්සේ ප්‍රාථමික දත්ත රැස්කිරීම සිදුවිය. එහිදී තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණය සම්බන්ධව විද්‍යාර්ථීන්ගේ සාක්ෂරතාවය, රැහැන් රහිත අන්තර්ජාල පහසුකම විශ්වවිද්‍යාලය තුලදී සහ ඉන් පිටත නේවාසිකාගාරය තුලදී විද්‍යාර්ථීන් කෙසේ, කුමන අවශ්‍යතා සඳහා භාවිතා කරන්නේද, රැහැන් රහිත අන්තර්ජාල පහසුකම තුලින් ඇති වාසි සහ අවාසි විද්‍යාර්ථීන්ගේ අධ්‍යාපනයට කෙසේ බලපානවාද යන කරුණු ඔස්සේ දත්ත රැස් කරන ලදී. සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනය මඟින් අනාවරණය වූයේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය ප්‍රවර්ධනය කිරීමේ හැකියාව අන්තර්ජාල පහසුකම් මඟින් ලැබුණ ද ශිෂ්‍ය ප්‍රජාව බහුල වශයෙන් අන්තර්ජාලය අධ්‍යයන කටයුතුවලින් පරිබාහිර වූ හුදු විනෝදාශ්වාදය සඳහා යොදා ගැනීමේ වැඩි නැඹුරුවක් පවතින බවයි. ඒ හරහා අධ්‍යාපනයට බාධාකාරී අවකාශයන්ද නිර්මාණය වී තිබේ. එමනිසා මෙම රැහැන් රහිත තාක්ෂණයෙන් උපරිම ඵලදායිතාවයක් ලබාගැනීමට නම් මෙම තාක්ෂණය හා සම්බන්ධ කොටගත් නව ඉගැන්වීමේ ක්‍රමවේදයන් නිර්මාණය විය යුතු අතර පාලනයකට යටත්ව අන්තර්ජාල පහසුකම ලබාදිය යුතුය.

**මුඛ්‍ය පද :** *රැහැන් රහිත අන්තර්ජාලය, යටිතල පහසුකම්, අධ්‍යාපනය, ශිෂ්‍ය ප්‍රජාව*

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
nirmaliprasanthika1@gmail.com

# මැතිවරණ ව්‍යාපාරවල දේශපාලන සන්නිවේදන උපක්‍රමයක් ලෙස ගීත භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්.එම්.එල්.කේ. විජේනායක[1] එම්.කේ. නදීකා දමයන්ති[2]

**සංක්ෂේපය**

මැතිරණ ව්‍යාපාරයක් යනු ජනාධිපතිවරණය, මහා මැතිවරණය හෝ ජනමත විචාරණයකදී, පළාත් සභා මැතිවරණයකදී හෝ ප්‍රාදේශීය සභා මැතිවරණයකදී මහ ජනතාව දැනුවත් කිරීම සඳහා පක්ෂ විසින් භාවිතයට ගන්නා ක්‍රමවේදයයි. එම ක්‍රියාවලිය නොමැතිනම් ඡන්දදායකයින් මෙන්ම අපේක්ෂකයින්ද දුෂ්කරතාවලට මුහුණ දේ. මැතිවරණ ව්‍යාපාරයකදී අපේක්ෂක වගතුග මහජනතාව වෙත සන්නිවේදනය කිරිම සඳහ විවිධ උපක්‍රම භාවිතා කරයි. පෝසටර්, කටවුට්, වෙළඳ දැන්වීම්, ප්‍රසංග, පෙළපාලි, රැස්වීම් ආදිය ඉන් කිහිපයකි. වර්තමානයේ මැතිවරණ ව්‍යාපාරය සඳහා උපයෝගී කර ගන්නා ප්‍රබලතම මෙවලම වන්නේ බහුජන මාධ්‍යයයි. පුවත්පත්, රූපවාහිණී, ගුවන් විදුලිය හා අන්තර්ජාලය ඔස්සේ විකාශනය කරන්නා වූ තොරතුරු හරහා ඡන්ද දායකයින් අදාළ අපේක්ෂකයාගේ ප්‍රතිරූපය, පසුගිය වාර්තා, ජනතා සේවය ඉදිරි සැලසුම් ආදිය පිළිබඳව දැනුවත් වේ. විද්‍යුත් බහුජන මාධ්‍ය ඔස්සේ මෙන්ම ප්‍රසංග රුැස්වීම් ආදියෙහි සන්නීවේදන උපක්‍රමයක් ලෙස භාවිතා කරන ප්‍රබලතම ක්‍රියාමාර්ගයක් වන්නේ අදාළ අපේක්ෂකයා සම්බන්ධ ගීත නිර්මාණ භාවිතා කිරිමයි. ගීතය ප්‍රබලතම සන්නීවේදන උපක්‍රමයක් වීමට බලපාන ලද කාරණය වන්නේ ගීතයේ ඇති ආකර්ෂණය හැකියාව සහ හැඟීම් දනවීමේ හැකියාවයි. මැතිවරණ ව්‍යාපාරවල යොදා ගන්නා උපක්‍රමයක් වන ගීත භාවිතාය ජනතා මතය හැඩගැස්වීමට කෙතෙක් දුරට සාර්ථක වී තිබේද? ගීත මඟින් සන්නිවේදන කාර්යයක් ඉටුවේද? යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මේ සඳහා 2015 ජනාධිපතිවරණය සහ 2015 මහා මැතිවරණ ව්‍යාපාර තුළ දී භාවිතා කළ ගීත පිළිබඳව විශ්ලේෂණයක යෙදුණු අතර අධ්‍යයන ජන්දදායකයින්ගේ අදහස් විමසා බැලීමට ක්ෂේත්‍රය ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉලුක්වත්ත ග්‍රාම නිළධාරී වසමෙහි ජන්දදායක නාමලේඛනය ඇසුරින් ජන්දදායකයින් 100ක් අහඹු ලෙස තෝරා ගැණිනි. එමෙන්ම සංගීතඥයින් සමඟ පැවැත්වූ අතර එමගින් මැතිවරණ ව්‍යාපාරය තුළ දේශපාලන සන්නිවේදනය සඳහා ගීත යොදා ගැනිම පිළිබඳව විමර්ශනය කෙරිණි. අධ්‍යයනයෙන් අනාවරණය වූයේ ගීත මගින් දේශපාලන සන්නිවේදනය සිදුවන බව ප්‍රතිචාරින්ගෙන් 91% ද, ප්‍රචාරණ මාධ්‍යයක් ලෙස එය ඵලදායි බව ප්‍රතිචාරීන්ගෙන් 76% ප්‍රකාශ කළහ.

**මුඛ්‍ය පද ඃ** *දේශපාලන සන්නිවේදනය, මැතිවරණ ව්‍යාපාරය, ප්‍රචාරක උපක්‍රම, ගීත*

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

# ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහිලා කෘෂි අංශයේ දායකත්වය

එම්.ඩබ්.ඒ.එස්.එම්. වීරසිංහ[1]  ජී.එච්.එච්.එස්. මධුවන්ති[2]

**සංක්ෂේපය**

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකාර්මික අංශයෙන් ඉටු කරනු ලබන මෙහෙවර අතිමහත්ය. කෘෂිකාර්මික රටක් සංවර්ධනය කිරීම සඳහා තිබෙන හොඳම මාර්ගය කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ දැමීමයි. සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහෝමයක මූලික කර්මාන්තය ලෙස සැලකෙන්නේ කෘෂිකර්මාන්තයයි. එමෙන් ම ජනගහනයෙන් වැඩි කොටසක් ජීවනෝපාය කරගෙන ඇත්තේ ද කෘෂිකර්මාන්තයයි. මේ නිසා ජාතික සැලසුම් පිළියෙල කිරීමේ දී කෘෂිකාර්මික අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. මෙම අධ්‍යයනය මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට කෘෂි අංශයේ දායකත්වය වෙනස් වී ඇත්තේ කෙසේ ද යන්න පිළිබඳව විමසා ඇත. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයට බලපාන සාධක හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වේ. 2005-2014 කාල පරිච්ඡේදයන්ට අදාල ද්විතීයික දත්ත මහා බැංකු වාර්තාව මඟින් ලබාගත් අතර, එම කාල සීමාව තුළ ශ්‍රී ලංකා ආර්ථිකයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය, වර්ෂයත් සමඟ වෙනස් වී ඇත් ද යන්න ප්‍රවණතා විශ්ලේෂණයක් යොදා ගනිමින් පරීක්ෂා කරන ලදි. ඒ අනුව 2005ට සාපේක්ෂව 2014 වනවිට කෘෂි අංශයේ දායකත්වය 7% කින් පමණ පහළ වැටී ඇත. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයට පහළ වැටීමට බලපා ඇති හේතු කිහිපයකි. ඒවා අතරින් අධ්‍යයනය මඟින් හෙළිවු කරුණු අතර ප්‍රධාන ම හේතුව වන්නේ භූමි සම්පත සීමාසහිතවීම සහ ඉඩම් කැබලි කිරීම හේතුවෙන් පරිමාණානුකූල ඵල නියම ආකාරයෙන් ලැබීම වළක්වාලීම, කර්මාන්ත සහ සේවා අංශ සමඟ තරඟ කිරීමට නිෂ්පාදන සාධකවලට ඇති දුෂ්කරතා සහ අවසාන නිෂ්පාදිතවලට දේශීය සහ විදේශ තරඟකාරිත්වයට එරෙහිව නැඟීසිටීමට සිදුවීමත් ය. ජාත්‍යන්තර වශයෙන් සිදුවන තාක්ෂණික සංවර්ධනය භාණ්ඩ මිල නොකඩවා පහත හෙළීමට හේතු වු අතර දේශිය මෙන් ම ජාත්‍යන්තරව අනෙකුත් ක්ෂේත්‍ර ප්‍රසාරණය වීම, භූමිය, ශ්‍රමය වැනි යෙදවුම් මත ඇති ඉල්ලුම වැඩිවීම නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතු විය. තව ද වාරිමාර්ග යටිතල පහසුකම් දියුණු නොවීම, කාලගුණික විපර්යාස කෘෂි අංශයේ දායකත්වය පහත වැටීමට බලපා ඇති බැව් තහවුරු විය.

**මුඛ්‍ය පද :** *කෘෂිකාර්මික, ආර්ථික, සංවර්ධන*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජසංඛ්‍යානය,කැලණියවිශ්වවිද්‍යාලය
mwasmgamindaweerasinghe@gmail.com
[2] විද්‍යාවේදී (විශේෂ), අලෙවි කළමනාකරණය, සබරගමුව විශ්වවිද්‍යාලය
harshani0319@gmail.com

# අන්තර්ජාල බැංකු ක්‍රම භාවිතය

කේ.ඩී.එච්.යූ. ගුණසේකර[1] එම්.ඒ.ඩී.එන්. සඳමාලි[2]
කේ.ඩී.ඒ.කේ. ප්‍රනාන්දු[3] පී.ඒ.ටී. පද්මසිකා[4]

**සංක්ෂේපය**

අන්තර්ජාල බැංකු ක්‍රම යනු "අන්තර්ජාලය හරහා බැංකු ගනුදෙනු මෙහෙයවනු ලබන ක්‍රමයකි." මෙම අන්තර්ජාල බැංකු ක්‍රම, ජාල බැංකු ක්‍රම ලෙස ද හඳුන්වනු ලබයි. තවද අන්තර්ජාල බැංකු ක්‍රම භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මීට පෙර මේ සම්බන්ධව සිදුකරන ලද පර්යේෂණයක් ලෙස ඕස්ට්‍රේලියාවේ "Roy Morgan" නම් පර්යේෂණ ආයතනය විසින් 2013 වසරේ දී සිදුකරන ලදි. එම සමීක්ෂණයකට අනුව සොයාගනු ලැබ ඇත්තේ ඕස්ට්‍රේලියාවේ සති 4 ක කාලයක් තුළ දී වයස අවුරුදු 14 ට වැඩි පුද්ගලයින් අතුරින් 56% ක් අන්තර්ජාල බැංකු පහසුකම් අත්විඳ ඇති අතර එම කාල පරිච්ඡේදය තුළ බැංකු වෙත ගොස් තම ගනුදෙනු සිදුකර ඇත්තේ 34% ක පිරිසක් පමණක් වන බවයි. මේ අනුව බැලූ කල ලෝකය පුරා සීඝ්‍රයෙන් ප්‍රචලිත ව පවතින අතර ශ්‍රී ලංකාවේ එම තත්ත්වය කෙබඳු ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව විය. ඒ යටතේ අන්තර්ජාල බැංකු පහසුකම් භාවිතය ස්ත්‍රී පුරුෂභාවය අනුව, පෞද්ගලික සහ රාජ්‍ය අංශය ලෙස රැකියාවේ ස්වභාවය අනුව, වැටුප් මට්ටම අනුව සහ අධ්‍යාපන මට්ටම අනුව කෙසේ වෙනස් වී ඇත් ද යන්න සහ බැංකු මට්ටමින් ඒ සම්බන්ධව පවත්නා ආකල්ප කෙබඳු ද යන්න සොයා බැලීමත් මෙම අධ්‍යයනයේ අරමුණු විය. මෙහි දී දත්ත රැස් කිරීමේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ රාජ්‍ය බැංකු ආයතන තුනක් සහ පෞද්ගලික බැංකු ආයතන පහක් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් ද කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික් දෙක පාදක කර ගනිමින් සසම්භාවී ලෙස තෝරාගත් අන්තර්ජාල බැංකු ක්‍රම භාවිත කරන පුද්ගලයින් 25 දෙනෙකුගෙන් යුත් නියැදියක් ලබාගෙන ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයෙන් දත්ත රැස්කර ගැනුණි. එසේ සපයා ගන්නා ලද තොරතුරු SPSS මෘදුකාංගය භාවිතයෙන් විස්තරාත්මක සංඛ්‍යාන මිනුම් ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. එසේ සිදුකරනු ලැබූ විශ්ලේෂණයේ සොයාගැනීම් වූයේ ලබා ගන්නා ලද නියැදියට අනුව අන්තර්ජාල බැංකු ක්‍රම භාවිත කරන්නන්ගෙන් 68%ක් පමණ පුරුෂයින් වන බව ද, 64%ක් පමණ වයස අවුරුදු 31 ත් 50ත් අතර වන පුද්ගලයින් වන

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, helanigunasekara@hotmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, akithmini41@gmail.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, sandamalimuthugoda1@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, thilinipatp@gmail.com

බව ද, අධ්‍යාපන මට්ටම අනුව ගත් කල අන්තර්ජාල බැංකු ක්‍රම භාවිත කරන්නන්ගෙන් වැඩි පිරිස උසස් අධ්‍යාපනයක් සහිත පුද්ගලයින් බව ද, එය ප්‍රතිශතාත්මක ව 48%ක් පමණ වන බව ද, වැඩි වශයෙන්ම අන්තර්ජාල බැංකු ක්‍රම භාවිත කරනු ලබන්නේ පෞද්ගලික අංශයේ රැකියාවන්හි නියුතු වූවන් බව ද, එය ප්‍රතිශතාත්මකව 60%ක් පමණ වූ බව ද, මෙම පර්යේෂණය මඟින් අනාවරණය කර ගැනීමට හැකි වුණි. එමෙන්ම රාජ්‍ය බැංකුවලට සාපේක්ෂව පෞද්ගලික බැංකු අශ්‍රිතව අන්තර්ජාල බැංකු ක්‍රම ක්‍රියාත්මක කිරීමට තිබෙන අවශ්‍යතාවය වැඩි බව පෙනී ගිය අතර, එම සම්මුඛ සාකච්ඡා තුළින් පෞද්ගලික බැංකු අශ්‍රිත ව අන්තර්ජාල බැංකු ක්‍රමයට ඇති පාරිභෝගික නැඹුරුව 30%-45%ත් අතර අගයක පැවතුණි. නමුත් රාජ්‍ය බැංකු වල එම අගය 15%-20% අතර පැවතුණි. එම අන්තර්ජාල බැංකු ක්‍රම ව්‍යාප්ත කිරීමට පෞද්ගලික බැංකු විවිධ සානුබල සපයනු ලැබූ අතර රාජ්‍ය බැංකු සම්බන්ධයෙන්ද එලෙස විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක විය. එම නිලධාරීන්ට අනුව නාගරික ප්‍රදේශවල පාරිභෝගිකයින් ග්‍රාමීය පාරිභෝගිකයින්ට වඩා අන්තර්ජාල බැංකු කටයුතු කෙරෙහි නැඹුරු වීමක් ඇත. ඒ අනුව සමස්තයක් වශයෙන් මෙම පර්යේෂණය තුළින් එළඹිය හැකි නිගමනය වූයේ ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාල බැංකු ක්‍රම භාවිතය උසස් අධ්‍යාපන මට්ටමක් සහිත ඉහළ ආදායම් මට්ටමක් සහිත පුද්ගලයින් අතර පමණක් වැඩි වශයෙන් ව්‍යාප්ත ව ඇති බවත් අන්තර්ජාල බැංකු ක්‍රම පිළිබඳව පුද්ගලයින් තුළ පවත්නා වූ දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බවත් අන්තර්ජාල බැංකු ක්‍රම භාවිතය අඩු ආදායම් සහිත අඩු අධ්‍යාපන මට්ටමක් සහිත පුද්ගලයින් අතරත් ප්‍රචලිත කිරීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත් හඳුනාගනු ලැබීය.

**මුඛ්‍ය පද :** *අන්තර්ජාල බැංකු ක්‍රම, රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු*

# විද්‍යාර්ථීන්ගේ සමාජ ජාල වෙබ් අඩවි භාවිතයේ අරමුණු
## ( කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ඩබ්.එන්.ඩී.එස්. සම්මානි වෙදමුණි[1]

**සංක්ෂේපය**

කැලණිය විශ්වවිද්‍යාලය තුළ විද්‍යාර්ථීන් විසින් සමාජ ජාල වෙබ් අඩවි භාවිතා කිරීම බහුල වශයෙන් දක්නට ලැබෙන්නකි. මෙයට ප්‍රධාන හේතුන් මොනවාද යන්න සොයා බැලීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී. කැලණිය විශ්වවිද්‍යාලය පරිශ්‍රය තුළ දැනට පවතින විද්‍යා, වානිජ හා කළමණාකරණ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයන්ගේ විද්‍යාර්ථීන් අතරින් දෙවන වසර සිසුන් 100ක නියැදියක් යොදාගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙහිදී දත්ත ලබාගැනීම සඳහා ප්‍රාථමික දත්ත ලබාගැනීමේ ක්‍රම වන සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලි ක්‍රමය යොදාගන්නා ලදී. මෙම පර්යේෂණය විශ්ලේෂණය කිරීම සඳහා සංඛ්‍යාත්මක ශිල්පීය ක්‍රම යොදාගත් අතර ප්‍රතිපායනය, සහසම්බන්ධතාවය, කේන්ද්‍රීය ප්‍රවණතා මිනුම් මෙන්න කුටිකතාවය, විචලතාවයද භාවිතා විය. වාණිජ හා කළමණාකරණ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා යන සියලු පීඨයන්ගේ 72%ක විද්‍යාර්ථීන් පිරිසක් සමාජ ජාල වෙබ් අඩවි භාවිතය යෝග්‍ය බව ප්‍රකාශ කරන අතර විද්‍යා පීඨයේ සුළු පිරිසක් එනම් 25% යෝග්‍ය නොවන බව ප්‍රකාශ කරන ලදි. 3% කිසිසේත්ම සමාජ ජාල වෙබ් අඩවි භාවිතය සුදුසු නොවන බව පවසයි. තවද මොවුන්ගෙන් විශාල පිරිසක් මෙම සමාජ ජාල වෙබ් අඩවි තුල තමන්ගේ පෞද්ගලික තොරතුරු ඇතුලත් නොකරන බවත්, මේවා භාවිතා කරනු ලබන්නේ හුදෙක්ම විනෝදාස්වාදය සඳහා පමණක් බවත් ප්‍රකාශ කර සිටී. වාණිජ හා කළමණාකරණ විද්‍යාර්ථීන්ගෙන් සමාජ ජාල වෙබ් අඩවි ඉතාමත් යෝග්‍ය බව 5% පිරිසක් ප්‍රකාශ කරන ලද අතර 23% යෝග්‍ය නොවන බව පවසයි. මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයන්හි 28% සමාජ ජාල වෙබ් අඩවි යෝග්‍ය නොවන බව පවසයි. මෙම පර්යේෂණය මඟින් පෙනී ගිය නිගමනය වන්නේ සියලුම පීඨයන්හි විද්‍යාර්ථීන් සමාජ ජාල වෙබ් අඩවි කෙරේ යොමු වී ඇති බවත්, ඉතා සීමිත පිරිසක් එය ප්‍රතික්ෂේප කරන බවත්ය. මෙම පර්යේෂණය මඟින් විශ්වවිද්‍යාලය තුල විද්‍යා පීඨයේ විද්‍යාර්ථීන් වැඩි වශයෙන් සමාජ ජාල වෙබ් අඩවි භාවිතා කරන අතර එය යෝග්‍යබව ප්‍රකාශ කර සිටී.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථයා, පර්යේෂණ, සමාජ ජාල වෙබ් අඩවි*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
wedamunisammani@gmail.com

# කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිළධාරීන් වගකීම් ඉටුකිරීමේදී දේශපාලන බලතල බෙදාහැරීමේ බලපෑම

අයි.එච්.අයි.එම්. බණ්ඩාර[1] එම්.කේ. නදීකා දමයන්ති[2]

## සංක්ෂේපය

විමධ්‍යගතකරණය ලෝකයේ සෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක්ම වර්තමානයේ පිළිගත් සංකල්පයකි. ශ්‍රී ලංකාවේ ද විමධ්‍යගතකරණ මාදිලියක් වන දේශපාලන බලතල බෙදාහැරීම යටතේ 1987දී පළාත් සභා පිහිටුවන ලදී. ඒ අනුව එතෙක් මධ්‍යම ආණ්ඩුව යටතේ පැවති බලතලවලින් කිසියම් ප්‍රමාණයක් පළාත්සභා සඳහා ලබාදෙන ලදී. ගොවිජනසේවා විෂයය ද එසේ පැවරූ විෂයකි. කෘෂිකාර්මික හා ගොවිජනසේවා ක්ෂේත්‍රයේ පළාත් මෙන් ම මධ්‍යයේ වගකීම් ද බිම්මට්ටමේදී ඉටුකිරීමට පැවරී ඇති නිළධාරියා වන්නේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරය. නමුත් ඔවුන්ගේ වගකීම බැදී ඇත්තේ මධ්‍යම ආණ්ඩුව සමගිනි. ඒ අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ට මධ්‍යම ආණ්ඩුව හා පළාත්සභා සම්බන්ධයෙන් පැවරී ඇති රාජකාරි ඉටුකිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටලු අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණක් වේ. මේ සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් තුළින් ප්‍රාථමික දත්තත් ලිපි, ග්‍රන්ථ ආදිය මගින් ද්විතීක දත්තත් ලබා ගන්නා ලදී. අධ්‍යයන ප්‍රදේශ ලෙෂ කෑගල්ල දිස්ත්‍රික්කය අහඹු ලෙස ගන්නා ලදී. එහිදී දිස්ත්‍රික්කය තුළ විසිරී යන පරිදි කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරනිළධාරීන් 100ද, ගොවීන් 100ද අහඹු ලෙෂ තෝරා ගන්නා ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගෙන් වැඩි ප්‍රමාණයකට එනම් 20% කට පමණ ප්‍රධාන ගැටලුව වී ඇත්තේ රාජකාරි ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැති වීමයි. එමෙන්ම අධ්‍යයනයට සහභාගි වූ නිළධාරීන්ගෙන් 10%ට කාර්යාල දීමනා හා වැඩබලන දීමනා ලබා නොදීම, 12%ට ගොවි ආරවුල් වැඩි වශයෙන් පැවතීම නිළධාරීන් වැඩිපිරිසක් රාජකාරි ඉටුකිරීමේදී මුහුණදෙන ගැටලු වේ. එමෙන්ම ඔවුන්ට පැන නගින නීතිමය ගැටලු ලෙස ප්‍රධාන වශයෙන්ම 2000 අංක 46 දරණ 19%ට ගොවිජනසේවා පනතට අනුව කටයුතු කිරීමට අපහසුවීමත්, 10%ට කුඹුරු ඉඩම්වල අනවසර ඉදිකිරීම් හා කුඹුරු ඉඩම් ගොඩකිරීමත් ඒවා සම්බන්ධව රාජකාරි කිරීමේදී දේශපාලනයේ මෙන්ම ආයතනයේ ඉහළ නිළධාරීන්ගේ බලපෑමත් දැක්විය හැකිය. එමෙන්ම කෘෂිකාර්මික කටයුතු කිරීමේදී ගොවීන් මුහුණදෙන ගැටලු සඳහා ඉක්මන් විසඳුම් ලබාදීමට හැකියාවක් නොවීම, කෘෂිකාර්මික කටයුතුවලින් ක්‍රමක්‍රමයෙන් ජනතාව ඈත්වීම ආදී ගැටලු මෙන්ම කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරු කෘෂිකර්මයට සම්බන්ධ වෙනත් ආයතන සඳහා සේවය කළයුතු වීමත් එසේ සේවය කළත් ඔවුන්ට ඒ සඳහා වෙනත් දීමනාවක් ලබා නොදේ. එමෙන්ම බොහෝ විට

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

එම රාජකාරිවල අවසාන වගකීම දැරීමට සිදුවන්නේද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරටය. එමෙන්ම ඔවුන් ග්‍රාම නිළධාරී වසම් දෙකක සේවය කළත් එය එක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසමක් ලෙස ගණන් ගැනීම නිසා ඔවුන්ට රාජකාරි ඉටුකිරීම සඳහා පවතින ප්‍රදේශය පුළුල් වේ. නමුත් මොවුන් ගොවිජනසේවා දෙපාර්තමේන්තුවට තොරතුරු සැපයිය යුතු වන්නේ ග්‍රාම නිළධාරී වසම් මට්ටමිනි.

**මුඛ්‍ය පද :** *කෘෂිකර්මය, විමධ්‍යගතකරණය, ගොවිජන සේවා, පළාත් සභා, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර*

# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ නැංවීමේ වැදගත්කම

එම්.ඩබ්.ඒ.එස්.එම්. වීරසිංහ[1] කේ.බී.ආර්. සෙනවිරත්න[2]
ජී.එච්.ඒ.එල්. සඳරුවන්[3]

**සංක්ෂේපය**

සමස්ත ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතය සඳහා ප්‍රධාන වශයෙන් ම අඩු ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගීත්වය හේතු වී ඇත. වර්තමානයේ දි ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය 75% ක් පමණ වන අතර ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය 35% ක් පමණ වේ. කලාපයේ අනෙකුත් රටවල් සමග ගත්විට ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගීත්වය සැලකිය යුතු අඩු මට්ටමක පවති. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගිත්වය ඉහළ නැංවීමේ වැදගත්කම පිළිබඳව අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය පහළ මට්ටමේ පවතින්නේ ඇයි ද යන්න අධ්‍යයන ගැටළුව ලෙස සලකා ඇත. පර්යේෂණය සඳහා 2005-2014 කාල පරිච්ඡේදය තුළ සේවා වියුක්ති අනුපාතිකයට සහ ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකයට අදාල ද්විතීයික දත්ත මහාබැංකු වාර්තාව මඟින් ලබාගත් අතර අවුරුදු 10ක කාලය තුළ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගිත්වය හා සේවා වියුක්ත අනුපාතිකයේ හැසිරීම පරික්ෂා කිරීම සඳහා ප්‍රවණතා විශ්ලේෂණයක් සිදුකරන ලදි. එහි දී 2005ට සාපේක්ෂව 2014 වසරේ සේවා වියුක්ති අනුපාතිකය 5%කින් පමණ අඩු වී ඇති අතර ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය 3% කින් පමණ වැඩි වී ඇත. නමුත් මෙම වර්ෂ දෙක තුළ සැලකිය යුතු මට්ටටේ විශාල වෙනසක් සිදු වී නොමැත. එනම් පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය සහ ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය සමග සැලකු විට ස්ත්‍රී දායකත්වය ඉතා පහළ මට්ටමක පවතින බැව් තහවුරු විය. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගිත්වය පහළ මට්ටමක පැවතීමට හේතු කිහිපයක් පවතී. එනම් බහුතරයක් ස්ත්‍රීන් අධ්‍යාපන කටයුතුවල නියැලීම, ගෘහස්ථ වගකීම්වල නියැලීම, දරුවන් රැකබලා ගැනීම, ආරක්ෂාකාරි නේවාසික පහසුකම් සහ රාජකාරී ස්ථානයට යැමට ඒමට ප්‍රවාහන පහසුකම් නොමැතිවීම, තාවකාලික ව සේවයෙන් ඉවත් වූ පසු නැවත රැකියාවක් සොයාගත නොහැකි වීම සහ ශ්‍රම සංචලනය සැලකු විට වැඩි රැකියා අවස්ථා සපයන ප්‍රදේශ කරා යාමට පුරුෂයින්ට වඩා කාන්තාවන්ට අපහසු වීම දැක්විය හැකිය. තිරසාර ආර්ථිකයක් පවත්වාගැනීමට පමණක් නොව කාන්තාව සවිබල ගන්වමින් ආර්ථික වර්ධනය සඳහා ඔවුන්ගේ

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණියවිශ්වවිද්‍යාලය
mwasmgamindaweerasinghe@gmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
anjalisenavirathne@gmail.com
[3] කළමනාකරණවේදී (විශේෂ) දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 1992alsandaruwan@gmail.com

සහභාගීත්වය සහතික කරගැනීමට, ජනතාව වයස්ගතවීමේ අභියෝග ජයගැනීමට, ගැහැණු දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දරන ජාතික ආයෝජනයෙහි ප්‍රතිලාභ සාක්ෂාත් කරගැනීමට මෙන් ම නැගී එන කර්මාන්තවල ශ්‍රම ඉල්ලුම සපයාදීමට කාන්තා ශ්‍රමය වැඩි වශයෙන් ආකර්ෂණය කරගැනිම වැදගත් බැව් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගිත්වය, සේවා වියුක්ති අනුපාතිකය*

# Quality Control Practices and Its Impact on Non-Financial Returns to the Organizations involved in Fast Food Industry in Sri Lanka

U.H.L. Madhushanka[1]

**Abstract**

Fast Food Industry is an upcoming industry in Sri Lanka where the people more likely to visit with different types of desires. The industry also specifies with the desires of the customers in order to remain competitively in the industry. Therefore this study focused on the desired features by the customers on fast food industry on behalf of quality of the products and their opinions toward the organization. The objective of the study is to identify the practice to gain customer loyalty towards their products. The dependent variable is non-financial returns to the organization that measured with the opinion of the customers selected by a field survey with reference to similarity, consistency, taste, goodwill, reputation, customer base and affordability. Similarly the level of use of quality control practices in respective organizations will be collected by managerial employees in particular organizations' outlets as for the independent variable. The sample will be selected from fast food consumers by convenient sampling technique. Questionnaire method and unstructured interviews will be used to collect data and will use descriptive statistics, chi-square test, and correlations to analyze data. This study expects that the level of customer loyalty may be decided with the level of use of quality control methods which can make consistent customers to the product.

**Key Words :** *Quality Control Practices, Non-financial returns, Fast foods Industry, Customer loyalty*

[1] Department of Marketing Management, University of Kelaniya.
lakmal.madhushanka7@gmail.

# නාගරික සංවර්ධනය උදෙසා වන බලහත්කාර සංක්‍රමණයේ සමාජ ආර්ථික බලපෑම
## (බොරැල්ල වනාතමුල්ල ප්‍රදේශය ඇසුරින්)

පී.ජී ජයලනී පහලගේ[1] එම්.කේ. නදීකා දමයන්ති[2]

**සංක්ෂේපය**

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලොව රටවල් බහුතරයක් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ ඒ සඳහා යෝග්‍ය භූමියේ හිඟකමයි. මෙම තත්ත්වය ප්‍රධාන නගර ආශ්‍රිතව සිදු කෙරෙන සංවර්ධන ව්‍යාපෘතිවලදී බෙහෙවින් බලපෑම් සහගත සාධකයක් වේ. එමනිසා ප්‍රධාන නගරවල සංවර්ධන ව්‍යාපෘතිවලදී එම ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් නව නිවාස ව්‍යාපෘති තුළට බලහත්කාරයෙන් සංක්‍රමණය කරවීම සිදුවේ. පසුගිය රජය විසින් ශ්‍රී ලංකාවේ කොළඹ නගරය ආශ්‍රිතව සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කළ අතර එම ව්‍යාපෘති සඳහා ඉඩම් සපයා ගැනීම සඳහා නාගරික පැල්පත්වාසීන් නව නිවාස සංකීර්ණවල පදිංචි කරවීමක් සිදුවිය. මෙම පදිංචිකරවීම්වලින් බොහොමයක් බලහත්කාරයෙන් සිදුකෙරුණු බව ඇතැම් මාධ්‍ය විසින් වාර්තා කරන ලදී. මෙම අධ්‍යයනයේ අරමුණුවන්නේ නව පදිංචි කරවීම් හේතුවෙන් එම ජනතාව කිසියම් ආකාරයක ගැටලුවකට මුහුණදී සිටින්නේද? එසේනම් ඒ මොනවාද? යන්න විමර්ශණය කිරීමයි. අධ්‍යයන ප්‍රදේශය වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වනාතමුල්ල ප්‍රදේශය තුළ පදිංචිව සිටි දැනට සිරිසර උයන නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිකරවා ඇති ප්‍රතිචාරීන් 100 අහඹු ලෙස තෝරා ගැණිනි. තොරතුරු රැස්කිරීමේදී ප්‍රාථමික සහ ද්විතියික දත්ත දෙවර්ගයම භාවිතා කරන ලදී. ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා භාවිතා කරන ලදී. ද්විතියික දත්ත ලබා ගැනීමේදී ජන හා සංඛ්‍යාලේඛන වාර්තා, සම්පත් පැතිකඩ, පර්යේෂණ ලිපිලේඛන භාවිතා කෙරිණි. ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන විධික්‍රම තුළින් ද ගුණාත්මක දත්ත සහ තොරතුරු විස්තරාත්මක ක්‍රමවේදය ද ඇසුරින් විශ්ලේෂණය කෙරිණි. නියැදියට අයත් වූවන්ගෙන් 68% අනාවරණය කරනු ලැබුවේ තමන් බලහත්කාර සංක්‍රමණය හේතුවෙන් තමන් ගැටලුවලට මුහුණදී සිටින බවයි. එහිදී ඔවුන් මුහුණදෙන ගැටලු වශයෙන් ළමුන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා පැමිණීම (58%), ජීවනෝපාය කටයුතුවල යෙදීමට අවහිරතා මතුවීම (20%), සමාජ සංස්කෘතික සම්බන්ධතා බිඳවැටීම (63%), නව නිවාස සඳහා ගෙවියයුතු මුදල් වාරික ගෙවීමට අපහසු බව අධ්‍යයනට ලක් කළ සියලුම ප්‍රතිචාරීන්ගේ අදහස විය. එසේම තමන්ගේ සින්නක්කර ඔප්පු සහිත නිවාස සඳහා හෝ වන්දියක් කිසිවෙකුටත් නොලැබී තිබීම ආදී අහිතකර

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

බලපෑම් රාශියක් අනාවරණය කරන ලදී. එසේම නියැදියෙන් 33% අනාවරණය කරනු ලැබුවේ නවපදිංචි කරවීම් තුළින් තමන්ට නව සමාජ තත්ත්වයක් ලැබී ඇති හෙයින් එය යහපත් බලපෑමක් වන බවයි.

**මූඛ්‍ය පද ඃ** *බලහත්කාර සංක්‍රමණය, නාගරික සංවර්ධනය, අඩු ආදායම්ලාභීන්, සිරිසර උයන නිවාස සංකීර්ණය, නිවාස අයිතිය*

# Efficiency of Internship Programme in University of Kelaniya

R.M.M. Bandara Rathnathilaka[1] D.K.S.M.A Dissanayake[2]
A.K.M. De Silva[3] R.S.S. Kamalawarna[4]

**Abstract**

An internship is the transition from study to work and is a necessary component in order to develop a students' skills, making them more advanced and diligent when they finally have the opportunity to be a part of the working world. Internships offer students a period of practical experience in the industry relating to their field of study. An internship provides a great opportunity for prospective employees to gain experience in a particular field or industry, determine if they have an interest in a particular career, create a network of contacts, or gain university module credits. The main objective of this paper is to evaluate the efficiency of Internship programme which is conducting by university of Kelaniya. To evaluate the efficiency some factors have been used such as the duration of internship, time period which assigned from the university for Internship, the duties assigned from the working place and the relationship between the academic subject and duties. For this research primary data were mainly used which had collected by interview based questionnaire. Target sample was student who are following internship program and who followed internship programme in all four faculties. Also this study reveal the opinion of Government and non-government companies about the internship programme. Mixed method has been used for the data analysis, and also the descriptive statistics and the Fisher's exact test have been used. According to the study it reveals efficiency of the internship programme which is conducting by University of Kelaniya is diminishing in the present due to many reasons. The main reason is Faculties are not known about the main purpose of this Internship programme. Another reason

[1] B.A.(Special)Social Statistics, University of Kelaniya, muthuminibandara@gmail.com
[2] B.A.(Special)Social Statistics, University of Kelaniya, malsha.dissanayake@gmail.com
[3] B.A.(Special)Social Statistics, University of Kelaniya, kalpi.madu@gmail.com
[4] B.A.(Special)Social Statistics, University of Kelaniya, ranasinghessk@gmail.com

is student haven't knowledge about the learning objectives which they have to complete during the Internship programme and which companies do they have to choose to complete those learning objectives. It is important to convey all responsibilities to all the parties which work in with Internship programme and it is important to build up good connection among university and students' working place.

**Key Words** : *Internship, Efficiency, University, Mix method, learning objectives*

# විශ්වවිද්‍යාලය තුළ විවේක කාලය ගත කිරීම
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

ඩබ්.එන්.ඩී.එස්. සම්මානි වෙදමුණි[1]

**සංක්ෂේපය**

මිනිසාට එදිනෙදා කටයුතු කිරීමේදී ඇතිවන ඒකාකාරී බවින් මිදීම සඳහා විවේක කාලය අත්‍යවශ්‍යය වේ. ව්‍යවසායකයින්ට මෙම විවේක කාලය නිශ්චිත වන අතර එම විවේක කාලය තුළ ඔවුන් විසින් කළයුතු කාර්යයන්ද තිබේ. දිවා විවේකය ඇතැම් විට ආහාර ගැනීමට පමණක් සීමා විය හැකිය. නමුත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විද්‍යාර්ථියාගේ විවේක කාලය නිශ්චිත කාලයකට සීමා නොවේ. ඇතැම් විට දේශන 2 ක් අතර විවේක කාලයක් තිබිය හැකියි. විද්‍යාර්ථියාගේ විවේක කාලය සෑම පීඨයකම සෑම විද්‍යාර්ථියෙකුටම සමාන වන්නේ නැත. ඇතැම් විට පැයක වැනි අවම විවේක කාලයක්ද, ඇතැම් විය දිනකට පැය 8 පමණ විවේකයක්ද හිමිවිය හැකිය. මෙම පර්යේෂණය තුලින් විද්‍යාර්ථියා තමන්ගේ විවේක කාලය ප්‍රයෝජනවත් ලෙස යොදාගන්නවාද යන්නත් එම විවේක කාලය තුළ සිදුකරන ලද ක්‍රියාවලීන් ඔවුන්ගේ අධ්‍යයනයන්ට උපකාරී වේද යන්නත් සොයා බලා ඇත. මෙම පර්යේෂණය කැලණිය විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ දැනට පවතින විද්‍යා, වාණිජ හා කළමනාකරණ, මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයන්ගේ විද්‍යාර්ථීන් අතරින් දෙවන වසර සිසුන් 100ක නියැදියක් යොදා ගනිමින් සිදු කරන ලදී. මෙහිදී දත්ත ලබා ගැනීම සඳහා ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ ක්‍රමයක් වන සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලි ක්‍රමය යොදාගන්නා ලදි. විශ්ලේෂණය කිරීම සඳහා සංඛ්‍යානමය ශිල්පීය ක්‍රම යොදා ගත් අතර ප්‍රතිපායනය, සහසම්බන්ධතාවය, කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් හා විසිරීම පිළිබඳ මිනුම් භාවිත කර ඇත. අධ්‍යයනයට අනුව විද්‍යා පීඨයේ බහුතර විද්‍යාර්ථීන් පිරිසක් සාමාන්‍යවේදී උපාධිය හදාරන අතර ඔවුන් හට වැඩි විවේක කාලයක් හිමිවේ. වාණිජ හා කළමනාකරණ පීඨයන්හි සියලුම විද්‍යාර්ථීන් විශේෂවේදී උපාධි හදාරන අතර ඔවුන්ට තරමක් අඩු විවේක කාලයක් හිමිවන අතර මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයන්ගේ විද්‍යාර්ථීන්හට වැඩි විවේක කාලයක් හිමිවන බව පෙනී ගියේය. මෙහිදී විද්‍යා පීඨයේ විද්‍යාර්ථීන් අතරින් 80% පිරිසක් තමන්ගේ විවේක කාලය තම අධ්‍යයන කටයුතු සඳහාත්, 12% පිරිසක් ක්‍රීඩා කටයුතුවල නිරත වීමටත්, 8% වෙනත් කාර්යයන්වල නිරතවීම සඳහාත් යොදා ගන්නා බැව් හෙළිවිය. වාණිජ හා කළමනාකරණ පීඨයන්හි විද්‍යාර්ථීන් 52% පිරිසක් තමන්ගේ විවේක කාලය අමතර රැකියා (උපකාරක පන්ති වැනි) කිරීම සඳහාත්, 40% පිරිසක් ශිෂ්‍ය සංගම්වල කටයුතු කිරීම

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
wedamunisammani@gmail.com

සඳහාත්, 8% විද්‍යාර්ථීන් පිරිසක් අධ්‍යාපන කටයුතු සඳහාත් යොදා ගනී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයන්ගේ සිසුන්ගෙන් විශාල පිරිසක් එනම් 88% තමන්ගේ විවේක කාලය යහළුවන් සමඟ ගත කිරීමටත්, 8% පිරිසක් අන්තර්ජාලය භාවිතා කිරීමටත්, ඉතිරි පිරිස අධ්‍යාපන කටයුතු සඳහාත් යොදා ගන්නා බව අනාවරණය විය. මෙම පර්යේෂණය මඟින් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ විවේක කාලය ප්‍රයෝජනවත් ලෙස ගත කිරීම පීඨයන් මත පදනම් වන බව නිගමනය කල හැකි ය.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථීයා, පර්යේෂණය, විවේක කාලය, විශ්වවිද්‍යාලය*

# ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ගෘහ කුටුම්භයන්හි ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන සාධක

ජී.ආර්. මදුෂානි[1]

## සංක්ෂේපය

විශ්වීය වශයෙන් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම වර්තමානයේ දී සමස්ත ලෝක වාසීන්ගේම පොදු අරමුණක් බවට පත්ව ඇත. එය ජාත්‍යන්තර මට්ටමින්, ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් මෙන්ම කුටුම්භ මට්ටමින්ද නිරතුරු දැඩි අවධානයට ලක් වේ. ඕනෑම සමාජ මට්ටමක වූ ග්‍රාමීය හා නාගරික වශයෙන් වූ විභේදනය තුල ආහාර සුරක්ෂිතතාවයෙහි පැහැදිලි වෙනසක් හඳුනාගත හැකිය. එනිසා එම විභේදනය තුල ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපාන සමාජ හා ආර්ථික සාධකයන් වෙනසක් පවතීද යන්නත්, එලෙස වෙනසක් පවතී නම් ඒ සඳහා බලපාන සාධක හඳුනාගනිමින් ඒ සඳහා විසදුම් යෝජනා කිරීමත් මෙහි අරමුණ විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික අංශයන්හි ගෘහ කුටුම්භවල ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපාන සමාජ හා ආර්ථික සාධකයන් අතරෙහි වෙනසක් පවතීද යන්න ගැටලුව ලෙස යොදා ගනිමින් අධ්‍යයනය සිදු කෙරිණි. ආහාර නිෂ්පාදනය සඳහා සැලකිය යුතු ප්‍රමාණයක් ග්‍රාමීය අංශයෙන් දායාද වුවද ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල අනාරක්ෂිතතාවයෙන් සහ කුසගින්නෙන් පෙළෙන බහුතරය ග්‍රාමීය අංශය නියෝජනය කරන අතර ඔවුන් ආර්ථිකමය වශයෙන් පහල මට්ටමක පැවතීම නිසා ආහාර සුරක්ෂිතතාවය අභියෝගයට ලක් වුවද, නාගරික අංශයේ ආහාර සුරක්ෂිතතාවයද අභියෝගයට ලක් වන අවස්ථා පවතී. එය ආදායම් මට්ටම පමණක්ම මත සිදුවන්නක් නොවන බව පැහැදිලි වේ. ඒ අනුව ග්‍රාමීය හා නාගරික අංශ ලෙස පිළිවෙලින් හම්බන්තොට දිස්ත්‍රික්කය සහ ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින් ඔවුන්ගේ සමාජ ආර්ථික දත්තයන් මත පදනම් වෙමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. දත්ත විස්තරාත්මක ක්‍රමවේදය සහ කයිවර්ග පරීක්ෂාව යටතේ විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයන ප්‍රතිඵලයන්ට අනුව නාගරික හා ග්‍රාමීය අංශවල කුටුම්භයන්හි කුටුම්භයේ මුළු මාසික ආදායම, ජනගහන ව්‍යාප්තිය, පෞද්ගලික ඉඩම් ප්‍රමාණය, ආහාර හෝ වෙනත් සහනාධාර වල හිමිකම, කාන්තා අධ්‍යාපන මට්ටම (කුටුම්භය තුළ මවගේ හෝ බිරිඳගේ), නිවසින් පිටත ආහාර පරිභෝජනය, කුටුම්භයේ සෞඛ්‍යය තත්ත්වය, කුටුම්භයේ පරිභෝජන අවශ්‍යතාවන් කුටුම්භය තුළින්ම සපුරා ගැනීමේ ස්වභාවය, කුටුම්භයේ ආහාර විවිධාංගීකරණයේ ස්වරූපය, කුටුම්භයේ ආහාර අවශ්‍යතාවය ප්‍රමාණාත්මකව ලැබී ඇති/නැති බව ජාතික සැලසුම් හා ප්‍රතිපත්තිවල

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය.
madushanigrk@gmail.com

බලපෑම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විෂමතාවන් යනාදී වූ සමාජීය හා ආර්ථික සාධක ආහාර සුරක්ෂිතතාව සඳහා බලපා ඇති බව හඳුනා ගත හැකි විය.

**මූඛ්‍ය පද ඃ** *ආහාර සුරක්ෂිතතාවය, සමාජීය සාධක, ආර්ථික සාධක*

# විද්‍යාර්ථීන් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමේදී උච්චාරණයේ ඇති ගැටලු පිළිබඳ විමර්ශනයක්

## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

එස්.සී. ලසන්ති[1]

**සංක්ෂේපය**

විද්‍යාර්ථීන්, ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ දී එය භාවිතයේ දී මුහුණපාන ගැටලුවක් වන උච්චාරණයේ ඇති අපහසුතාවය පිළිබඳව කැලණිය විශ්වවිද්‍යාලයී සිසුන් 100ක් ඇසුරින් ලබාගත් සසම්භාවී නියැදියක් මඟින් මෙම අධ්‍යයනය කරන ලදි. මේ සඳහා බලපාන්නේ කිනම් සාධකයන් ද යන්න සොයා බැලීම මෙහි මූලික පරමාර්ථය වූ අතර සෙසු අරමුණ වූයේ ඉංග්‍රීසි භාෂාව භාවිතයට විශ්වවිද්‍යාලය ගෙන ඇති පියවරවල ක්‍රමවත්භාවය විමර්ශනය කිරිමයි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත යොදාගත් අතර ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් දත්ත රැස් කරන ලදී. පරීක්ෂණයේ දී ලැබූ දත්ත ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රම මඟින් විශ්ලේෂණය කල අතර එහිදී සමාජීය විද්‍යා, මානව ශාස්ත්‍ර පීඨවල විද්‍යාර්ථීන්ගෙන් 35% ක පමණ ප්‍රමාණයක් ද විද්‍යා, වාණිජ හා කළමනාකරණ පීඨ විද්‍යාර්ථීන් එම සිසුන්ට වඩා යහපත් මට්ටමක් පෙන්වමින් ඔවුන්ගෙන් 20% ක පමණ ප්‍රමාණයක් ද උච්චාරණයේ අපහසුතාවයෙන් යුතු පිරිසක් බව හෙළිවිය. මේ සඳහා බලපෑ හේතු පිරික්සීමේ දී විද්‍යාර්ථීන්, ප්‍රථම වසර තුළ ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීම අනිවාර්යය කොට තිබුණ ද ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම ඔවුන්ගේ මූලික පරමාර්ථය නොවන අතර උපාධිය සම්පූර්ණ කිරීමට මෙය අමතර සුදුසුකමක් හෙයින් එම නිසා දේශනවලට සහභාගී වන බවත් හෙළි විය. එසේම දේශන කිහිපයක් ඉංග්‍රීසියෙන් පැවැත්වුව ද ඉන් මෙම භාෂා උච්චාරණ හැකියාවට පිටිවහලක් නොවන බව පැහැදිලි විය. අධ්‍යයනයේ සොයාගැනීම් වලට අනුව ඉංග්‍රීසි භාෂා උච්චාරණ අපහසුතාවයට මූලිකම හේතුව භාෂාවේ ප්‍රායෝගිකත්වය හෙවත් නිතර නිතර භාවිතයක් නොමැතිකම මෙන්ම එම පහසුකම් නිසිලෙස ප්‍රයෝජනයට නොගැනීම බව හෙළි විය. එමෙන්ම භාෂා හැකියාව සිසුන් තුළ ප්‍රගුණ කිරීම උදෙසා විශ්වවිද්‍යාලය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් හි ක්‍රමවත්භාවයේ පවතින අඩුපාඩු දැකගත පවත්නා බැව් තහවුරු විය. මෙම දුර්වලතා මග හරවා ගැනීමට ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම අවුරුදු 3 හා 4 ඇතුළත අනිවාර්ය කිරීමත් දේශන මාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීමත් ඒ සඳහා ඇති පහසුකම් තවත් පුළුල් කිරීමට විශ්වවිද්‍යාලය ගෙන ඇති පියවර තවත් ක්‍රමවත් කිරීමත් ආදිය යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.

**මුඛ්‍ය පද :** *ඉංග්‍රීසි භාෂාව, විද්‍යාර්ථියා, උච්චාරණය, විශ්වවිද්‍යාලය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
chathusenevirathne93@gmail.com

# අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේදී මතුවන ගැටලු
## (වවුනියාව දිස්ත්‍රික්කය ඇසුරෙන් )

වී.ටි කුලසූරිය[1]          එම්.කේ. නදීකා දමයන්ති[2]

**සංක්ෂේපය**

ස්වාභාවික උවදුරකින් හෝ මානව ක්‍රියාවලියකින් අවතැන් වු ජනතාව නැවත පදිංචිකිරීම බොහෝමයක් රටවල දැඩි කතාබහට ලක්වන මාතෘකාවක් වන අතර මෙය ක්‍රියාවලියක් වශයෙන් ලෙබනනය, ඉරාකය, සුඩානය, සිම්බාබ්වේ යනාදි බොහෝ රාජ්‍යයන්වල ක්‍රියාත්මකවේ. බොහෝ රටවල නැවත පදිංචි ක්‍රියාවලිය තුළ ගැටලුකාරි තත්ත්වයන් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය නිසා නැවත පදිංචිකරවීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී උතුරු නැගෙනහිර ප්‍රදේශ පිළිබඳව ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමේදී ද දැඩි අවධානයක් යොමු වී ඇත. සිවිල් යුද්ධය නිමාවීමෙන් පසු අවතැන්වූවන් නැවත තම ගම්බිම් කරා පැමිණිය ද ඔවුන් නැවත පදිංචිකිරීමේ දි ඔවුන්ගේ ගැටලු සම්පූර්ණයෙන්ම නොවිසඳී ඇති ආකාරයක් දැකගත හැකිවේ. මෙහිදි ඉඩම් අයිතිය පිළිබඳ ගැටලු මෙන්ම වෙනත් ගැටලු ද පැනනැගී ඇතිබව එදිනෙදා සාකච්ඡාවලදී මතුවේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණවන්නේ නැවත පදිංචිකරවීමේ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදි මතුව ඇති ගැටලු මොනවාද? එම ගැටලු උද්ගතවී ඇත්තේ කෙසේද? යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු රැස්කිරීමේ දි ප්‍රාථමික හා ද්විතීයික දත්ත යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස්කිරීම ප්‍රශ්නාවලික්‍රමය හා සම්මුඛ සාකච්ඡා මඟින් ද, ද්විතියික දත්ත රැස්කිරීම වාර්ෂික වාර්තා, පුවත්පත් ලිපි, අන්තර්ජාලය ආදිය ද භාවිතා කරන ලදි. මෙහිදි අධ්‍යයන ප්‍රදේශය වශයෙන් උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නැවත පදිංචිකිරීමේ ගම්මාන අතුරින් පන්රිකෙයිදකුලම, බෝගස්වැව, මල්මඩුව හා ආසිකුලම යන ගම්මාන තෝරාගෙන එම ගම්මානවලින් ගමකින් පවුල් විස්සක් බැගින් නියැදිය සඳහා පවුල් 80ක් අහඹු ලෙස තෝරා ගැණිනි. අධ්‍යයනයේ දත්ත හා තොරතුරු විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත දෙවර්ගයම භාවිතාකරන ලදී. ප්‍රමාණාත්මක දත්ත ප්‍රස්තාර, වගු, ප්‍රතිශත ආදී සරල සංඛ්‍යානමය විධික්‍රම භාවිතාකරමින් විශ්ලේෂණය කෙරිණි. ගුණාත්මක දත්ත විශ්ලේෂණය කරනු ලැබුවේ විස්තරාත්මක ක්‍රමවේදය අනුවය. වවුනියාව දිස්ත්‍රික්කයේ නැවත පදිංචිකරවීමේදි පැන නඟින ගැටලු වශයෙන් නැවත පදිංචි වු ජනතාවගේ ජීවන මාර්ග අහිමිවීම (23%), යටිතල පහසුකම් සංවර්ධනය කරනොතිබීම (48%), නිවාස ලබානොදීම (35%)යන ගැටලු ප්‍රමුඛවේ. මේ සඳහා බලපා ඇති හේතු වශයෙන් කෘෂිකර්මාන්තය ජීවනෝපය කරගත් ජනකොටසක් කෘෂිකාර්මික

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

ඉඩම් නොමැති ප්‍රදේශවල පදිංචිකරවීම වැනි ජනතාවගේ ගැටලු නිසි පරිදි අධ්‍යයනය නොකොට අවතැන්වීමේ ගැටලුවට පිළියම් යෙදීමට උත්සාහ කිරීම පෙන්වා දියහැක.

**මුඛ්‍ය පද :** *අවතැන්වීම, නැවත පදිංචිකිරීම, වවුනියාව දිස්ත්‍රික්කය, ජීවනෝපාය මාර්ග, යටිතල පහසුකම්*

# The awareness of E-waste disposal Mechanism in Colombo District, Sri Lanka

M.N. Jayawardhana[1] K.P.K. Dulani[2]
K.M.R.R. Muhandiramge[3] D.S. Kodithuwakku[4]
H.L.N.Himanshi[5]

## Abstract

Electronic waste (e-waste) is one of the fastest-growing pollution problems worldwide given the presence of a variety of toxic substances, which contaminate the environment and threaten human health. With the technological development, usage of electronic equipment are increased. Nevertheless, the awareness of use of E-waste is yet to be investigated. Therefore, this research, investigate, awareness level of E-waste disposal mechanism in Sri Lanka. The total sample were 400 of people, randomly selected from the Colombo to identify the awareness level of e-waste and e-waste disposal mechanism. Data collected from the online-based questionnaires' distributed to sample aged between 15 to 55 years. The multiple regression analysis performed to analysis identify the awareness level of E-waste dispose mechanism., Awareness level ranked from 0 to 10 and zero was least awareness level and the 10 was the highest. The study revealed that 65% of people are in the level of below 3 which indicate least awareness of E-waste disposal while 3% represented the highest level. Many methods can use to improve the awareness level of e-waste However; improvement of technological literacy will be oracular method of enhancing the E-waste disposal.

**Key Words :** *E-waste, Technological development, Environment pollution*

---

[1] B.A (Special) Social Statistics, University of Kelaniya, kitmnj@gmail.com
[2] B.A (Special) Social Statistics, University of Kelaniya, kinsi.gt@gamil.com
[3] B.A (Special) Social Statistics, University of Kelaniya, rashiravihari@gmail.com
[4] B.A (Special) Social Statistics, University of Kelaniya, dilukodi@gmail.com
[5] B.A (Special) Statistics, Sabaragamuwa University of Sri Lanka, nishihimanshi@gmail.com

# උපකාරක පංති මඟින් සිදුවන සමාජීය බලපෑම
## (කුරුණෑගල නගරය ඇසුරින්)

යූ.පී.පී.එස් සමරනායක[1]

**සංක්ෂේපය**

වර්තමානයේ දී, අධ්‍යාපනය යනු මිනිසෙකු විසින් ජීවිතයේ ලැබිය යුතු අනිවාර්ය අංගයක් වී ඇත. නමුත් අතීතය ගැන සලකා බලන විට අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් වූයේ, ආගමික සිද්ධස්ථාන ය. විශේෂයෙන් බෞද්ධ රටක් වන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ මූලාස්ථානය වූයේ, පන්සල ය. නමුත් බටහිර ජාතීන්ගේ ආගමනයත් සමගම මෙම තත්ත්වය වෙනස් වන්නට විය. එනම් ඔවුන්ගේ ප්‍රතිසංස්කරණ වලට අනුව, ලංකාවේ මෙතෙක් වූ අධ්‍යාපන රටාව සීඝ්‍රයෙන් වෙනස් වන්නට විය. පාසල් මූලික අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දෙන්නට විය. මුල්කාලීන ව මෙම පාසල් අධ්‍යාපනය සිසුන් හට අවශ්‍ය තරමටත් වඩා ප්‍රමාණවත් විය. නමුත් වර්තමානය වන විට සිසුන් හට තරගකාරී අධ්‍යාපන රටාවකට මුහුණ දීමට සිදුවී ඇත. ඒ තුළ ඔවුහු පාසල් අධ්‍යාපනයට පමණක් සීමා නොවී උපකාරක පංති කෙරෙහි යොමු වී තිබේ. නමුත් මෙම උපකාරක පංති සංස්කෘතිය පාසල් අධ්‍යාපන රටාව වෙනස්කර ඇත. මෙම වෙනස් වීම අධ්‍යයන ගැටලුව ලෙස යොදා ගනිමින් උපකාරක පංති මඟින් සිදුවන බලපෑම පිළිබඳ මෙම අධ්‍යයනය මඟින් විමර්ශනය කර ඇත. අධ්‍යයන සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත යොදා ගත් අතර කුරුණෑගල නගර සීමාවේ  පුද්ගලයින් 100 කින්, යුත් සසම්භාවී නියැදියක් යොදාගන්නා ලදී. අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් හා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් දත්ත රැස්කර ගෙන ඇත. නියැදියට අයත් වූයේ, කුරුණෑගල නගරයේ මධ්‍යම බස්නැවතුම්පොළ අසල පිහිටි වෙළෙඳසැල් හිමියන්, බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන්, චිත්‍රපට ශාලා හිමියන් හා ඒ අසල වෙළෙඳසැල් හිමියන්, උපකාරක පංති මෙහෙයවන ගුරුවරුන් හා එම ආයතනික හිමිකරුවන් ය. මීට අමතරව ද්විතීයික මූලාශ්‍ර වන සඟරා, පුවත්පත් හා අන්තර්ජාලය ඇසුරින් ද්විතීයික දත්ත ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදී. විශේෂයෙන් ම අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ගෙන් 92% ක් ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය ලබා ගන්නේ උපකාරක පංති වල අධාරයෙනි. සිසුන්ගෙන් 55% ක් උපකාරක පංති වෙත යොමු වී ඇත්තේ, අධ්‍යාපනය ලැබීමේ අරමුණෙන් වන අතර 37% ක් විලාසිතාවක් ලෙස හෝ නිවසින් නිදහසක් ලබා ගැනීමට හෝ වෙනත් අරමුණු මූලික කරගෙන  ය. එම තත්ත්වය නිසා උපකාරක පංති සංස්කෘතිය සමාජය තුළ ගැටළු රැසක් උත්පාදනය කර ඇත. එනම් උපකාරක පංති සංස්කෘතිය විසින් සමාජය තුළ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය.
prabodhasubha@gmail.com

වූවන්, ජීවිත විනාශ කර ගත්තන්, ළමා ගණිකාවන්, විවිධ රෝගවලට භාජනය වූවන්, හා තම අධ්‍යාපනය අත්හැර දැමූවන් වැනි නොයෙකුත් විෂමාචාර ක්‍රියාවන් සඳහා සානුබලයක් සපයා ඇති බැව් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *උපකාරක පංති, අධ්‍යාපනය, සිසුන්, සමාජයීය බලපෑම*

# විශ්වවිද්‍යාල සිසුන්ගේ පෝෂණය හා සෞඛ්‍යය පිළිබඳ අධ්‍යයනයක්
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

කේ. එන්. සමරසිංහ[1]

**සංක්ෂේපය**

පුද්ගලයෙකුට යහපත් දිවිපෙවෙතක් සඳහා නිරෝගිමත් බව වැදගත් වේ. වෛද්‍ය විද්‍යාව තුල නිරෝගිමත් දිවියක් උදෙසා පෝෂණයේ හා යහපත් සෞඛ්‍යය පුරුදුවල වැදගත්කම අවධාරණය කෙරේ. විශේෂයෙන්ම රටක තාරුණ්‍යයේ සෞඛ්‍යය සම්පන්න බව එරටෙහි අනාගතය තීරණය කිරීමෙහිලා වැදගත් සාධකයකි. එහිදි විශ්වවිද්‍යාල ශිෂ්‍යයා නිසි පෝෂණයක් ලබනවාද? යහපත් සෞඛ්‍යය පුරුදු අනුගමනය කරනවාද? යන්න ගැටළුවක් පැනනඟී. ඒ අනුව විද්‍යාර්ථියාගේ පෝෂණය හා සෞඛ්‍යය තත්ත්වය පිළිබඳව අවධානය යොමු කිරිම අධ්‍යයනයේ අරමුණ විය. අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨයන් නියෝජනය වන පරිදි දෙවන හා තෙවන වසර වල සිසුන් 150 ක සසම්භාවී නියැදියක් තෝරාගෙන ඔවුන්ගේ ආහාර රටාව, ක්‍රීඩා කටයුතු, මත්ද්‍රව්‍ය භාවතය, ආදරය හා ලිංගිකත්වය පිළිබඳව ප්‍රශ්නාවලි ක්‍රමය හරහා රැස්කර ගත් ප්‍රාථමික දත්ත, සංඛ්‍යානමය ශිල්ප ක්‍රම මඟින් විශ්ලේෂණයට භාජනය කරන ලදි. මේ අනුව 85%ක බහුතරයක් විද්‍යාර්ථීන් උදෑසන ආහාර වේල නොගන්නා අතර එසේ ගන්නේ නම් ඒ ඉතා ප්‍රමාද වී බව අනාවරණය විය. විශ්වවිද්‍යාලය අවට පවතින ආපනශාලා වලට සාපේක්ෂව විද්‍යාර්ථීන්, විශ්වවිද්‍යාලය තුළ පවතින ආපනශාලා භාවිතා කරන අතර ආපනශාලා වල පවතින ආහාර වල ගුණාත්මකබව පිළිබඳව විද්‍යාර්ථීයා තුළ පවතින්නේ ඍණාත්මක ආකල්පයකි. නේවාසිකාගාරවල සිටින සිසුන්ගෙන් 56% ක ප්‍රතිශතයක් තම ආහාර වේල තමන්ම සකසා ගැනිමට යොමු වීම විශේෂත්වයකි. විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා කටයුතු සදහා යොමු වී ඇති අය අතරින් 57% බහුතරය, විද්‍යා පීඨයට අයත් ශිෂ්‍යයන් වීම කැපීපෙනුණ ලක්ෂණයකි. තවද ශිෂ්‍යයන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ ප්‍රවණතාවය වැඩි අතර නේවාසිකාගාරවල සිටින පිරිමි ළමුන් මේ සඳහා වැඩි වශයෙන් යොමු වීමත් ඊට අවශ්‍ය පරිසරය නිර්මාණය වී ඇති බව අනාවරණය විය. ආදරය හා ලිංගික ජීවිතය පිළිබඳව, ඔවුන් තෘප්තිමත් බව පෙනේ. ආමාශගත රෝග, ගැස්ට්‍රයිටීස්, උදාරාබාධ හා ආතතිය, පීඩනය වැනි තත්වයන් විද්‍යාර්ථීන් අතර සුලභව දක්නට ලැබෙන රෝගී තත්වයන් වු අතර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය හා එහි කාර්යභාරය පිළිබඳව ශිෂ්‍ය මතය සතුටුදායක නොවූ අතරම විශ්වවිද්‍යාලයේ හා නේවාසිකාගාරවල පවතින සනීපාරක්ෂක පහසුකම්වල දුර්වලතා ඇති බැව් අනාවරණය විය. කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් මූලික කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකළද, අනෙකුත් විශ්වවිද්‍යාල වල පවතින පහසුකම් හා අවට පරිසර සාධක මත මෙම දත්තවල

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
kaushisamarasinghe90@gmail.com

යම් යම් වෙනස්කම් සිදු විය හැකි වුවද, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විද්‍යාර්ථීයා නිසි පෝෂණයෙන් හා යහපත් සෞඛ්‍යය පුරුදු වලින් දුරස්ථ බව නිගමනය කල හැකිය. සුවැති තාරුණ්‍යයක් සඳහා විද්‍යාර්ථීයා තුල ආකල්පමය වෙනසක් ඇති කිරිම හා විශ්වවිද්‍යාලය තුල යහපත් පරිසරයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය අධ්‍යයනය මගින් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** *පෝෂණය , සෞඛ්‍යය පුරුදු, විද්‍යාර්ථීයා, විශ්වවිද්‍යාලය*

# විශ්වවිද්‍යාල නවක වදය හා සම්බන්ධව ඇති නීතිමය ක්‍රියාමාර්ග
## ( කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

එච්.ඩී.පී. මධුෂානි[1] ඩබ්.වී.පී.එම්. නයෝමි[2]
ඩී.එම්.එච්. දසනායක[3] එල්.ජී.ඩී. පෙරේරා[4]

**සංක්ෂේපය**

පසුගිය දස අවුරුදු කාලය තුළ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තුළ විවිධ මුහුණුවරින් නවකවදය ක්‍රියාත්මක වී ඇත. මෙම කාල පරිච්ඡේදයන් තුළ නවකවදය විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් මුලිනුපුටා දැමීමට නොහැකි විය. එයට හේතුවක් ලෙස ගත හැකි වනුයේ නවකවදයට ගොදුරු වූ බොහෝ පිරිසක් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් බවට පත් වූ විගසම එම ආභාෂය අනුගමනය කිරීම හා රැඩිකල් දේශපාලන කණ්ඩායම් නවකවදය දේශපාලන ආයුධයක් බවට පත් කරගෙන නවක ශිෂ්‍යයන් පාලනය කිරීමයි. මෙම තත්ත්වයන් මත විශ්වවිද්‍යාල අධ්‍යාපනයට නවකවදය බාධාවක්ද යන්න අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන අතර නවකවදය හා සම්බන්ධව ඇති නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව විශ්වවිද්‍යාල සිසුන්ගේ ඇති දැනුවත්භාවය පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. නවකවදය ක්‍රියාවලිය මුලිනපුටා දැමීමට ශ්‍රී ලංකා රජය සහ විශ්වවිද්‍යාල කොමිෂන් සභාව මගින් විවිධ නීතී අණපනත් රෙගුලාසි පනවා ඇත. 1998 අංක 20 දරණ පනත ඒ අතර වැදගත් වේ. පනත්වල පවත්නා අඩුපාඩු හා එහි ප්‍රායෝගික භාවිතය නවකවදය මුලිනපුටා දැමීමට බාධාවක් වී ඇත. අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියලු පීඨ නියෝජනය වන පරිදි සිසුන් 100 ක නියැදියක් තෝරා ගන්නා ලදී. එසේම කිරිබත්ගොඩ, පැලියගොඩ පොලිස් ස්ථානාධිපතිවරුන් සමග කළ සම්මුඛ සාකච්ඡා මගින් ද ප්‍රාථමික දත්ත රැස්කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක ශිල්ප ක්‍රම යොදාගත් අතර එහිදී හෙළි වූ ප්‍රධාන කරුණක් වූයේ නවකවදය හා සම්බන්ධව ඇති මූලික නීති කිහිපයක් හැරුණු විට බහුතරය පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බවත් පීඨ අතරින් ගත් කළ වැඩි දැනුවත්භාවයක් කලා පීඨ සිසුන් සතු බවත් ය. නවකවදය හා සම්බන්ධව ඇති නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව ඇති දැනුවත්භාවය මත නවකවදය ඇති වීම හෝ නොවීම තීරණය නොවන බව මෙහිදී හෙළි විය. එසේම නවකවද පනතේ ඇති දුර්වලතා නිසා නවකවදය තවදුරටත් ක්‍රියාත්මක වන බව තහවුරු විය. නවකවදයේ වූ දරුණු ප්‍රචණ්ඩ පැතිකඩ නැතිකර දමමින් එය යහපත් ස්වරූපයකින් පවත්වා ගැනීමට නවකවදය හා සම්බන්ධව

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය, pavithrahdm@gmail.com
[2]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය,wickramasinghe.mahesha@yahoo.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය, harshanidasanayake1991@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, gdinusha.perera@gmail.com

ඇති නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව ඇති දැනුවත්භාවය යොදා ගැනීම හා නවකවද පනතේ ඇති දුර්වලතා අවම කර සංශෝධනය කිරීම සිදුකළ යුතුය.

**මූඛ්‍ය පද :** ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල, නවකවදය, නවකවදපනත, අධ්‍යාපනය

# කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ගැටලු (කෑගල්ල දිස්ත්‍රික්කය ඇසුරින්)

එච්.ඒ.එස් සාරංග හෙට්ටිආරච්චි[1]

**සංක්ෂේපය**

කෘෂි නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලිය තුළ වගා කිරීමේදීත්, නිෂ්පාදන අලෙවි කිරිමේදීත්, පරිභෝජනය කිරීමේදිත් යම් යම් ගැටලු උද්ගත කරන බව එදිනෙදා සාකච්ඡාවන්හිදී වාර්තා වේ. විශේෂයෙන්ම වී අලෙවි කිරීමේදී ගොවියාත් සහල් මිලදී ගැනීමේදී පාරිභෝගිකයාත් විවිධ ගැටලුවලට මුහුණ දෙයි. එනම් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම තුළ ඒවා එකිනෙකට නොගැලපෙන බව පූර්ව පර්යේෂණ තුළින් අනාවරණය කර ඇත. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වූයේ රාජ්‍ය අංශයෙන් වී මිලට ගැනීමේ ප්‍රතිපත්තියක් රටේ ක්‍රියාත්මක වුව ද සහල් පරිභෝජනයේදී ජනතාවට ගැටලු උද්ගත කරනු ලබන්නේද? එසේනම් ඒ මොනවාද යන්න හඳුනා ගැනීමයි. එහිදී පාරිභෝගික ජනතාවගේ ගැටලු අධ්‍යයනය කිරීම සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ 103 බී මාපිටිගම වසම යොදා ගැණිනි. අධ්‍යයනයේ නියැදි ඒකක දෙක සදහා අහඹු ලෙස තෝරාගත් පවුල් සියයක් ඇතුළත් වූ අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැණිනි. එමෙන්ම ලබා ගත් ඇතැම් තොරතුරු නිරීක්ෂණ මගින් මෙන්ම මූලික තොරතුරු සපයන්නන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා තුළින් තහවුරු කර ගැණිනි. සහල් මිලදී ගැනිමේ රාජ්‍ය ප්‍රතිපත්තියේ පවතින ගැටලු රාශියක් අධ්‍යයනයෙන් අනාවරණය විය. ඒ අතර ප්‍රධාන වශයෙන් සහල් මිලදී ගැනිමේ දී පාරිභෝගිකයාට ගුණාත්මක තත්ත්වයේ සහල් අඩු මිලකට වෙළඳපොළ තුළින් ලබාගත නොහැකි වීමයි (67.2%). විශේෂයෙන්ම සහල් නිෂ්පාදනය කරන රටක් වුවද මෙලෙස සහල් මිලදී ගැනීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බවත්, එකම සහල් වර්ගය වුවද එකිනෙකට මිල වෙනස්වන බවත් (27.8%). ඒ නිසා පාරිභෝගිකයන් ගැටලු නිසා සහල් මිලදී ගැනීමේ දී ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ සමාන ඉඩ ප්‍රස්ථා සියලු පාරිභෝගිකයන්ට නොමැති බව හඳුනා ගත හැකිය.

**මුඛ්‍ය පද :** *සහල් පරිභෝජනය, රාජ්‍ය ප්‍රතිපත්තිය, කෑගල්ල දිස්ත්‍රික්කය, පාරිභෝගිකයන්*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය,
damayanthi@kln.ac.lk

# The Millennium Development Goals and Sri Lanka

H.D.P. Madushani[1]

## Abstract

The Millennium Development Goals (MDGs) are targeted at eradicating extreme hunger and poverty in the 189 member countries of the United Nations (UN). The main problem of this study is whether 189 member countries have been reach the MDGs or not? This article examines progress of Sri Lanka, steps that should be taken for achieving MGD goals and comparing Sri Lanka's position with other South Asian countries. This study is based on the secondary data from Central Bank Reports and Country Reports. Parametric method were used to analyze this data. Whilst the deadline for achieving the MDGs looms large, the outcomes so far have been mixed. Sri Lanka seems to be among the countries which will be able to achieve several of the MDGs, Due to the heavy emphasis on social development investments. Some of our findings are in Sri Lanka the proportion of pupils starting Grade 1 who reach Grade 5 has increased to almost 100% in 2006/07, extraordinarily successful in reducing child mortality over the last half century. At its current level of 11.3 infant deaths per 1,000 live births. Sri Lanka achieved a middle-income country status, and has done well, with the highest Human Development Index rank in South Asia in 2011. The conclusion is that Sri Lanka has achieved MDGs fairly well especially among South Asian countries, Eradicating extreme poverty and hunger, achieving universal primary education and promoting health services have achieved well before the target dates. Therefore we should have given attention to MDGs that Sri Lanka would have achieved and the future plans under the MDGs.

**Key Words** : *MDGs, Sri Lanka, South Asia*

[1] B.A (Special) Social Statistics, University of Kelaniya
pavithrahdm@gmail.com

# ශ්‍රී ලංකාවේ මැතිවරණවලදී ග්‍රාමීය ජනතාවගේ සහභාගීත්වය

එම්.පී.ඒ.ඩබ්. පතිරාජ[1]

## සංක්ෂේපය

ලාංකීය ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් ග්‍රාමීය ජනතාව නියෝජනය කරන අතර එය මෙරට මැතිවරණ ප්‍රතිඵලයට සැලකිය යුතු බලපෑමක් කරනු ඇත. ග්‍රාමීය ජනතාවගේ දේශපාලන සහභාගීත්වය ඒ නිසාම මෙරට මැතිවරණය සඳහා වැදගත් වනු ඇත. මෙම අධ්‍යයනයෙහි අරමුණ වන්නේ මැතිවරණය කෙරෙහි බලපානු ලබන ග්‍රාමීය ජනතාවගේ ආකල්ප පිළිබඳ හඳුනාගැනීමයි. ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත මූලික වශයෙන් යොදාගන්නා අතර, දත්ත විශ්ලේෂණය සඳහා SPSS ක්‍රමවේදය භාවිතා කර ඇත. මෙහිදී සමස්තය දෙස අවධානය යොමුකළ විට බහුතරයක් ග්‍රාමීය ජනතාව ඓතිහාසික දේශපාලනය පිළිබඳ සතුටුවන බවත්, මැතිවරණ වලදී ග්‍රාමීය ජනතාවගේ දේශපාලන සහභාගීත්වය කෙරෙහි සමාජ, සංස්කෘතික සහ ආර්ථික යන සාධක බලපාන බවත්, ලංකාවේ බහුතර ග්‍රාමීය ප්‍රජාව සමස්තයක් ලෙස නූතන දේශපාලනය පිළිබඳ අසතුටින් පසුවන බවත්, පොදුවේ ගමට හා රටට ලැබී ඇති ප්‍රතිලාභ සලකා ඓතිහාසික දේශපාලනයෙන් ලැබී ඇති ප්‍රතිලාභ පිළිබඳ බහුතරයක් ග්‍රාමීය ප්‍රජාව සතුටුවන බවත් පෙනේ. වර්තමානයේදී ග්‍රාමීය ප්‍රජාව මනා අවබෝධයකින් යුතුව සක්‍රීය දේශපාලනයට සහභාගී වීම සවිඥානිකව සිදුවන බව පෙනේ.

**මූඛ්‍ය පද :** *දේශපාලන ඉතිහාසය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මැතිවරණ ක්‍රමය, ප්‍රජාව, තරඟය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය
ayeshani128@gmail.com

# රබර් වගාවේ මෑත කාලීන ප්‍රවණතා

කේ.ඒ.එස්.ආර්. කුලසිංහ[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව තුළ අපනයන ප්‍රමුඛ කෘෂිකාර්මික බෝග අතරින් රබර් වගාවට ප්‍රධාන තැනක් හිමිවේ. අද වන විට රබර් වගාව දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ රබර් නිෂ්පාදනය අඛණ්ඩව පහළ යෑමේ ගැටලුවට මුහුණ දී ඇති බවයි. මෙම තත්වය මගහරවා ගනිමින් රබර් නිෂ්පාදනයේ වර්ධනය පිළිබඳ අධ්‍යනය කිරීම මෙහි අරමුණ වී ඇත. ඒ අනුව 2014 වාර්ෂික මහ බැංකු වාර්තාව, 2007-2013 දක්වා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන වාර්තා මූලාශ කොට ගනිමින් ද්විතියික දත්ත මගින් කාල ශ්‍රේණි වැනි විශ්ලේෂණ ක්‍රමවේදයන් ඔස්සේ දත්ත විශ්ලේෂණය කොට ඇත. රබර් වගාව සඳහා එල්ල වී ඇති තර්ජන අතරින් ඒ සඳහා යොදා ගැනෙන භූමි ප්‍රමාණය පහළ යෑම, ශ්‍රම හිඟය බලපාන අතරම ජාත්‍යන්තර වෙළෙඳපොලේ පවතින දැඩි තරඟකාරීත්වය, කාර්මික රටවල් කෘත්‍රිම රබර් නිෂ්පාදනයට යොමු වීම, ප්‍රතිචක්‍රීකරණය තුළින් නැවත නැවතත් රබර් භාවිතයට යොමුවීම ප්‍රධාන වේ. මෙවැනි තත්වයන් හේතු කොටගෙන රබර් වගාකරුවා වෙනත් වගාවන් කෙරෙහි නැඹුරු වී ඇත. එම තත්වය මගහරවා ගැනීම සඳහා රජය විසින් විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇති අතර එහිදී සාම්ප්‍රදායික රබර් වගා ප්‍රදේශවලින් ඔබ්බට අම්පාර, මුලතිව්, වව්නියාව වැනි ප්‍රදේශ දක්වා ද රබර් වගාව ව්‍යාප්ත කෙරිණි. එමෙන්ම රබර් වගාව සඳහා පොහොර සහනාධාර ලබා දීම, නව වගාවන් හා නැවත වගාවන් සඳහා සහනාධාර ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ද ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම, අපනයන නිෂ්පාදන ගම්මාන පිහිටුවීම, විදේශ රටවල් සමඟ වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම වැනි ක්‍රියාමාර්ග රජය විසින් ගෙන ඇත. තවදුරටත් ශ්‍රී ලාංකික රබර් අපනයනය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් මෙරට තුළ රබර් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග කිහිපයක් හඳුනාගත හැකිය. රබර් වගා භූමි වෙනත් වගා සඳහා යොදාගැනීම පාලනය සඳහා නීති හා අණපනත් ගෙන ඒම, කුඩා ප්‍රමාණයකින් වැඩි අස්වැන්නක් ලබාදෙන රබර් වර්ග හදුන්වාදීම, රබර් අස්වැන්න රාජ්‍ය මැදිහත් වීමෙන් මිලදී ගැනීම හා සහතික මිලක් ලබාදීම තුළින් වගාකරුවන් දිරිමත් කිරීම, රබර් වගාව තුළ යටි වගාව තුළින් අමතර ආදායමක් ලබා ගැනීමට රබර් වගාකරුවන් දැනුවත් කිරීම, රබර් නිෂ්පාදන සම්බන්ධ දියුණු යන්ත්‍ර සූත්‍ර හඳුන්වාදීම හා ස්වාභාවික රබර් අපනයනය වෙනුවට රබර් නිෂ්පාදන අපනයනය පිළිබඳ දිරිගැන්වීම දැක්විය හැකිය. මෙසේ රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ඉහළ විදේශ විනිමයක් රට තුළට ගෙන්වා ගැනීමට කටයුතු කළ හැකිය. මේ අනුව නිගමනය කළ හැක්කේ රබර්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
sithara.kulasinghe@yahoo.com

වගාව ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයමින් නොයෙකුත් බාධක හමුවේ මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන බෝගයක් ලෙසයි.

**මූඛ්‍ය පද :** *රබර් වගාව, නිෂ්පාදනය, අපනයන, ආර්ථික*

# ප්‍රවාහන ක්‍රම හා වායු දූෂණය
## (ශ්‍රී ලංකාව ඇසුරින්)

එච්.ඩී.පී. මධුෂාණි[1] ඩබ්.වී.පී.එම්. නයෝමි[2]
ඩී.එම්.එච්. දසනායක[3] එල්.ජී.ඩී. පෙරේරා[4]

**සංක්ෂේපය**

වාහන ආනයන බදු පහල යාමත් සමග පසුගිය වර්ෂයේ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද වාහන ප්‍රමාණය ඉතා විශාල විය. ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද වාහන ප්‍රමාණය ඉහළයාම නිසා රටේ සාමාජ, ආර්ථික ගැටලු ඇති වූයේ ද යන්න මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වේ. බොහෝ පර්යේෂකයින්ගේ අවධානයට යොමු වූයේ මාර්ග තදබද ගැටලුව පිළිබඳව පමණක් වන අතර මෙම අධ්‍යයන ගැටලුව සම්බන්ධ වැඩි අවධානයක් යොමු නොවී ඇත. එම හිඩැස පිරවීම සඳහා වැඩි අවධානයක් යොමු නොවුන නමදු ඉතා විශාල පෞද්ගලික වාහන ප්‍රමාණය නිසාවෙන් වැඩි අවදානමක් සිදුවන්නා වූ වායු දූෂණය හා එහි බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. අධ්‍යයනය සඳහා ද්විතියික මූලාශ්‍රයන් මඟින් දත්ත රැස් කරන ලදී. ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා පරිසර අමාත්‍යාංශය මගින් නකුිත් කරන ලද දත්තයන් භාවිතා කර ඇත. පරාමිතික, අපරාමිතික පරීක්ෂා මඟින් දත්ත විශ්ලේෂණය කර ගන්නා ලදී. අධ්‍යයනයට අනුව පොදු බස් රථයක් මඟන් දිනකට විමෝචනය කරන ලද $CO_2$ ප්‍රමාණය මෙන් පස් ගුණයක් මෝටර් කාරයකින් විමෝචනය කරයි. එමෙන් ම දුම්රිය මගින් දිනකට විමෝචනය කරන ලද $CO_2$ ප්‍රමාණය මෙන් විසි ගුණයක් මෝටර් කාර් මඟින් විමෝචනය කරයි. වර්තමානයේ පෞද්ගලික මෝටර් රථ ප්‍රමාණය, අධික ලෙස වර්ධනය වී ඇති නිසාවෙන් විශාල $CO_2$ ප්‍රමාණයක් දිනකට විමෝචනය වෙයි. මෙවැනි තත්වයක් මත වායුගෝලීය උණුසුම වැඩි වීම, කාලගුණික වෙනස්කම් ඇතිවීම පාරිසරික සමතුලිතය බිඳවැටීම, ජනතාව ස්වසන ආබාධ හා අනතුරුවලට ලක්වීම සිදුවේ. මෝටර් කාරයකින් ගමන් කළ හැකි මගීන් ප්‍රමාණය මෙන් 10 ගුණයක් මගීන් ප්‍රමාණයක් පොදු බස් රථ මගින් ප්‍රවාහනය කළ හැකි සේම මෝටර් කාරයකින් ගමන් කළ හැකි මගීන් ප්‍රමාණය මෙන් 100 ගුණයකට අධික මගීන් ප්‍රමාණයක්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
pavithra.hdm@gmail.com

[2] ශාස්ත්‍රවේදී(විශේෂ) සමාජසංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
wickramasinghe.mahesha@yahoo.com

[3] ශාස්ත්‍රවේදී(විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
harshanidasanayake1991@gmail.com

[4] ශාස්ත්‍රවේදී(විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
gdinusha.perera@gmail.com

දුම්රිය මඟින් ප්‍රවාහනය කළ හැකිය. එම නිසා පෞද්ගලික ප්‍රවාහන සේවා මඟින් හැකි පමණ ඉවත්වී පොදු ප්‍රවාහන සේවා සඳහා යොමු වීම ඉහත සඳහන් ගැටලු වළක්වා ගැනීමට හේතු වන බැව් අධ්‍යයනය මඟින් තහවුරු විය. එසේම පොදු ප්‍රවාහන සේවා සඳහා රජය මඟින් දියුණු හා ප්‍රමාණවත් ක්‍රමවේදයන් මෙන්ම මොනො රේල් වැනි කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රම ද මහාමාර්ග ද දියුණු කිරීමෙන් පාරිසරික, සාමාජයීය, ආර්ථික සුබසිද්ධිය වර්ධනය කළ හැකි වනු ඇත.

**මූඛ්‍ය පද** : *වායු දූෂණය, විමෝචනය, ප්‍රවාහනය ක්‍රම*

# ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි කාර්මික, කෘෂිකාර්මික හා සේවා යන අංශයන්හි දායකත්වයේ උපනතිය.

ආර්.එම්.ජී.ජී. රාජපක්ෂ[1]

**සංක්ෂේපය**

ආර්ථික වර්ධනය මනින ප්‍රධානම සාධකය දළ දේශීය නිෂ්පාදිතය යි. දළ දේශීය නිෂ්පාදිතය තීරණය වන සාධක ලෙස කාර්මික අංශය, කෘෂිකාර්මික අංශය හා සේවා අංශය දැක්විය හැකිය. ක්‍රි. පූ. 6වන ශතවර්ෂයේ ආර්යයන් මෙරටට පැමිණීමේ සිට බ්‍රිතාන්‍යයන් ආක්‍රමණය කරන තුරු යැපුම් කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආර්ථික රටාවක් පැවතුණ අතර බ්‍රිතාන්‍ය ආක්‍රමණත් සමග වැවිලි වගාව මුල් කරගත් ආර්ථික රටාවක් ඇති විය. මෙම වකවානුවේදී මෙන්ම 1948 දී නිදහස ලැබීමේ සිට 1950 ගණන් අවසානයේ ආවෘත ආර්ථිකයක් ආරම්භ වීම දක්වා කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයට විශාලම දායකත්වයක් ලැබුනේ කෘෂිකාර්මික අංශයෙනි. නමුත් 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ඇතිවීමත් සමඟම මෙම තත්වය වෙනස් විය. එනම් දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය තරමක් අඩු වී කාර්මික හා සේවා අංශයේ දායකත්වය වැඩි විය. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි කාර්මික, කෘෂිකාර්මික හා සේවා යන අංශ ත්‍රිත්වයෙහි ක්‍රියාකාරීත්වය කෙසේද? යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය 1977 සිට 2013 දක්වා කාලය තුළ මහබැංකු වාර්තා මඟින් ලබා ගත් ද්විතියික දත්ත මත පදනම් වේ. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි කාර්මික අංශය, කෘෂිකාර්මික අංශය හා සේවා අංශයන්ගේ දායකත්වය සරල ප්‍රතිපායන ආකෘති ඇසුරෙන්ද, සේවා අංශය කෙරෙහි තොග හා සිල්ලර වෙළදාම් අංශය සහ ප්‍රවාහන හා සන්නිවේදන අංශයේ දායකත්වය සරළ ප්‍රතිපායන ආකෘති හා බහුගුණ ප්‍රතිපායන ආකෘති ඇසුරෙන්ද ආකෘතීන් හි සමස්ථ වෙසෙසියාව වෙසෙසියා පරීක්ෂා ඇසුරෙන්ද විශ්ලේෂණය කරන ලදී. නිදහසට පෙර යුගයේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තීරණය වන ප්‍රධාන සාධකය වූයේ කෘෂිකාර්මික අංශයයි. කාර්මීකරණ ප්‍රතිපත්තියත් සමඟම ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය අඩු වී කාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය වැඩි විය. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ දළ දෙශීය නිෂ්පාදිතයට වැඩිම දායකත්වයක් ලබා දෙන අංශය ලෙස සේවා අංශය කටයුතු කරයි. දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික, කෘෂිකාර්මික හා සේවා යන අංශ 1977 සිට 2013 දක්වා වසර 36ක කාලය තුළදී දැක්වූ දායකත්වය අධ්‍යයනය කරන විට පෙනී යන්නේ කෘෂිකාර්මික නිෂ්පාදනය එක්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
ganga01@stu.kln.ac.lk

බිලියනයකින් වැඩි වන විට දළ දේශීය නිෂ්පාදනය බිලියන 8.718ක් වැඩි වන බවයි. එමෙන්ම කාර්මික නිෂ්පාදනය එක් බිලියනයකින් වැඩි වන විට දළ දේශීය නිෂ්පාදනය බිලියන 3.201ක් වැඩි විය. තවද සේවා නිෂ්පාදනය එක් බිලියනයකින් වැඩි වන විට දළ දේශීය නිෂ්පාදනය බිලියන 1.731 වැඩි විය. ආකෘති ත්‍රිත්වයෙහිම අනුසීහුමද හොඳ යැයි කිව හැකිය. සේවා අංශය වර්ධනයෙහිලා විශාලම දායකත්වය සපයන්නේ තොග හා සිල්ලර වෙළඳාම් අංශයයි. දෙවනුවට ප්‍රවාහනය හා සන්නිවේදන අංශය දායකත්වය සපයයි. තොග හා සිල්ලර වෙළඳාම් නිෂ්පාදනය එක් බිලියනයකින් වැඩි වන විට සේවා අංශය 3.145 බිලියන වැඩි විය. ප්‍රවාහනය හා සන්නිවේදන නිෂ්පාදනය එක් බිලියනයකින් වැඩි වන විට සේවා අංශය 4.079 බිලියන වැඩි විය.

**මුඛ්‍ය පද** *: දළ දේශීය නිෂ්පාදිතය, කාර්මික අංශය, කෘෂිකාර්මික අංශය, සේවා අංශය*

# The Reasons of Students Choose Private Universities/Institutes than Government Universities in Sri Lanka

K.M.R.R. Muhandiramge[1] M.N. Jayawardhana[2]
K.P.K. Dulani[3] D.S. Kodithuwakku[4]
P.M.Kiriella[5]

## Abstract

The higher education opportunities have increased significantly over the past decade in Sri Lanka. Today's younger generation is keener to study and most of them enter for higher education. Among those most of them choose private institutes/universities than government universities. Therefore the objective of this study is to identify the reasons for choosing the private institutes /universities than government universities. The data was collected through an online questionnaire among younger generation in western province, Sri Lanka. A regression was used to analyze the data. According to the research results, the main reason is the high competition in Advanced Level Examination and most of the students unable to get enough marks for enter a government university. Government universities have limited resources and only those who get the highest marks able to attend them. Therefore most of the students have to go for private universities. Some students directly choose private universities/ institutes after their school because of they think government university degree takes more time to finish the degree than private university/institute degree. Nevertheless some of the responses' reply were the government universities do not have some courses, subjects and some appropriate facilities for some courses. The students who willing to migrate choose private universities/institutes as the most of the private universities/institutes are linked with internationally recognized universities

[1] B.A. (Special) Social Statistics, University of Kelaniya, rashiravihari@gmail.com
[2] B.A. (Special) Social Statistics, University of Kelaniya, kitmnj@gmail.com
[3] B.A. (Special) Social Statistics, University of Kelaniya, kinsi.gt@gmail.com
[4] B.A. (Special) Social Statistics, University of Kelaniya, dilukodi@gmail.com
[5] B.A. (Special) Economics, University of Jayewardenepura, prabashikiriella@yahoo.com

around the world and it will be an easy way to enter to those countries. Currently the amount of students' intake to the government universities has increased and most of the government universities included vocational training for the degree, then the students get theoretical and practical knowledge at the same time as a solution for this condition. Moreover new courses and new subjects have introduced to the government universities. Although the government university degree has improved still the huge amount of students go for private universities, because of the international recognition and the high standard of vocational training they offer. Moreover the private university degree is highly standardized to the requirements of the work force and they have a broad link among the private sector in whole world.

**Key Words :** *Government Universities, Private universities/Institutes, Degree*

# විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ කුටුම්භ ආදායම සහ අධ්‍යාපන වියදම අතර සම්බන්ධතාව

කේ.සී.එල්. ප්‍රනාන්දු[1] එම්.එස්. අබේසිංහ[2]
හිමංගා රණසිලිගේ[3] කුෂානි මදුෂානි[4]
ලක්මාලි චතුරිකා[5]

**සංක්ෂේපය**

විවිධ වූ සංස්කෘතීන් සමාජ මට්ටම් සේම වෙනස් වන මාසික ආදායම උපයන කටුම්භයන් නියෝජනය කරන විද්‍යාර්ථීන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරනු ලබයි. එබැවින් සාමාන්‍ය ජන සමාජයෙන් බැහැරව විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ කුටුම්භයන් ලබන මාසික ආදායමත් අධ්‍යාපනය සඳහා කරනු ලබන වියදමත් අතර පවතින සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම කාලෝචිත වේ. මෙම අධ්‍යයනයේදී විද්‍යාර්ථීන්ගේ කුටුම්භයන්ගේ ආදායමෙන් අධ්‍යාපනය සඳහා වැය කරනු ලබන මුදල් ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් විමර්ශනය කිරීම අරමුණු කරගනු ලබයි. මෙහිදී සරල සසම්භාවි ක්‍රමයට අනුව නියැදිය තෝරාගත් අතර දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදී. සමීක්ෂණයෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා වගු ප්‍රස්තාර සටහන්, විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම, සරල ප්‍රතිපායන හා බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රම යොදාගන්නා ලදි. සමීක්ෂණයට අනුව සරල ප්‍රතිපායන ආකෘතියෙහි සමස්ත වෙසෙසියා මට්ටම 0.170 වේ. එහි නිර්ණන සංගුණකය 0.106 වේ. බහුගුණ ප්‍රතිපායනයට අනුව ආකෘතියෙහි සමස්ත වෙසෙසියා අගය 0.0215 ක් හා නිර්ණන සංගුණකය 0.1778 ක් වේ. විශ්වවිද්‍යාලවල විද්‍යාර්ථීන්ගේ මුළු මාසික වියදමත් අධ්‍යාපන වියදමත් අතර සහසම්බන්ධතා අගය 0.32 ක් වේ. මේ අනුව කුටුම්භ ආදායමත් අධ්‍යාපන වියදම් වෙනුවෙන් වැය කරන මුදල් ප්‍රමාණයත් අතර සබඳතාව දුර්වල මට්ටමක පවතින බව නිගමනය කළ හැකිය .

**මුඛ්‍ය පද :** *අධ්‍යාපන වියදම, ආදායම, බහුගුණ ප්‍රතිපායනය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය,chathurangilakshikashane@gmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, senali.abeysinghe@yahoo.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, himangaranasilige@yahoo.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, kushani.madushani92@gmail.com
[5] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, akmalicha91@gmail.com

# යුද්ධය අවසන් වීමට පෙර හා අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා

එච්.ඩී.පී. මධුෂානි[1] ඩබ්.වී.පී.එම් නයෝමි[2]
ඩී.එම්.එච්. දසනායක[3] එල්.ජී.ඩී පෙරේරා[4]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ඉතා ඈත අතීතයකට හිමිකම් කියන හා දිනෙන් දින වර්ධනය වෙමින් ඉදිරියට පැමිණෙන කර්මාන්තයකි. මෙම සංචාරක ව්‍යාපාරයෙන් අප රටට ගලා ආ විදේශ විනිමය ප්‍රමාණය අතිමහත්ය. නමුත් 1983 ආරම්භ වූ සිවිල් යුද්ධය හේතුවෙන් සංචාරක කර්මාන්තයේ වර්ධනය යම්කිසි කඩා වැටීමකට ලක්විය. එය රටේ ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කරන ලදී. නමුත් 2009 වර්ෂයේදී යුද්ධය අවසන් වීමෙන් පසු නව දිශාවකට, නව ප්‍රවණතා වලට යොමු වී ඇතිද යන්න ගැටලු සහිතය. ඒ අනුව සිවිල් යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නව ප්‍රවනතා පිළිබඳව හැදෑරීමක් කිරීම හා එමගින් අත්පත් කරගත හැකි වාසිදායක තත්වයන් මොනවාද යන්න සොයාබැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත භාවිතා කරන ලද අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික සංඛ්‍යාන වාර්තා මගින් දත්ත ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නව ප්‍රවනතා හා ඉන් ලබාගත හැකි වාසිදායක තත්වයන් පිළිබඳව විශ්ලේෂණය සඳහා පරාමිතික හා අපරාමිතික පරීක්ෂාවන් භාවිත කර ඇත. මෙම අධ්‍යයනය තුලින් යුද්ධය අවසන් වීමට පෙර සහ යුද්ධය අවසන් වීමෙන් පසු දකුණු ආසියානු හා බටහිර යුරෝපානු මහද්වීප දෙකින් පැමිණි සංචාරකයින්ගේ වැඩි වීමක් සිදු වී ඇති බවත් ඒ ඒ මාස අනුව සංචාරකයින් මෙරටට පැමිණීමට ඇති කැමැත්තෙහි වර්ධනයක් පවතින බවත් අනාවරණය විය අනුව යුද්ධයට පෙර විවිධ වයස් කාණ්ඩවලින් මෙරටට පැමිණි සංචාරකයින්ගේ කැමැත්තෙහි වෙනසක් ඇති බවත් යුද්ධමය තත්වය මත සංචාරකයන්ගේ පැමිණීම විචලනය වී ඇති බවත් අනාවරණය විය. මීට අමතරව යුද්ධයට පෙර හා පසු වර්ෂවලදී සංචාකයන්ගේ පැමිණීමේ අරමුණු වෙනස් වී ඇති බවත් දත්ත විශ්ලේෂණය මගින් තහවුරු විය. සංචාරක කර්මාන්තයේ මෙම ප්‍රවනතා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට මෙන්ම ආර්ථික, සමාජීය හා සංස්කෘතික තත්වයන්ට බලපෑම්

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
pavithrahdm@gmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
wickramasinghe.mahesha@yahoo.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
harshanidasanayake1991@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
gdinusha.perera@gmail.com

ඇති කරලීමට සමත් වී තිබේ. එබැවින් රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධව කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙ නව ප්‍රවනතා ආර්ථික සංවර්ධනයට දායක කර ගත හැකිය.

**මුඛ්‍ය පද :** *සිවිල් යුද්ධය, සංචාරක ව්‍යාපාරය, නව ප්‍රවනතා , සිවිල් යුද්ධය*

# කාන්තා පරිගණක අධ්‍යාපනය සහ භාවිතය

එච්. ඩී. පී. මධුෂානි[1] ඩබ්. වී. පී. එම්. නයෝමි[2]
ඩී. එම්. එච්. දසනායක[3] එල්. පී. ඩී. පෙරේරා[4]

## සංක්ෂේපය

පරිගණක තාක්ෂණය සැමදා විවිධ අංශයන්ගෙන් ලෝකයේ ජීවන රටාව වැඩි දියුණු කිරීමෙහිලා පිටුවහලක් වේ. කුඩා දරුවාගේ පටන් ජංගම දුරකථනයකින් හෝ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ එකිනෙකා හමුවන මෙම යුගයේ කාන්තාවන් කෙතරම් දුරට පරිගණක හා තොරතුරු තාක්ෂණය සමඟ සබැඳි විය යුතු ද යන්න විමසිය යුත්තකි. කාන්තාවන් පරිගණක අධ්‍යාපනයෙහි නියුතු ප්‍රවණතාවය අඩු වීමට හේතුව කුමක්ද යන්න මෙහි අධ්‍යයන ගැටළුව වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ කාන්තාවන් පරිගණක අධ්‍යාපනයෙහි නියුතු ප්‍රවණතාවය වැඩි කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීමයි. අධ්‍යයනය සදහා ද්විතියික දත්ත භාවිතා කළ අතර ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් දත්ත ලබාගන්නා ලදි. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රතිශතක අගයන් භාවිත කළ අතර එහිදී අනාවරණය වු කරුණු අතර අධ්‍යාපනය, කාන්තා සහ පුරුෂ ඉදිරි දර්ශනය පිළිබද විෂමතාව, පරිගණක ක්ෂේත්‍රය තුළින් කාන්තාවකගේ වෘත්තිය ඉදිරි ගමනට, දියුණුවට ඇති බාධක සහ පවුල් පසුබිම වැනි කරුණු පරිගණක සාක්ෂරතාව අඩු වීමට හේතු වී තිබේ. රටක ආර්ථිකය පිළිබදව සැලකීමේදි තොරතුරු තාක්ෂණය සඳහා, ස්ත්‍රීන්ටද වැදගත් භූමිකාවක් ඉටු කළ හැකිය. පරිගණක තාක්ෂණය පිරිපුන් කාන්තා සංකලනයක් සහිත ශ්‍රමික පිරිසක් යෙදවීම මිනිස් ආර්ථික කාර්යක්ෂමතාවය ඉහල දැමිය හැකි වේ. කාන්තාවන් පරිගණක හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරියට ගෙන ඒමට කටයුතු කළහැකි නම්, කාන්තා ශ්‍රම බලකාය දේශීය ආර්ථිකයට මහඟු අත්වැලක් වන බවත් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ද එය මනා පිටිවහලක් වන බවත් අධ්‍යයනය මඟින් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** *පරිගණක සාක්ෂරතාව, ආර්ථික කාර්යක්ෂමතාවය, කාන්තා භූමිකාව*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
pavithrahdm@gmail.com
[2]ශාස්ත්‍රවේදී(විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය,
wickramasinghe.mahesha@yahoo.com
[3]ශාස්ත්‍රවේදී(විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
harshanidasanayake1991@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
gdinusha.perera@gmail.com

# ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ ව්‍යාප්තිය සමඟින් කාන්තාවට සිදුවන බලපෑම

ඒ.ඒ.එම්.කේ අමරසිංහ[1]

**සංක්ෂේපය**

ඕනෑම රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේ දී විවිධාකාර වූ ප්‍රවේශයන් හඳුනාගනී. ඒ අතරින් රටක ආදායමේ වර්ධනයට වැදගත් ක්ෂේත්‍රයක් ලෙස කර්මාන්ත ක්ෂේත්‍රය හඳුන්වා දිය හැක. 1948 න් පසු අරඹන ශ්‍රී ලංකා ඉතිහාසයේ නව ගමන් මගේ සංවර්ධනය උදෙසා ගත් පියවරක් ලෙස ආනයන ආදේශන ප්‍රතිපත්තිය හරහා දියුණු වූ කර්මාන්ත අතර ඇඟලුම් කර්මාන්තයට හිමි වී ඇත්තේ තුන්වන ස්ථානයයි. ඒ තුළින් ලබාගත හැකි වැදගත් ආර්ථික වටිනාකම් බොහෝ ය. විවෘත ආර්ථිකය තුළ මුදල් යනු අත්‍යාවශ්‍ය සාධකයකි. එහිදී ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව සියලු දෙනාටම තම අඟහිඟකම් මඟ හරවාලනු උදෙසා රැකියාවක නිරත වීමට සිදු වේ. බොහෝ විට නිවසක පුරුෂයා අනිවාර්යයෙන් කුමන හෝ රැකියාවක නිරත වෙයි. එහෙත් 21 වන සියවසේ තරඟකාරීත්වය තුළ එය වෙනස් වී ඇත. වර්තමානයේ රැකියාවල නිරත වන කාන්තාවන් පිරිස වර්ධනය වන අතර එමඟින් ඇතිවන ගැටලුද වර්ධනය වේ. ඒ අතර ඇඟලුම් ක්ෂේත්‍රයේ නියැලෙන කාන්තාවන් විශාල ප්‍රමාණයකි. මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ ව්‍යාප්තියත් සමඟ කාන්තාවට සිදුවන බලපෑම පිළිබඳ විමර්ශනය කර ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කරන කාන්තාවන් 50ක නියැදියක් පහසු නියැදීම් ක්‍රමය යටතේ තෝරාගෙන ඇත. දත්ත ලබා ගැනීම සිදු කරනු ලැබුවේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙනි. අධ්‍යයනය මඟින් අනාවරණය වූයේ එම ප්‍රදේශය තුළ ඇඟලුම් කර්මාන්තය ආරම්භ විමත් සමඟ කාන්තාවන් විශාල වශයෙන් වයස් භේදයකින් තොරව ඒ කරා ඇදී ඒමත් , ඒ තුළින් කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය කිසියම් දුරකට ශක්තිමත් වී ඇති බවයි. රැකියාව සමඟ මව්වරුන්ගේ කාර්ය බහුලත්වය නිසා පුරුෂයා විසින් කාන්තාව තාඩන පීඩන වලට ද ලක් කර ඇති අතර දරුවන් ද මෙම ගැටලු නිසා පීඩාවට පත්ව ඇත. කෙසේ වුවද මෙම ප්‍රදේශය තුළ ඇඟලුම් කර්මාන්තය ආරම්භ වීම හේතුවෙන් එය අවට ජීවත් වන ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ ගොස් ඇති අතර ඔවුන්ගේ ආදායමේ ද වර්ධනයක් සිදු වී ඇති බව හෙළිවිය. මේ අනුව ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ ව්‍යාප්තිය සමඟින් කාන්තාවගේ පවුල් පසුබිමට බලපෑම් ඇති වී ඇති බැව් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *ඇඟලුම් කර්මාන්තය, කාන්තාව, ආර්ථික ප්‍රතිලාභ*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
k.amarasinghe92@gmail.com

# Socio-economic Impact of Women Migration in Sri Lanka

E.K Madanayake[1] B.P.G.S. Priyadarshani Chandrasiri[2]

**Abstract**

People found new ways of earning money rather than traditional ways. As a result of that migration of people for foreign employment has been started. Migration occurs for various reasons such as education, businesses, trainings and employment. Women's role of migration started in early 90's and the migration of Sri Lankan women's is mostly due to poverty, low economic status in Sri Lanka. This study examines the women migration and impacts on society and the economy. This study is entirely based on secondary data and Sri Lankan Bureau of Foreign Employment (SLBFE) data from 1989/2014 is analyzed using SPSS (Statistical Package for Social Science).The results of the analysis indicate that, the poor women in rural areas and choose migration for their economic problems. More than 20% of these migrant women work abroad in as labourers and more than 30% of them work as housemaids. According to the SLBFE records, most of these migrant women are in a very low educational level. On the other hand some Sri Lankan women migrated because of unemployment. Poor women in urban areas also prefer to migrate for foreign employment as a way of income. In economic perspective, it affects directly to increase the level of foreign exchange. The negative effects of the women migration to the society is that children can fall into ungracious or unlawful behaviors without mother's guidance and the family can be broken without the main guidance.

**Key words:** Women Migration, Society, Economy, Sri Lanka.

[1] B.A. (Special) Economics, University of Kelaniya, erangakaushalya@gmail.com
[2] B.A. (Special) Economics, University of Kelaniya, Priyadarshani.0089@gmail.com